# තෙරුවන් සරණ යෑම

සම්පාදක :-
පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි.
නා උයන ආරණ්‍ය සේනාසනය
පන්සියගම, මැල්සිරිපුර.

(ධර්මදානය පිණිසයි)

ශ්‍රී බුː වː 2601 වූ බක් මස පුර සැටවක නම් තිථිය ලත් ගුරු ද | ව්‍යාː වː 2018-03-22

# පටුන


1. චුන්දී සූත්‍රය ............................................................ 5
2. රත්නත්‍රය සරණ යෑම ................................................ 7
   - ❄ ලෝකෝත්තර සරණගමනය ........................................ 9
   - ❄ ලෞකික සරණගමනය ............................................. 10
     - ☸ අත්තසන්නීයාතන සරණාගමනය ............................ 10
     - ☸ තත්පරායන සරණාගමනය ..................................... 10
     - ☸ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය .......................... 11
     - ☸ පණිපාත සරණාගමනය ........................................ 11
3. සීලය ............................................................................ 12
   - ❄ චේතනා සීලය ........................................................ 13
   - ❄ චෛතසික සීලය ...................................................... 13
   - ❄ සංවර සීලය .......................................................... 13
   - ❄ අවීතික්‍රම සීලය .................................................... 14
4. කවර අර්ථයකින් සීලය යැයි කියනු ලැබේ ද? ..................... 14
5. සීලයෙහි ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන කවරහු ද? ............. 14
6. සීලයක් අවශ්‍ය වන්නේ කුමකට ද? ........................................ 15
7. පඤ්ච සීලය ................................................................. 18
   - ❄ ප්‍රාණඝාතය .......................................................... 19
     - ☸ ප්‍රාණඝාත අකුශලය කෙසේ සිදු වේද? ......................... 21
     - ☸ ප්‍රාණඝාත කර්මය පිළිබඳව දත යුතු වෙනත් කරුණු ............... 24
     - ☸ ප්‍රාණඝාත කර්මයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය .......... 25
     - ☸ ප්‍රාණඝාත කර්මයෙහි විපාක ........................................ 25
     - ☸ ප්‍රාණඝාතයෙන් වැළකීමේ ආනිශංස .............................. 26
   - ❄ අදත්තාදානය .......................................................... 27
     - ☸ අදත්තාදානයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය ............... 33
     - ☸ අදත්තාදාන කර්මයෙහි විපාක ...................................... 34
   - ❄ කාමමිථ්‍යාචාරය ...................................................... 35
     - ☸ දස ස්ත්‍රීන් .................................................... 36
     - ☸ දස භාර්යාවන් ................................................ 37
     - ☸ කාමමිථ්‍යාචාරයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය .......... 38
     - ☸ කාමමිථ්‍යාචාරයෙහි විපාක ........................................ 38
   - ❄ මුසාවාදය ............................................................. 40
     - ☸ මුසාවාදයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය .................. 41

☸ මුසාවාදයෙහි විපාක ........ 42
❈ සුරාපානය ........ 44
☸ සුරාපානයෙහි ආදීනව ........ 45
8. පන්සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ........ 47
❈ සත්ව ඝාතනයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ........ 47
❈ සොරකමෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ........ 49
❈ කාමමිථ්‍යාචාරයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ........ 49
❈ මුසාවාදයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ........ 51
❈ සුරාපානයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ........ 51
9. උපාසකත්වය ........ 55
❈ තමාගේ හා අන්‍යයන්ගේ යහපත පිණිස පවතින උපාසක තුමා ........ 57
10. බ්‍රහ්මචරියක පඤ්ච සීලය ........ 58
11. ආජීව අෂ්ටමක සීලය ........ 60
❈ පිසුනාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........ 61
❈ ඵරුසාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........ 64
☸ ඵරුසාවාචාවෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය ........ 66
❈ සම්ඵප්පලාපා වෙරමණී සික්ඛාපදං සමාදියාමි. ........ 67
❈ මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං සමාදියාමි. ........ 69
☸ මිථ්‍යාජීවයෙහි ආදීනව ........ 70
12. උපෝසථ අෂ්ටාංග සීලය ........ 71
❈ අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි. ........ 74
❈ විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........ 76
❈ නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි. ........ 78
❈ උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........ 80
13. නවාංග උපෝසථ සීලය ........ 82
14. ගහට්ඨ දස සීලය ........ 83
15. උපෝසථ සීලයෙහි පිහිටිය යුතු ආකාරය ........ 84
16. සීලයට හානිකර වූ අන්තරායක ධර්ම සිවුතිස ........ 86

# 1. චුන්දී සූත්‍රය

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි චුන්දී නම් රාජ කුමාරිකාව පන්සියයක් රථ වලින් පන්සියයක් රජ කුමරියන් විසින් පිරිවරන ලද්දී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද, එතැනට පැමිණියා ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට සකස් කොට වැඳ එකත්පස්ව හුන්නා ය.

එකත්පස්ව හුන්නා වූ චුන්දී නම් රාජ කුමාරිකාව භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළා ය. ස්වාමීනි, අපගේ චුන්ද නම් රාජ කුමාරයෙක් වේ. හෙතෙම මෙසේ කීයේ ය. යම් මේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ බුදුන් සරණ කොට ගියේ වේ ද, දහම් සරණ කොට ගියේ වේ ද, සංඝයා සරණ කොට ගියේ වේ ද, ප්‍රාණඝාතයෙන් වැළකුණේ වේ ද, අදත්තාදනයෙන් වැළකුණේ වේ ද, කාම මිත්‍යාචාරයෙන් වැළකුණේ වේ ද, මුසාවාදයෙන් වැළකුණේ වේ ද, මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැළකුණේ වේ ද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහි ම උපදියි. දුර්ගතියෙහි නූපදියි යනුයි.

ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ විචාරමි.

ස්වාමීනි, කෙබඳු වූ ශාස්තෘවරයෙකු කෙරෙහි ප්‍රසන්න වූයේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහි ම උපදී ද?, දුර්ගතියෙහි නූපදී ද?

ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ විචාරමි. ස්වාමීනි, කෙබඳු වූ ධර්මයක වනාහි ප්‍රසන්න වූයේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහි ම උපදී ද? දුර්ගතියෙහි නූපදී ද? කෙබඳු සංඝයා කෙරෙහි වනාහි ප්‍රසන්න වූයේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහි ම උපදී ද? දුර්ගතියෙහි නූපදී ද? කෙබඳු කුසල ධර්මයන්හි

සම්පූර්ණ කිරීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහි ම උපදී ද? දුර්ගතියෙහි නූපදී ද?

චුන්දී රාජ කුමාරිකාව මෙසේ ඇසූ විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

එම්බා චුන්දිය පා නැත්තා වූ හෝ දෙපා ඇත්තා වූ හෝ සිව්පා ඇත්තා වූ හෝ බොහෝ පාද ඇත්තා වූ හෝ රූපය ඇත්තා වූ හෝ රූපය නැත්තා වූ හෝ සංඥාව ඇත්තා වූ හෝ සංඥාව නැත්තා වූ හෝ නෙවසඤ්ඤීනාසඤ්ඤී වූ හෝ යම්තාක් සත්ත්වයෝ වෙත් ද, ඔවුන් අතුරෙන් අර්හත් වූ සම්‍යක් සම්බුධ වූ තථාගතයන් වහන්සේ උතුම් යැයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි බුදුන් කෙරෙහි ප්‍රසන්න වූවාහු ද, ඔවුහු අග්‍ර වූවහු කෙරෙහි ප්‍රසන්න වූවාහු ය. අග්‍ර වූවහු කෙරෙහි වනාහි ප්‍රසන්න වූවන්ට අග්‍ර වූ විපාකය වේ.

චුන්දිය, සංස්කරණය කරණ ලද්ද වූ හෝ සංස්කරණය නො කරණ ලද්ද වූ හෝ යම්තාක් ධර්මයෝ වෙද් ද, ඒ ධර්මයන් අතුරෙන් යම් සේ රාගාදී මදයන්ගේ දුරු කිරීම ඇත්තා වූ, සියලු කෙලෙස් පිපාසා දුරු කිරීම ඇත්තා වූ, සියලු ආලයන්ගේ නැසීම ඇත්තා වූ, කෙලෙස් වෘත්තයන්ගේ සිඳීම් ඇත්තා වූ, තෘෂ්ණාවන්ගේ ක්‍ෂය කිරීම් ඇත්තා වූ, නො ඇල්ම ඇත්තා වූ, නිරුද්ධ වීම ඇත්තා වූ නිවනක් වේ ද, විරාග නම් වූ ඒ නිවන අග්‍ර යැයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි විරාග ධර්මයෙහි පැහැදුණාහු ද, ඔවුහු අග්‍ර වූ ධර්මයෙහි පැහැදුණාහු ය. අග්‍ර වූ ධර්මයෙහි වනාහි පැහැදුනවුන්ට අග්‍ර වූ විපාකය වේ.

එම්බා චුන්දිය, යම් තාක් සඞ්ඝ වූවාහු හෝ ගණ වූවාහු හෝ වෙත් ද, ඔවුන්ගෙන් යම් මේ පුරුෂ යුග්ම සතරක් වෙත් ද, පුරුෂ පුද්ගලයන් අට දෙනෙක් වෙත් ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝ තෙම පූජාවට සුදුසු වේ. දුර සිට ගෙනෙන ලද පූජාවට සුදුසු වේ. දක්ෂිණාව පිළිගැනීමට සුදුසු වේ. ඇඳිලි කිරීමට සුදුසු වේ. ලෝකයාට උතුම් වූ පින් කෙත වේ ද, මේ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම අග්‍ර යැයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි සඞ්ඝයා කෙරෙහි ප්‍රසන්න වූවාහු ද, ඔවුහු අග්‍ර තැන්හි

ප්‍රසන්න වූවාහු වෙති. අග්‍ර වූ සංඝයා කෙරෙහි ප්‍රසන්න වූවන්ට වනාහි අග්‍ර වූ විපාකය වේ.

එම්බා චුන්දිය, ආර්‍යයන් කැමති වූ යම්තාක් සීලයෝ වෙත් ද, ඔවුන්ගෙන් කඩ නො වූ, සිදුරු නො වූ, කැළල් නො වූ, තිත් නැත්තා වූ, දස කමින් මිදුණා වූ, නුවණැත්තන් විසින් පසස්නා ලද්ද වූ, තෘෂ්ණා දෘෂ්ටියට හසු නොවුණා වූ, සමාධිය පිණිස පවත්නා වූ යම් මේ සීලයෝ වෙත් ද, මෙය අග්‍ර යැයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි ආර්‍යයන් කැමති වූ සීලයන් සම්පූර්ණ කිරීම ඇත්තාහු වෙත් ද, ඔවුහු අග්‍ර වූ ශීලයෙහි සම්පූර්ණ කිරීම ඇත්තාහු වෙත්. අග්‍ර වූ ශීලයෙහි වනාහි සම්පූර්ණ කිරීම ඇත්තවුන්ට අග්‍ර වූ විපාකය වේ.

ඒකාන්තයෙන් අග්‍ර වශයෙන් පැහැදුණා වූ, අග්‍ර වූ ධර්මය දන්නා වූ, නිරුත්තර දක්ෂිණාර්හ වූ, අග්‍ර වූ බුදුන් කෙරෙහි පැහැදුනවුන්ට ද, විරාගයෙන් හා උපසමයෙන් යුත් සැපය ඇත්තා වූ, අග්‍ර වූ ධර්මයෙහි පැහැදුනවුන්ට ද, උතුම් පින් කෙතක් වූ අග්‍ර වූ සංඝයා කෙරෙහි පැහැදුනවුන්ට ද, අග්‍ර වූවහු කෙරෙහි දනය දෙන්නවුන්ට ද අග්‍ර වූ පින වැඩේ. අග්‍ර වූ ආයුෂය ද, අග්‍ර වූ ශරීර වර්ණයද, යශස හා කිර්තිය ද, සැපය ද, බලය ද ලැබේ.

අග්‍රවූවහුට දෙන්නා වූ, නුවණැත්තා වූ, අග්‍ර ධර්මයෙන් යුක්ත වූ පුද්ගල තෙමේ, දෙව් වූයේ හෝ මිනිස් වූයේ හෝ අග්‍ර බවට පැමිණියේ අතිශයින් සතුටු වේ යැයි වදළ සේක.

(අං: නි: පඤ්චක නිපාත චුන්දී සූත්‍රය)

## 2. රත්නත්‍රය සරණ යෑම

**"හිංසතීති සරණං"** පීඩා කරණ අර්ථයෙන් සරණ නම් වේ. එනම් සරණ ගියවුන්ගේ ඒ සරණ යාමෙන් ම බිය, තැති ගැනීම, දුක, දුගතිගාමී බව යන මේ අනර්ථයන් නසයි විනාශ කරයි යනාර්ථයෙන් සරණ නම් වේ. මෙය වනාහි රත්නත්‍රයට නමකි.

**"අථ වා හිතෙ පවත්තනෙන අහිතා ච නිවත්තනෙන සත්තානං භයං හිංසතීති බුද්ධො"** නැතහොත් හිත පැවැත්මෙන් ද, අහිත වැලැක්මෙන් ද සත්වයන් ගේ බිය සන්ත්‍රාසයන් වැළැක්වීම් අර්ථයෙන් "බුද්ධ" නම් වේ. මෙලෙස බුදුරජාණන් වහන්සේ සත්වයන්ට පිහිට වේ.

**"භවකන්තාරා උත්තරණෙන ලොකස්ස අස්සාසදානෙන ච ධම්මො"** සසර කතරින් එතර කරවීමෙන් ද, සැනසිල්ල උදා කර දීම් අර්ථයෙන් "ධර්ම" නම් වේ. මෙලෙස ධර්මය සත්වයන්ට පිහිට වේ.

**"අධිගතමග්ගෙ සච්ඡිකතනිරොධෙ යථානුසිට්ඨං පටිපජ්ජමානෙ චතූසු අපායෙසු ච වට්ට දුක්ඛෙසු ච අපතමානෙ කත්වා ධාරෙතීති ධම්මො"** තව ද, සතර මග නුවණින් නිවන අවබෝධ කළ ආර්‍ය්‍ය උතුමන් ද, තෙරුවන් සරණ ගොස් සීල සමාධි ප්‍රඥා ගුණ වඩන කල්‍යාණ පෘථග්ජනයින් ද අපා දුකට සංසාර දුකට නො වැටෙන ලෙස ආරක්‍ෂා කොට නිවනට පමුණුවන අර්ථයෙන් "ධර්ම" නම් වේ. මෙලෙස ධර්මය සත්වයන්ට පිහිට වේ.

**"අප්පකානම්පි කාරානං විපුලඵලපටිලාභකරණෙන සඞ්ඝො"** ස්වල්ප වශයෙන් කළ උපකාරය පවා මහත් ඵල කර දෙමින් මෙලොවත් පරලොවත් නිවන දක්වා ම සැපයට පමුණුවන අර්ථයෙන් "**සඞ්ඝ**" නම් වේ. මෙලෙස මහා සංඝ රත්නය සත්වයන්ට පිහිට වේ.

අතීත සංසාරයෙහි දී කිසි කලෙකවත් බුදු සසුනක් ඇසුරු නොකළ කෙනෙකු ප්‍රථමයෙන් බෞද්ධයෙකු වන්නේ ධර්ම ශ්‍රවණය කිරීමෙනි. ඉන් පසු තෙරුවන් සරණ පිහිටා පඤ්ච සීලය සමාදන් වෙයි. මෙසේ තෙරුවන් සරණ පිහිටා පඤ්ච සීලය සමාදන් වූ තැන් පටන් ඔහු බෞද්ධයෙකු වෙයි.

**"බුද්ධ ධම්ම සංඝ යන ශ්‍රේෂ්ඨ රත්නත්‍රය තමාට ඇති එකම පිහිටය යැයි අදහා ගත්තවුන් පිළිබඳව මෙලොව පරලොව දෙකෙහි වන්නා වූ බිය, තැති ගැනීම, අවැඩ, රෝග භය, අපා භය, වධ, බන්ධන නසාලන්නේ ය"** යනාර්ථයෙන් "**සරණ**" නම් වේ. බුද්ධාදී රත්නත්‍රයම සත්වයන් හිත වැඩෙහි යොදන්නේ ය. අහිතයෙන් ගලවා

ගන්නේ ය. සියලු බිය නසන්නේ ය. සසර දුකින් මුදලන්නේ ය. රැකවරණය දෙන්නේ ය. ස්වල්ප වූ ද සත්කාරය මහත් ඵල කරන්නේ ය.

රත්නත්‍රය කෙරෙහි සිත පහදවාගෙන ගෞරව කොට පිළිගැනීමෙන් නැසූ කෙලෙස් ඇති පිරිසිදු සිතින් රත්නත්‍රය මට ඇති එකම පිහිටය යැයි ශ්‍රද්ධාව පෙරටු කොට ගත් කර්‍ම ඵල විශ්වාසය නම් වූ සම්‍යක් දෘෂ්ටිමය වූ චේතනාව "**සරණගමනය**" නම් වේ.

මේ කියන ලද ශ්‍රද්ධා මූලික සිතින් යුක්තව රත්නත්‍රය මට ඇති එකම පිහිටය යැයි අදහා ගෙන රත්නත්‍රය සේවනය කරන්නා, ඒ අනුව පිළිපදින්නා "**සරණගතයා**" නම් වේ. මේ සරණගතයාම "**උපාසකයා**" නමින්ද හඳුන්වනු ලැබේ. මෙම සරණගමනය "**ලෞකික, ලෝකෝත්තර**" වශයෙන් දෙ වැදෑරුම් වේ.

## ❄ ලෝකෝත්තර සරණගමනය

දක්නා ලද ආර්‍ය සත්‍යය ඇති ආර්‍ය පුද්ගලයන්ගේ සෝවාන් ආදී මාර්‍ග සිත් උපදිනවාත් සමගම සරණගමනය කෙලෙසන ධර්‍මයන් මුළුමනින් ම විනාශ කොට අරමුණු වශයෙන් නිවන අරමුණු කොට කෘත්‍යය වශයෙන් රත්නත්‍රය විෂය කොට සමෘද්ධියට පැමිණෙන්නේ ය. සියලු දුක්ඛයන්ගේ අවසානය මේ ලෝකෝත්තර සරණ ගැනීමෙහි ආනිශංසය වේ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන ආර්‍ය ඵලයෝ මෙහි විපාක ඵලයෝ ය. මේ ලෝකෝත්තර සරණගමනය කිසි ලෙසකින් කිලුටු නොවේ. මෙහි කිසි භේදයක් නැත. මරණයෙන් පසු හෝ අන්‍ය ශාස්තෘවරයෙකු නො අදහන්නේ ම ය. මේ ආර්‍ය සරණ ලැබූවකුගෙන් භවාන්තරයෙහි දී හෝ ප්‍රාණඝාතාදී කිසිඳු අකුසලයක් සිදු නොවේ. එසේම තම ජීවිත හානියක් නොකර ගනියි. හංසයෙකු ජලයෙන් කිරි වෙන් කොට පානය කරන්නා සේ මේ ආර්‍ය පුද්ගලයෙකුට නො දැන හෝ කිසි ලෙසකින් සුරාවක් නො පෙවෙත්ම ය. කිසි කලෙක දැන දැන කෙලෙස් සිතකින් සිකපද බිඳීමක් නැත්තේම ය. ධර්‍ම විනය නො දැනීමෙන් ප්‍රඥප්ති වද්‍ය සිකපද බිඳීම

විය හැකිය.

## ❄ ලෞකික සරණගමනය

තෙරුවන් ගුණ අරමුණු කොට ප්‍රඥවන්තයාගේ සිත ඒ ගුණ විශේෂයෙහි සැක නුපදවා කෙලෙස් කිලුටු අත්හරිමින් අර්ථ වශයෙන් බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණ ඇදහීම, පිළිගැනීම ලෞකික සරණාගමනයයි. ශ්‍රද්ධා මූලික සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටාගෙන දසවිධ පුණ්‍ය ක්‍රියා වස්තූන් ගෙන් "**දිට්ඨිජුකම්ම**" නමින් කියවෙන දෘෂ්ටිය ඍජු කර ගැනීම මේ ලෞකික සරණාගමනයයි. මෙය "**අත්තසන්නීයාතන, තත්පරායන, ශිෂ්‍යභාවෝපගමන, පණිපාත**" යනුවෙන් සතර වැදෑරුම් වේ.

## ☸ අත්තසන්නීයාතන සරණාගමනය

මාගේ ආත්මභාවය භාග්‍යවතුන් වහන්සේට පරිත්‍යාග කරමි. නව ලෝකෝත්තර ධර්මයට ද, අෂ්ටාර්‍ය පුද්ගල සංඝයාට ද මාගේ ආත්මභාවය පරිත්‍යාග කරමි. මාගේ ජීවිතය ද පරිත්‍යාග කරමි. රත්නත්‍රයට මාගේ ආත්මය ද, ජීවිතය ද පරිත්‍යාග කරන ලද්දේම ය. දිවි කෙළවර කොට ඇති උතුම් ම පිහිට, රැකවරණය රත්නත්‍රය යැයි ප්‍රතිඥ කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**අත්තසන්නීයාතන සරණාගමනය**" නම් වේ.

## ☸ තත්පරායන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රය පිහිට කොට ඇත්තෙම් වෙමි යැයි ප්‍රතිඥ කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**තත්පරායන සරණාගමනය**" නම් වේ.

## ☸ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයට ශිෂ්‍යයෙක් වෙමි. මෙසේ මම ශිෂ්‍යයෙකු කොට දරන සේක්වා යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය**" නම් වේ.

## ☸ පණිපාත සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයට ම වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නෙමි. මෙසේ මා දරා ගනු මැනව යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**පණිපාත සරණාගමනය**" නම් වේ.

මේ පණිපාත සරණාගමනය "**ඥාති - භය - ආචාර්‍ය්‍ය - දක්ෂිණාර්හ**" වශයෙන් සිවු වැදෑරුම් වන්නේ ය. එයින් බුදු රජාණන් වහන්සේ නෑයෙකි යැයි ඥාති කම සැලකීමෙන් ද, බුදු රජාණන් වහන්සේ රාජ පූජිතය, මහානුභාව ඇත්තේ ය. එබැවින් නො වඳින්නේ නම් අනර්ථයක් විය හැකිය යැයි බිය හේතුවෙන් ද, බුදුරජාණන් වහන්සේ මාගේ ආචාර්‍ය්‍යවරයා ය. එබැවින් නො වැඳ සිටීම නුසුදුසු ය යැයි ආචාර්‍ය්‍ය වශයෙන් සැලකීමෙන් ද සරණ නො පිහිටන්නේ ය.

යමෙක් "**මෙතෙමේ ම ලොව ආර්‍ය්‍ය භාවයට පැමිණියේ ය. ලොව සියලු සත්වයන්ට උතුම් ය. අග්‍ර දක්ෂිණාර්හය**" යැයි වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නේ ද හෙතෙමේටම "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීමෙන් සරණ පිහිටන්නේ ය. මෙසේ සරණ "**දක්ෂිණාර්හ**" භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් ම පිහිටන්නේ ය. **ඥාති - භය - ආචාර්‍ය්‍ය** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් ම බිඳෙන්නේ ය.

මෙසේ රත්නත්‍රය සරණ ගිය බුද්ධ ශ්‍රාවකයෙකු අන්‍ය තීර්ථකයන් වෙත පැවිදි වූ හෝ ගිහි වූ හෝ තම ඥාතියෙකු වෙත

ගොස් ඥාති කම සලකා වැඳීමෙන් ද, රජතෙමේ රටවැසියන් විසින් වඳිනු පුදනු ලබන්නේ ය. එබැවින් වැඳීම - පිදීම නොකළ හොත් නපුරක් කරන්නට බැරි නැතැයි බිය හේතුවෙන් වැඳීම - පිදීම කිරීමෙන් ද, ශිල්ප ශාස්ත්‍ර ඉගැන්නූ අන්‍ය තීර්ථකයකුට ගුරු ගෞරවයෙන් වැඳීම - පිදීමාදිය කරන්නාගේ ද සරණ නො බිඳෙන්නේ ය.

මේ **ලෞකික සරණගමනය** රත්නත්‍රය පිළිබඳ ගුණ නො දැනීමෙන් ද, ඒ මහත් වූ ගුණයන් පිළිබඳව උපදනා සැකයෙන් ද, රත්නත්‍රය පිළිබඳව වැරදි ආකාරයෙන් දැකීමෙන් ද කිලිටි වන්නේ ය.

තවද මේ ලෞකික සරණගමනය **සාවද්‍ය** - **අනවද්‍ය** වශයෙන් දෙ වැදෑරුම් වේ. එයින් "**සාවද්‍ය සරණගමනය**" අන්‍ය ශාස්තෘවරයෙකු අත්තසන්නීයාතන ආදි ලෙස සරණ ගැනීමෙන් බිඳෙන්නේ ය. මෙයින් අනිෂ්ට විපාක ලැබෙන්නේ ය. "**අනවද්‍ය සරණගමනය**" මරණයෙන් බිඳෙන්නේ ය. මෙයින් අන්‍ය ශාස්තෘවරයන් සරණ ගැනීමක් නොවන බැවින් "**අනවද්‍ය සරණාගමනය**" නම් වේ. මේ ලෞකික සරණාගමනය අත්තසන්නීයාතනාදී, සතරාකාරයෙන් ම හෝ එක් ආකාරයකින් හෝ සරණ ගැනීමෙන් පිහිටන්නේ ය.

## 3. සීලය

ප්‍රාණඝාතාදී අකුසල ක්‍රියාවලින් වැළකීම ද, තථාගතයන් වහන්සේ විසින් පනවා වදාළ සිකපද රැකීම ද, වත්පිළිවෙත් සපිරීම ද, දිවි පැවැත්ම පිරිසිදු කර ගැනීම ද "**සීලය**" නම් වේ. මෙම සීලය "**චේතනා සීලය, චෛතසික සීලය, සංවර සීලය, අවීතික්‍රම සීලය**" යැයි සතර වැදෑරුම් වේ. එහිː-

## ❄ චේතනා සීලය

**ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාච ඵරුසාවාච, සම්ඵප්පලාප** යන සප්ත කර්ම පථවලින් වැළකෙන්නහුගේ ද, ත්‍රිවිධ රත්නය විෂයෙහි ගෞරවයෙන් වත් පිළිවෙත් පුරන්නහුගේ ඒ මොහොතේ සිතෙහි පවතින චේතනාව "**චෙතනා සීලය**" නම් වේ.

## ❄ චෛතසික සීලය

දිවි පැවැත්ම උදෙසා **ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර** යන කායික අකුසල ක්‍රියාවලින් වැළකෙන්නහුගේ සිතෙහි යෙදෙන **සම්මා කම්මන්තය** ද, **මුසාවාද, පිසුනාවාච ඵරුසාවාච, සම්ඵප්‍රලාප** යන වාචසික අකුසල ක්‍රියාවලින් වැළකෙන්නහුගේ සිතෙහි යෙදෙන **සම්මා වාචාව** ද, **සත්ව වෙළඳම, වහල් වෙළඳම, වස විෂ වෙළඳම, මත් ද්‍රව්‍ය වෙළඳම, අවි - ආයුධ වෙළඳම** යන අධර්ම වෙළඳම්වලින් වැළකෙන්නහුගේ සිතෙහි යෙදෙන **සම්මා ආජීවය** ද යන විරති චෛතසික තුන "**චෛතසික සීලය**" නම් වේ.

## ❄ සංවර සීලය

සමාදන් වන්නා වූ පඤ්ච සීල ආදීය නොබිඳ රැකීම "**සීල සංවරය**" නම් වේ. අසංවරය තුලින් සිල් බිඳීමට හේතු වෙන ඇස කන නාසය දිව ශරීරය මනස යන සදෙර සංවර කර ගැනීම, කුසල් අරමුණෙහි පිහිටුවා ගැනීම "**සති සංවරය**" නම් වේ. තණ්හා දිට්ඨි මානා දී කෙලෙස් නො වැඩෙන සේ සැම දෙයක් ම පරිභෝග කිරීම "**ඤාණ සංවරය**" නම් වේ. සීතල උණුසුම බඩගින්න පිපාසය මැසි මදුරු පීඩා ආදී සැම දෙයක් ම ඉවසීම "**ඛන්ති සංවරය**" නම් වේ. සිතෙහි හටගන්නා කාම විතර්ක ව්‍යාපාද විතර්ක විහින්සා විතර්ක යටපත් කොට කුසලාරම්මණයෙහි පිහිටුවා ගැනීම "**විරිය සංවරය**" නම් වේ. මෙසේ සංවර වීම "**සංවර සීලය හෙවත් සංවර විනය**" නම් වේ.

### ❄ අවීතික්‍රම සීලය

සමාදන් වූ සීලය කයින් වචනයෙන් නොබිඳෙන ලෙස සිහියෙන් ආරක්‍ෂා කිරීම **අවීතික්‍රම සීලය** නම් වේ.

## 4. කවර අර්‍ථයකින් සීලය යැයි කියනු ලැබේ ද?

"**සීලන**" අර්‍ථයෙන් සීල යැයි කියනු ලැබේ. **සීලන අර්‍ථය** නම් "**සමාධානය** හා **උපධාරණය**" යි. එයින් කුසල සිතින් කරන කටයුතුවලට විසිර යාමට නොදී එකඟ සිතින් කළ හැකි බව "**සමාධානය**" නම් වේ. කුසල ධර්‍මයන්ට උපකාර වීම රැකවරණය ලබා දීම "**උපධාරණය**" නම් වේ. ධ්‍යාන මාර්‍ග - ඵල ප්‍රතිලාභයට මූලය, භූමිය සීලය වේ.

## 5. සීලයෙහි ලක්‍ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන කවරහු ද?

**ලක්‍ෂණය** නම් :- නීලාදී නොයෙක් වර්‍ණයන්ගෙන් යුක්ත බව රූපයෙහි ලක්‍ෂණය වන්නා සේ **චේතනා, චෛතසික, සංවර, අවීතික්‍රම** යන සතර වැදෑරුම් බව සීලයෙහි සමාධානය හා උපධාරණය **ලක්‍ෂණය** යි.

රසය නම් :- යමකින් කෙරෙන කාර්‍යයයි. සීලයෙහි ද රසය **කෘත්‍ය රසය, සම්පත්ති රසය** යි දෙ වැදෑරුම් වේ. සීලයෙහි **කෘත්‍ය රසය** නම් දුස්සීල බව විනාශ කිරීමයි. **සම්පත්ති රසය** නම් ධ්‍යානාදී ගුණ ඉපදවීමයි. සීලවන්තයාට

ම ධ්‍යානාදී ගුණ ලැබෙන හෙයිනි.

**පච්චුපට්ඨාන නම්:-** වැටහෙන ආකාරයයි. සීලවන්තයා සිතින් කයින් වචනයෙන් කරන ක්‍රියාවන් තමන්ටත් අනුන්ටත් යහපත පිණිස පවතින ලෙස කරන බැවින් ඔහුගේ සිල්වත් බව දත හැකි වන්නේ ය.

**පදට්ඨාන නම්:-** ආසන්න කාරණයයි. **හිරිය** (සිතෙහි අකුසල් සිත් හට ගන්නවාට ඇති ලැජ්ජාව) **ඔත්තප්පය** (කයින් වචනයෙන් අකුසල් සිදු වෙනවාට ඇති බය) සීලයක් මනාව රැකීමට ඇති සමීප ම හේතු දෙකය. හිරි ඔත්තප්ප ධර්ම නැති විට පස් පව් දස අකුසල් කිරීමට බියක් නූපදනේ ය. එහි විපාකයන්ට බියක් ඇති නොවන්නේය.

දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය බෞද්ධ ශ්‍රාවකයා යටත් පිරිසෙයින් අවබෝධයෙන් යුතුව නිති පන්සිල් සමාදන්ව රැකිය යුතුය. එසේ නොහැකි වූවහුට බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු විය නොහැකිය. ඔහු නිවන් මඟින් බැහැර වූවෙකි.

# 6. සීලයක් අවශ්‍ය වන්නේ කුමකට ද?

සීලය වනාහි පඤ්ච සීලය, ආජීව අෂ්ටමක සීලය, අෂ්ටාංග උපෝසථ සීලය, ගහට්ඨ දස සීලය, නෙක්ඛම්ම දස සීලය, සාමණේර දස සීලය, උපසම්පද සීලය ආදී වශයෙන් ප්‍රභේද ඇත්තේ ය. මෙසේ වූ සීලය "**සීල** - **අධි සීල**" යැයි දෙ වැදෑරුම් වේ. මෙයින් පඤ්ච සීලය, ආජීව අෂ්ටමක සීලය, අට්ඨාංග උපෝසථ සීලය, ගහට්ඨ දස සීලය, නෙක්ඛම්ම දස සීලය යන මේවා අබුද්ධෝත්පාද කාලවල ද ඇති බැවින් "**සීල**" නම් වේ. **සාමණේර සීලය, උපසම්පද සීලය** යන පැවිදි සිල් බුද්ධෝත්පාද කාලයෙහි පමණක්ම ඇති බැවින් "අධි

**සීලය**" නම් වේ. එසේම නිවන ප්‍රාර්ථනාවෙන් සමාදන් වන පඤ්ච සීලාදී සීලයන් ද "**අධි සීල**" නම් වේ. තවද පෘථග්ජනයින්ගේ සීලයන් "**සීල**" නම් වේ. ගිහි වූ ද, පැවිදි වූ ද සෝවාන් ආදී මඟ පල ලාභීන්ගේ සීලය "**අධි සීල**" නම් වේ.

සෑම කටයුත්තක දීම මුල එහි ආරම්භය ය. මැද ඒ දෙය කරගෙන යාම ය. අග එහි අවසානය ය. එසේම නිර්වාණ මාර්ගයෙහි ද මුල මැද අග සම්පූර්ණ කිරීමෙන් ම නිර්වාණාවබෝධය සිදු වේ. සීලය ශාසනයෙහි **ආදී කල්‍යාණය** හෙවත් **මුල** වේ. සමාධිය **මජ්ඣෙ කල්‍යාණය** හෙවත් **මැද** වේ. ප්‍රඥාව **පරියෝසාන කල්‍යාණය** හෙවත් **අග** වේ.

සත්වයෝ මනුලොව උපදින්නේ කුසල් සිතිනි. එබැවින් කුඩා අවදියෙහි දී අපගේ සිත ඉතා පිරිසිදු ය. ඒ සිත් පරම්පරාව නො වෙනස් ව පවත්වා ගත හැක්කේ නම් ධ්‍යාන අභිඥා මග් - ඵල ලැබීම අපහසු කාර්‍යයක් නොවේ. එහෙත් දන තේරෙන වයසේ සිට ඇස් රවටන රූප, කන් රවටන ශබ්ද, නාසය රවටන ගන්ධ, දිව රවටන රස, කය රවටන ස්පර්ශ ආදී තෘෂ්ණා දිට්ඨි මාන වැඩෙන අරමුණු ලැබීම හේතුවෙන් ඒ උපදින විට තිබුණු ධ්‍යානාදී වූ උසස් ගුණ වැඩීමට තරම් සුදුසු මට්ටමේ පැවති සිත වෙනස් ව ගොස් ඇත. අපිරිසිදු වී ඇත. ආකුල ව්‍යාකුල වී ඇත. මුලාවෙන් මුලාවට පත්ව ඇත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ කායික වාචසික මානසික සෑම ක්‍රියාවක් ම පාහේ තණ්හා දිට්ඨි මානා දී කෙලෙස් අරමුණු ඔස්සේ ම සිදු වෙමින් සංසාර දුකින් ගැලවීමට නො හැකි ව තව තවත් දුකින් දුකට පත්වීමයි.

අපගේ කය ගිලන් වූ විට බාහිරින් ගන්නා බෙහෙත්වලින් සුව කර ගන්නා ලෙස සිතට පිළියම් කළ නොහැක. එය කළ හැක්කේ කායික රෝග හට ගැනීමට හේතුවන විෂබීජ ආදිය ඇතුළු නොවන ලෙස කය ආරක්ෂා කරගන්නා සේ කය වචනය තුලින් සිතට පැමිණෙන අරමුණුවලින් ද, සිත ඇතුළතින් හටගන්නා වූ අරමුණුවලින් ද, ප්‍රාණඝාතාදී කායික වැරදිවලට ද, බොරු කීමාදී වාචසික වැරදිවලට ද නොපැමිණ සිත ආරක්ෂා කර ගැනීමෙනි. මෙලෙස කායික වාචසික වැරදිවලට නොපැමිණ කය වචනය සංවර

කර ගැනීම "**සීලය**" නම් වේ.

නොයෙක් අපවිත්‍ර දෙයින් පිරුණු බොර දියෙහි ඇත්තා වූ දෙයක් දැකීමට හෝ ගැනීමට ලෙහෙසි නැත. එමෙන්ම කර්‍ම විශ්වාසයක් නැති සීලයක ගුණයක නොපිහිටියා වූ, අවිද්‍යා තෘෂ්ණා දිට්ඨි මානා දී කෙලෙසුන්ගෙන් ගැවසුණා වූ සිත නොයෙක් අපවිත්‍ර දෙයින් පිරුණු බොර දියක් බඳු ය. එබඳු සිතක් ඇතියවුන්ට පූර්‍ව කළ කී දෙයින් මෙලොව සැප හෝ දුක් උරුම වූ වග නො වැටහෙයි. එසේම මෙලොව කරන කියන දෙයින් මතු සැප හෝ දුක් ලබන බව ද නො තේරෙයි. පිරිසිදු දියෙහි ඇති ඕනෑම දෙයක් දැකීමට හෝ ගැනීමට පහසු ය. එසේම කර්‍ම විශ්වාසය ඇතිව තෙරුවන් සරණ ගොස් සීලයක පිහිටා දනාදී පින්කම් කරන, මවපිය උපස්ථාන කරන, වැඩිහිටියන්ට සංග්‍රහ කරන, ධර්‍ම ශ්‍රවණය කරන, සමථ විපස්සනා භාවනා වඩන තැනැත්තාගේ සිත පැදි දියක් බඳු ය. එබඳු සිතට තමන් හෝ අනුන් හෝ කරන කියන සෑම දෙයක ම විපාක ලැබෙන බව ඇසීමෙන් හෝ සිතීමෙන් හෝ ප්‍රත්‍යක්‍ෂ අවබෝධයෙන් හෝ දත හැකිය. එලෙස දැකීමට "**සම්මාදිට්ඨිය**" යැයි කියනු ලැබේ.

මෙලෙස අවබෝධය ඇති තැනැත්තා තමහට හිතසුව පිණිස පවතින්නෙක් වේ. අන්‍යයන්ට ද හිතසුව පිණිස පවතින්නෙක් වේ. ලොව ජය ගන්නෙක් වේ. ඒ උතුම් වැඩ පිලිවලෙහි ආරම්භය තිසරණ සරණ පිහිටා පන්සිල් සමාදන්ව බෞද්ධයෙකු වීමයි. සසර ගමනෙහි දී ප්‍රථම වතාවට පන්සිල් සමාදන් වූවහුට එය එකවරම නොබිඳ රැකීමට නොහැකි ය. ඒ සඳහා ආත්ම පන්සියයක පමණ පන්සිල් රැක පුරුද්දක් තිබිය යුතු ය. එබැවින් පන්සිල් රැකීම ද ලෙහෙසි පහසු දෙයක් නොවන බව අමතක නොකළ යුතු ය. එසේම එය පුරුදු නොකොට ජය ගැනීම කිසිකලෙකවත් සිදු නො වන්නේම ය. අපට මෙවන් බුද්ධෝත්පාද කාලයක් මනුෂ්‍ය ජීවිතයක් ලැබුණු මේ අගනා මොහොතේ ශ්‍රද්ධාව නුවණ අවධි කරගෙන බුදුරජාණන් වහන්සේගේ සැබෑ ම ශ්‍රාවකයෙකු වීමට අධිෂ්ඨාන කර ගත යුතු ය.

# 7. පඤ්ච සීලය

තිසරණ සහිත පඤ්ච සීලය ඉල්ලීමේ වාක්‍යය.

**ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං පඤ්චසීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ.**

**දුතියම්පි.... තතියම්පි ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං පඤ්චසීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ අනුකම්පං උපාදය.**

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

**බුද්ධං සරණං ගච්ඡාමි.**
**ධම්මං සරණං ගච්ඡාමි.**
**සංඝං සරණං ගච්ඡාමි.**

**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.**
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.**
**දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි.**

**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.**
**තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.**
**තතියම්පි සරණං ගච්ඡාමි.**

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
2. **අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
3. **අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
4. **මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
5. **සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**

ලෝකයෙහි ජීවත් වන සත්වයන් අතර තමන්ටත් අනුන්ටත් අවැඩ පිණිස පවතින සෑම කල්හි ම වැරදි යැයි සම්මත ධර්ම පසක් ඇත්තේ ය. ඒවා නම් "**ප්‍රාණඝාතය, සොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම, සුරා පානය**" යන පසයි. එම වැරදිවලින් වැළකීමට සම්මත ප්‍රඥප්ති ධර්ම පස "**පඤ්ච සීලය**" නම් වේ. එහි අර්ථ විභාගය මෙසේ ය.

## ❄ ප්‍රාණඝාතය

සත්වයෙකුගේ ජීවිතයක් කර්ම ශක්තියට හා පවතින ආයුෂ කාලයට අනුව පවතින්නට නොදී අනෙකෙකුගේ උපක්‍රමයකින් විනාශ කිරීම ප්‍රාණඝාතය නම් වේ. ආදර ගෞරවයෙන් තෙරුවන් සරණ ගිය බෞද්ධයා විසින් එම වරදින් වැළකීමට භාග්‍යවතුන් වහන්සේ පනවා වදාළා වූ "**පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**" යන සික්ෂාව සමාදන්ව එහි යෙදිය යුතු ය. එහි අර්ථ විවරණය මෙසේ ය.

"**පාණාතිපාතා**" යන මෙහි "**පාණ**" යනු ලෝක ව්‍යවහාරය අනුව ජීවත් වන සත්වයා ය. පරමාර්ථ වශයෙන් ගත් කල්හි **ජීවිතෙන්ද්‍රිය** නම් වේ. එය ද "**නාම ජීවිතේන්ද්‍රිය, රූප ජීවිතේන්ද්‍රිය**" යනුවෙන් දෙ වැදෑරුම් වේ. එයින් "**නාම ජීවිතේන්ද්‍රිය**" යනු භවයක් පාසා නො සිඳී පවතින සිත් පරම්පරාව ය. "**රූප ජීවිතේන්ද්‍රිය**" යනු මෙලොව පිළිසිඳ ගත් ද පටන් මරණාන්තය දක්වා කර්ම ශක්තිය අනුව පාලනය වන කර්මජ රූප පරම්පරාව ය. ප්‍රාණඝාතයෙහි දී ගැනෙනුයේ මේ **රූප ජීවිතෙන්ද්‍රය** ය. මෙසේ වූ ජීවිතේන්ද්‍රිය හෙවත් ප්‍රාණය නැසීමේ චේතනාව "**පාණාතිපාතා**" නම් වේ.

"**වෙරමණී**" යන්නෙහි "**වෙරං මණතීති = වෙරමණී**" වෛරය දුරු කරන්නේ නුයි "**වෙරමණී**" නම් වේ. මෙයින් සත්ව ඝාතනයෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. මෙම විරතිය "**සම්පත්තවිරති, සමාදනවිරති, සමුච්ඡේදවිරති**" යනුවෙන් තෙවැදෑරුම් වේ. යමෙක් සිල් සමාදන් නොවී තම උපන් කුලය

ගෝත්‍රය සළකා මෙවැනි පව් කම් කිරීම අපගේ කුල වංශයට නොගැළපෙයි යැයි සිතීමෙන් ද, ඇතමෙක් තම උගත්කම සැලකීමෙන් ද, ඇතමෙක් තම වයස සැලකීමෙන් ද දුසිරිත්වලින් වැළකෙති. මෙය "**සම්පත්තිවිරති**" නම් වේ. ශික්ෂාපද සමාදන්ව තම ජීවිත හේතුවෙන් වත් නොබිඳ රැකීම "**සමාදානවිරති**" නම් වේ. නැවත නූපදනා ලෙස කෙලෙසුන් නැසූ ආර්‍ය්‍ය උතුමන්ට ප්‍රාණඝාතාදී සිතකුදු පහළ නොවෙත්ම ය. මෙය "**සමුච්ඡේදවිරති**" නම් වේ. මෙහි දී **සමාදානවිරතිය** අදහස් කරන ලදි.

"**සික්ඛාපදං**" යන මෙහි සත්වඝාතනාදී වැරදි අතහැරීම, හික්මීම, සංවර වීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්‍ණය කිරීම නිවනට මාර්‍ගය වන බැවින් "**පද**" නම් වේ. මෙසේ නිස්සරණාධ්‍යාශයෙන් යුතුව ප්‍රාණඝාතයෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින් ද, නිර්‍වාණාධිගමයට උපාය මාර්‍ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

**ලාභ, කීර්ති, ප්‍රශංසා, ධන, ඥාති, පරිවාර, ශරීරාවයව, ජීවිතාදී** කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීම ද, යම් හේතුවකින් සිල් බිඳුනේ නම් වහාම එය සමාදන්ව ආයති සංවරයෙහි පිහිටීම ද, ක්‍රෝධය, බද්ධ වෛරය, ගුණමකු බව, උසස් ගුණවතුන් හා තමන් සම කිරීම, අන්‍යයන්ට ලැබෙන කීර්ති ප්‍රශංසා නො ඉවසීම, තමන් ළඟ ඇති ගුණධර්‍ම හෝ පරිභෝග වස්තූන් අනුන්ට නොදීම, තම අගුණ සැඟවීම, තමාතුළ නැති ගුණ පෙන්වීම, දරදඬුබව, එකට එක කිරීම, මානය, දැඩි මානය, සත්විසි මඳය, ප්‍රමාදය යන පාප ධර්‍මයන්ගෙන් තොරව "**අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤූපසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික**" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්තව රැකීම "**සමාදියාමි**" නම් වේ.

මුල හෝ අග ශික්ෂාපද නොබිඳ රැකීම "**අඛණ්ඩ**" නම් වේ. මැදින් සිකපද නොබිඳ රැකීම "**අඡිද්‍ර**" නම් වේ. එක පිළිවෙලට සිකපද නොබිඳ රැකීම "**අසබල**" නම් වේ. තැනින් සිකපද නොබිඳ රැකීම "**අකල්මාස**" නම් වේ. ඉහත කී අංගයන්ගෙන් යුත් සීලය තෘෂ්ණා දසත්වයෙන් නිදහස් කරවන බැවින් "**භුජිස්ස**" නම් වේ. එබඳු සීලයම බුදු පසේබුදු මහරහත් ආදී උතුමන්ගේ ප්‍රශංසාවට ලක්වන බැවින්

**"විඤ්ඤුප්පසත්ථ"** නම් වේ. එබඳු වූ සීලය මම මගේ යැයි තණ්හා දිට්ඨි වශයෙන් නොගන්නා බැවින් **"අපරාමට්ඨ"** නම් වේ. එසේ වූ සීලය උපචාර සමාධි අපර්ණා සමාධි විදර්ශනා ඥාන උපදවාලීමට සමත් බැවින් **"සමාධිසංවත්තනික"** නම් වේ.

මෙලෙස සීල විපත්තියෙහි ආදීනව හා සීල සම්පත්තියෙහි ආනිශංස සළකා මනා ගෞරවයෙන් සිල් රැකීම මෙලොව දියුණුව පරලොව සුගතිය හා ඒකාන්තයෙන් ම වැරදීමකින් තොරව නිවනින් සැනසීමට හේතු වන්නේම ය.

## ☸ ප්‍රාණඝාත අකුශලය කෙසේ සිදු වේද?

අංග පසක් සම්පූර්ණ වීමෙන් ප්‍රාණඝාතය සිදු වෙයි.

1. පණ ඇති සතෙකු වීම,
2. පණ ඇති සතෙකු බව දැන ගැනීම,
3. මරණු කැමති සිත,
4. මැරීම පිණිස උපක්‍රම යෙදීම,
5. ඒ උපක්‍රමය නිසාම මැරීම යන පසයි.

මෙම අංග පසම සම්පූර්ණ නොවී ප්‍රාණඝාත අකුශලය සිදු නොවේ. සත්වයන් මරණ චේතනාවක් නැතිව ගොවිතැන් ආදී වැඩකටයුතු කිරීමෙහිදී ද, යන එන විටදී පෑගීමෙන් ද සතුන් මැරෙන නමුත් ප්‍රාණඝාතය සිදු නොවේ. මාගේ මේ ප්‍රයෝගයෙන් සත්වයෝ මැරෙත්වා යැයි සිතා කරන වැඩවල දී මැරෙන සත්වයන් ගේ ගණනින් ප්‍රාණඝාතය සිදු වෙයි. එක් සතෙකු මැරීමට කළ ප්‍රයෝගයෙන් අන් සතෙකු මැරෙයි ද, එම සතා මරණ අදහසක් නැති බැවින් ප්‍රාණඝාතය සිදු නොවේ. නො මැරීමේ අදහසින් කල ප්‍රයෝගයකින් සතෙකු මැරෙන්නේ ද, මරණ චේතනාවක් නැති බැවින් ප්‍රාණඝාතය සිදු නොවේ. ශල්‍යකර්මාදියෙහි ද මෙසේම ය. නිවෙස් හා භාජනාදිය පිරිසිදු කිරීම් ආදියෙහි දී සතුන් ඇත්තේ නම් මරණ චේතනාවක් හිංසා කිරීමේ චේතනාවක් නැතිවම එය කළ යුතු

ය. යම් ක්‍රියාවක දී එයින් සතුන් මැරෙන බව දන්නේනම් එය නොකළ යුත්තේම ය.

ප්‍රාණඝාතය සිදුකළ හැකි ප්‍රයෝග සයකි. එනම් "**සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, ථාවර, විජ්ජාමය, ඍද්ධිමය**" යන සයයි.

සතෙකු මැරීම පිණිස ගැසීම, ඇනීම, කැපීම ආදිය තමන් විසින් ම කිරීම **සාහත්ථික ප්‍රයෝග** නම් වේ.

සතෙකු මැරීම පිණිස අනෙකෙකුට අන කිරීම **ආණත්තික ප්‍රයෝග** නම් වේ. මෙය **වස්තුව, කාලය, අවකාශය, ආයුධය, ඉරියව්ව, ක්‍රියා විශේෂ** යැයි සය වැදෑරුම් වේ.

එහි **වස්තුව** යනු මරනු ලබන සත්වයා ය. යමෙක් අසවල් සත්වයා මරන්නට යැයි අණ කළ කල්හි, අණ ලැබූ තැනැත්තා විසින් නොවරදවාම එම සතා මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එම සතා නො මරා වෙන සතෙකු මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**කාලය** යනු රාත්‍රී කාලය, දිවා කාලය වශයෙන් කාලය නියම කිරීමයි. අසවල් වේලාවෙහි දී මරන්නට යැයි අණ කළ කල්හි, අණ ලැබූ තැනැත්තා විසින් නොවරදවාම එම වේලාවෙහි දී ම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එම වේලාවෙහි දී නො මරා වෙන වෙනත් කාලයක දී මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**අවකාශය** යනු එම ක්‍රියාව කරන තැනය. අසවල් තැන සිටින සත්වයා මරන්නට යැයි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා නියමිත තැනදීම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එතැන දී නො මරා වෙන තැනක දී මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**ආයුධය** යනු මැරීම සඳහා යොදා ගන්නා ආයුධයයි. අණ කරන්නා පිහියකින් ඇණ මරන්නට යැයි නියම කළ කල්හි අණ ලැබූ

තැනැත්තා එලෙස ම කළ හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා අන් ආයුධයකින් ඇණ මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ. ප්‍රාණඝාතය පිණිස ආයුධ සෑදූ කල්හි වසර දහස් ගණනක් වුව ද එම ආයුධයෙන් සතුන් මරන්නේ ද, ඒ තාක් එම ආයුධ සෑදූ තැනැත්තාට ප්‍රාණඝාත අකුශලය සිදු වේ. එබැවින් එම ආයුධ විනාශ කිරීම යහපති.

**ඉරියව්ව** යනු සත්වයා සිටින ඉරියව්වයි. නිදා සිටින විට මරන්නට යැයි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා නිදා සිටින සත්වයෙකු ම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා සිටගෙන සිටින සත්වයෙක් මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**ක්‍රියාවිශේෂය** යනු මරණු සඳහා කරන උපක්‍රමයයි. වෙඩි තබා මරන්නට යැයි අණ කළ විට අණ ලැබූ තැනැත්තා එලෙස ම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා ගලකින් ගසා මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ. කෙසේ හෝ මරන්නට යැයි අණ කළ විට අණ ලැබූ තැනැත්තා මොනයම් ක්‍රමයකින් හෝ මරන්නේ ද දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

උගුල් අටවා තැබීම, උල් සිටවා තැබීම, තුවක්කු බැඳ තැබීම, වළවල් සාරා තැබීමාදිය **ථාවර ප්‍රයෝග** නම් වේ. අසවල් සත්වයා මැරීමට යැයි වළක් සෑරූ කල්හි එම සත්වයා ම එහි වැටී මල හොත් ප්‍රාණඝාතය සිදු වේ. අන් සත්වයෙකු එයින් මල හොත් ප්‍රාණඝාතය සිදු නොවේ. එම සත්වයා මැරීමේ අදහසක් නැති බැවිනි. අසවල් සත්වයා මැරීමට යැයි නියමයක් නැතිව වළක් සාරා තැබීමෙන් කවර සත්වයෙකු හෝ වැටී මල හොත් ප්‍රාණඝාතය සිදු වේ. ඒ වළවල් ආදිය වසර දහස් ගණනක් වුව ද පවත් ද ඒ තාක් ඒවාට ගොදුරු වී මැරෙන සත්වයින්ගේ ගණනින් එම ප්‍රයෝග කළවුන්ට ප්‍රාණඝාතය සිදු වේ.

අංගම් පිඹීම, සූනියම් කිරීම, පිල්ලි යැවීමාදිය **විජ්ජාමයප්‍රයෝග** නම් වේ.

ඇතැම් අමනුෂ්‍යාදීන්ට තම ශරීරය දක්වීමෙන් ද, බිය ගැන්වීමෙන් ද අන්‍යයන් නැසිය හැකි සෘද්ධිවිශේෂ උපතින් ම පිහිටා තිබේ. එබඳු කර්මජ ශක්තීන් **සෘද්ධිමය ප්‍රයෝග** නම් වේ.

## ☸ ප්‍රාණඝාත කර්මය පිළිබඳව දත යුතු වෙනත් කරුණු

මිනිසත්බව ලැබූ යම් කෙනෙක් මනුෂ්‍ය වූම තම මව හෝ පියා හෝ රහතන් වහන්සේ නමක් හෝ මරන්නේ ද, ඔහු දෙවන ජාතියෙහි නොවරදවාම අවීචි මහ නරකයෙහි උපදවාලීමට සමත් වන ආනන්තර්‍ය්‍ය පාප කර්මය කරගත්තෙකු වේ. තම මව හෝ පියා හෝ උපතින් ම තිරිසන් වූයේ නම් හෝ පසුකලෙක තිරිසන් බවට පෙරළුණේ නම් හෝ එබඳු මව්පියන් මරණ මනුෂ්‍ය ව උපන් දරුවෙකුට ද, එසේම මනුෂ්‍ය මව්පියන්ට දව උපන් තිරිසන් දරුවෙක් විසින් හෝ පසුව තිරිසන් බවට පෙරලුණු දරුවෙක් විසින් හෝ තම මනුෂ්‍ය ජාතික මව්පියන් මරන්නේ නම් ඔහුට ද ආනන්තර්‍ය්‍ය කර්මය සිදු නොවේ. එයින් බරපතළ ප්‍රාණඝාත අකුශලයක් පමණක් සිදු වේ.

දහවල් කාලයෙහි යම් තැනක එළුවෙකු නිඳනු දැක රාත්‍රී කාලයෙහි ගොස් ඌ මරමි යැයි සිතා රාත්‍රියෙහි එතැනට ගොස් එළුවා යැයි සිතා එහි සිටි තම මව හෝ පියා හෝ මරනු ලැබුවේ නම් ඔහුට ආනන්තර්‍ය්‍ය කර්මය සිදු වේ. මැරීමේ අදහසින් කළ බැවිනි.

ඇතමෙක් දුක් විඳින සතුන් දැක ඔවුන් දුකින් මිදවීම යහපත්ය, එයින් පවක් නොවේය යැයි කියා මරා දමති. මොන විදිහේ දුකක් වින්දේ නමුත් ඔවුන්ට ජීවිතයට වඩා ප්‍රිය දෙයක් නැත. මරණයට බිය නොවන කිසිම සත්වයෙක් නැත. ද්වේෂ සිතකින් තොරව ප්‍රාණ වධයක් කළ නොහැක.

සියපණ නසාගැනීමද බොහෝ සෙයින් ම ද්වේෂ සහගත සිතින්ම සිදුවන්නකි. එහෙත් එය ප්‍රාණඝාත කර්මයට අයත් නොවේ. එයින් අල්ප සාවද්‍ය අකුශලයක් සිදු වේ. අන් සත්වයෙකු මැරීමෙන් ම ප්‍රාණඝාතය සිදු වේ.

## ☸ ප්‍රාණඝාත කර්මයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

ප්‍රාණඝාත කර්ම සියල්ල එකිනෙකට සමාන නොවේ. සත්වයන් අතර මනුෂ්‍යයාගේ ගුණය මහත් බැවින් මනුෂ්‍ය ඝාතනය මහා සාවද්‍ය අකුශලයක් වේ. මනුෂ්‍ය ඝාතනයෙහි ද ආනන්තර්‍යය පාපකර්මය බලවත් ම අකුශලය වේ. ඒ අතර ද ගුණ මහන්තතාවය උසස් හෙයින් රහතුන් මැරීමෙහි අකුශලය බලවත් වේ. රහතන් වහන්සේලා  අතර ද අග්‍රශ්‍රාවක, මහා ශ්‍රාවක, ප්‍රතිසම්භිද ලාභි, ෂට් අභිඥ ලාභි, ත්‍රි විද්‍යා ලාභි, ශුෂ්ක විදර්ශකාදී රහතන් වහන්සේලාගේ ගුණ මහන්තතාවය අනුව අකුශලයෙහි බලවත් කම වෙනස් වේ. මව්පියන් අතර මවගේ ගුණය අධික හෙයින් පීතෘඝාතක අකුශලයට වඩා මාතෘ ඝාතක අකුශලය බලවත් වේ.

ඊළඟට අනාගාමී, සකෘදගාමී, සෝවාන් ආර්‍යයන් වහන්සේලාගේ වශයෙන් ගුණ මහන්තතාවය අනුව අකුශලය බලවත් වේ. ඊළඟට කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලාගේ ගුණ මහන්තතාවය අනුව අකුශලය බලවත් වේ. ඊළඟට ශාසනයෙන් බැහැර පැවිද්දන්, තම ගුරුවරයන්, සිල්වත් ගුණවත් මනුෂ්‍යාදීන් ගේ වශයෙන් අකුශලය බලවත් වේ. තිරිසන් ගත සත්වයින්ගෙන් දීර්ඝායුෂ ඇති සත්වයන් හා මහත් වූ ශරීර ඇති සත්වයන් මැරීමේ අකුශලය බලවත් වේ. මැරීමට යොදන උපක්‍රමයන්ගෙන් මහත් ශරීරයක් ඇති සත්වයෙකු මැරීමට මහත් උත්සාහයක් යෙදිය යුතු වීමෙන් කර්මය මහා සාවද්‍ය වේ. ක්ලේශයන් ගේ සැටියට ද එහි අල්ප සාවද්‍ය, මහා සාවද්‍ය බව වෙනස්  වේ. බලවත් කෝපයකින් ප්‍රාණඝාතය කිරීමෙන් කර්මය මහා සාවද්‍ය වේ.

## ☸ ප්‍රාණඝාත කර්මයෙහි විපාක

ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක යැයි කර්ම විපාක දෙ වැදෑරුම් වේ. සත්වයන් විසින් සිදුකර ගනු ලබන කුසලාකුසල කර්මයන්ගේ ශක්තියෙන් භවයෙන් භවය ගළපමින් දිගට සංක්‍රමණය වන ජීවිත පරම්පරාවෙහි ඒ  ඒ භවයෙහි පළමුවෙන් ම හටගන්නා

සිත ප්‍රතිසන්ධි සිත ය. ඒ ඒ භවයෙහි සැප දුක් ලබා දෙමින් උපකාර වන ශක්තිය ප්‍රවෘත්ති විපාකයන් ය. එක කර්මයකින් ප්‍රතිසන්ධි විපාක ලැබෙන්නේ එක් වතාවක් පමණකි. එම කර්මයෙහිම ප්‍රවෘත්ති විපාක වශයෙන් ආත්මභාව සිය දහස් ගණන් වාර සැප දුක් ලබා දීමට සමත් වෙති.

ප්‍රාණඝාත කර්මයෙහි ප්‍රතිසන්ධි විපාක වශයෙන් සතර අපායන්ගෙන් තැනක උපදවාලයි. ප්‍රවෘත්ති විපාක වශයෙන් රෝගාදී අන්තරායන් ඇති වී අඩු ආයුෂයෙන් මරණය සිදු වෙයි. ප්‍රාණඝාත කළ තැනැත්තා අන් කුසල ශක්තියකින් සුගතියක උපන්නේ ද, විකල වූ ශරීරාංගයන් ඇතිව උපදියි. නො මනා ලෙස පිහිටි ශරීරාවයව ඇත්තෙක් වේ. අන්‍යයන්ට අප්‍රිය වූ අශෝභන වූ ශරීරාවයව ඇතියෙක් වේ. නොයෙක් විට දුකින් ශෝකයෙන් විසීමට සිදු වේ. නිශ්කාරණයෙහි බිය වන්නෙක් වේ. බිඳී යන පිරිස් ඇත්තෙක් වේ. බොහෝ සතුරන් ඇත්තෙක් වේ. සතුරන්ගෙන් හින්සාවට පීඩාවට ලක් වන්නෙක් වේ. පරෝපක්‍රමයන්ගෙන් මරණයට පැමිණෙන්නෙක් වේ.

තත්පරයක් තුළ කෝටි ලක්ෂයක් වාර අපගේ සිත පරම්පරා වශයෙන් ගෙවී යයි. මේ අතර තත්පරයක් තුළ ප්‍රාණඝාතයක් කළ හොත් එම ක්‍රියාව තුළ කර්ම ජවන් දහසක් පමණ රැස් වෙයි. එම කර්මයන්ගෙන් මෙලොව විපාක දීමට සමත් කර්ම විපාක නො දුන්නේ නම් එම කර්ම අහෝසි කර්ම බවට පත් වේ. ඉතිරි කර්ම මතුවට ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක වශයෙන් විපාක දීමට සමත් වේ. එක භවයක් යනු එක කර්මයක විපාකයකි. මෙසේ එක් ජීවිතයක් තුළ රැස් වන කර්ම කෝටි ගණනින් වත් ප්‍රමාණ කළ නොහැක. සසරෙහි භයානකත්වය මෙයින් දත හැකිය. එබැවින් **"දිවි හිමියෙන් ප්‍රාණඝාතයක් නො කරන්නෙමි"** අධිෂ්ඨාන කරගැනීම මැනවි.

## ☸ ප්‍රාණඝාතයෙන් වැළකීමේ ආනිශංස

පෙර ලක්දිව එක් ගොවියෙක් **අම්බරිය විහාරවාසී පිංගිල බුද්ධරක්ඛිත** තෙරුන් වහන්සේ වෙතින් පන්සිල් සමාදන්ව ගොස්

ගොවිතැනින් ජීවත් වූයේ ය. එක් දිනක් එතුමා කුඹුරෙහි වැඩට ගෙන ගිය ගොනුන් නැති වී ඔවුන් සොයන්නට **උත්තර වඩ්ඪමාන පර්‍වතයට** නැංගේ ය. එහි දී පිඹුරෙකු විසින් ඔහුව වෙලා ගත්තේ ය. ගොවියා අත හොඳින් කැපෙන වෑයක් ද විය. ඔහුට පිඹුරාගේ හිස වෑයෙන් කපන්නට සිත් විය. නැවත ගරු කළ යුතු තෙරුන් වහන්සේගෙන් සමාදන්ව ගත් සීලය කුමට බිඳින්නේ ද යැයි සිතා එම අදහස අතහැර දැමීය. මෙලෙස පිඹුරා තදින් ශරීරය වෙලන විට තෙවරක්ම එම සතා මරන්නට සිත් වී තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් සිකපද බිඳීම නුසුදුසු යැයි සිතා, එම අදහස අතහැර මේ සත්වයා මැරීමට අත ආයුධයක් ඇති බැවින් මරණ චේතනාව සිතට පැමිණෙයි. මගේ දිවි නැති වුව ද මම සීලය නො බිඳින්නෙමි යැයි සිහි කොට අත තිබූ වෑය විසි කළේ ය. එකෙනෙහිම පිඹුරා ද එම උපාසක තුමා අතහැර ගියේ ය. මේ වනාහි මනාකොට සිල් රැකීමේ සාන්දෘෂ්ටික ආනිශංස යි.

## ❄ අදත්තාදානය

(මනුෂ්‍ය) වූ යම් කෙනෙකුට අයත් දෙයක් හිමිකරුවෙකු ඇති බව දැන දැනම සොර සිතින් ගැනීම "**අදත්තාදානය**" නම් වේ. මෙලොව දියුණුව පරලොව සුගතිය කෙළවර නිවන බලාපොරොත්තු වන සෑම දෙනාගේ ම එම අර්‍ථ සිද්ධිය මුදුන් පමුණුවා ගැනීමට සොරකම නම් වූ අකුශලය මහත් බාධාවක් වන හෙයින් එයින් වැළකීම පිණිස "**අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාධියාමි**" සිකපදය පනවා වදාළ සේක. එහි අර්‍ථ විවරණය මෙසේ ය.

"**අදින්නාදානා**" යන මෙහි "**අදින්න**" යන වචනය පාරාජික පාළියෙහි මෙසේ දක්වේ. "**යං අදින්නං, අනිස්සට්ඨං, අපරිච්චත්තං, රක්ඛිතං, ගොපිතං, මමායිතං, පරපරිග්ගහිතං = එතං අදින්නං නාම**"

එහි වස්තු හිමියාගේ අතින් හෝ අන් තිබූ තැනින් හෝ බැහැර නොකරන ලද දෙය "**අනිස්සට්ඨ**" නම් වේ. හිමිකරුවා විසින් අයිතිය අත් නොහරින ලදදෙය "**අපරිච්චත්ත**" නම් වේ. වැට කඩුලු

හෝ මුරකරුවන් යොදා හෝ ආරක්ෂා කරන ලද්ද "**රක්ඛිත**" නම් වේ. මඤ්ජුසා ආදියෙහි බහා රකින ලදදෙය "**ගොපිත**" නම් වේ. මෙය මගේ යැයි තණ්හා මමත්වයෙන් අයිතිය ප්‍රකාශ කොට තබාගන්නා ලදදෙය "**මමායිත**" නම් වේ. වස්තු හිමියා විසින් අයිතිය අත් නොහරින ලද, රක්‍ෂා කරන ලද, මගේ යැයි තණ්හා මමත්වයෙන් තබාගන්නා ලදදෙය "**පරපරිග්ගහිත**" නම් වේ. මෙසේ වස්තු හිමියා විසින් සිතින් අත් නොහරින ලද කයින් හෝ වචනයෙන් අන්හට නොදෙනලද නොපවරනලද දෙය "**අදින්න**" නම් වේ.

"**ආදාන**" යනු ඉහත සඳහන් සස්වාමික දෙයක් සොර සිතින් ගැනීමයි. එසේ ගැනීම ද ආකාර විසි පහකින් කළහැක. එය "**පස්විසි අවහාරය**" නම් වේ. ඒවා **නානා භණ්ඩ පඤ්චකය, ඒකභණ්ඩ පඤ්චකය, සාහත්ථික පඤ්චකය, පුබ්බපයොග පඤ්චකය, ථෙය්‍යාවහාර පඤ්චකය** යනුවෙන් කොටස් පහකට බෙදා ඇත.

## 1. නානා භණ්ඩ පඤ්චකය

**ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය** යනුවෙන් ප්‍රයෝග පහකි.

1. අන් සතු වස්තු දේපළ බොරු නඩු කියා අයිති කර ගැනීම **ආදියෙය්‍ය** නම් වේ.
2. අන් සතු දෙයක් තමා විසින් ගෙන යමින් සිටියදී අතරමග දී සොර සිතින් හිසෙහි තබා සිටි දෙය කරට ගැනීම, එක් අතක තුබූ දෙයක් අනික් අතට මාරු කිරීම ආදී ලෙස මුලින් තිබූ තැනින් අන් තැනකට මාරු කිරීම හරෙය්‍ය නම් වේ. එයින් සොරකම සිද්ධ වේ.
3. අන්‍යයන් විශ්වාසයෙන් තමන් ළඟ තැබූවක් පසුව ඉල්ලූ කල්හි "මම නො ගත්තෙමි" යැයි කියා නැවත නො දෙයි. එහෙත් සීලයට හානියක් නැත. වස්තු හිමියා ද එය බලාපොරොත්තුවෙන් සිටින තාක් එය ඔහු සතුය. නැවත තමන්ට එය නො ලැබේ යැයි සිතා එය අත්හරී ද, එවිට එය සොර සිත් ඇති තැනැත්තා සතු

වීම ද, ඔහුගේ සීලය බිඳීම ද වෙයි. මෙය අවහරෙය්‍ය නම් වේ.

4. යම් වස්තුවක් ගෙන යන්නකු දැක එය ගනු කැමති ව ගෙනයන්නහු ලවාම තමන් කැමති තැනට රැගෙන යාමට මාර්‍ගය වෙනස් කළ කල්හි වස්තු හිමියා ඒ මඟට හැරී දෙවන පියවර ඉක්මවනවාත් සමගම සොර සිත් ඇති තැනැත්තා ගේ සීලය බිඳෙයි. මෙය ඉරියාපථං විකොපෙය්‍ය නම් වේ.

5. අන් අය සතු වස්තුවක් තමා විසින් ම සොර සිතින් කෙසගක් පමණ හෝ තිබූ තැනින් එසවූ කල්හි සීලය බිඳෙයි. මෙය ඨානාචාවෙය්‍ය නම් වේ.

## 2. ඒකභණ්ඩ පඤ්චකය

නානා භණ්ඩ පඤ්චකයට අයත් කරුණුවලට සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියල්ල අයත් ය. ඒකභණ්ඩ පඤ්චකයෙහි දක්වා ඇත්තේ **ආදියෙය්‍ය** ආදී ප්‍රයෝග පසම සවිඤ්ඤාණක (දාස දාසීන්, අලි ඇතුන් ආදී) සත්වයන් පිළිබඳව ය.

## 3. සාහත්ථික පඤ්චකය

මෙහිද **සාහත්ථික, ආණත්ථික, නිස්සග්ගිය, අත්‍ථසාධක, ධුරනික්ඛේප** යනුවෙන් ප්‍රයෝග පසකි.

1. සොර සිත් ඇතිව අන් සතු දෙයක් සියතින්ම ගැනීම **සාහත්ථික** නම් වේ.

2. අනුන් ලවා සොරකම් කරවීම ආණත්ථික නම් වේ.

3. බඩුවලට බදු අය කරන තැන්වල දී රාජ්‍ය නිලධාරීන්ට නො දැනෙන්න පිටතට බඩු විසි කොට බදු නො ගෙවා යාම නිස්සග්ගිය නම් වේ.

4. අසවල් භාණ්ඩය ඉඩ ලැබුණ විටෙක පැහැර ගන්න යැයි අනෙකෙකුට අණ කළ කල්හි වසර ගණනකට පසුව හෝ අණ

ලැබූ තැනැත්තා එය පැහැර ගන්නේ නම් අණ කළ තැනැත්තා ගේ සීලය ඒ මොහොතෙහි දීම බිඳෙන්නේ ය. අණ ලැබූ තැනැත්තා ගේ සීලය වස්තුව පැහැර ගත් විටම බිඳෙයි. මෙය අත්‍ථසාධක නම් වේ.

5. වස්තු හිමියා රවටා ගැනීම, පරෙස්සමට මෙන් ලඟ තැබූ දෙය නො දෙනු පිණිස කල්ගතකිරීම, තමන් විසින් ම ආපසු දීමට කියා ඉල්ලා ගෙන නැවත නො දෙනු පිණිස කල්ගතකිරීම, ණය ගෙන නොදී කල්ගතකිරීම ආදියෙන් වස්තු හිමියා ගේ අපේක්‍ෂාව දුරු කොට තමන් සතු කර ගැනීම ධුරනික්ඛේප නම් වේ.

## 4. පුබ්බපයොග පඤ්චකය

**පුබ්බපයොග, සහපයොග, සංවිධාවහාර, සංකෙතකම්ම, නිමිත්තකම්ම** යැයි මෙහි ප්‍රයෝග පසකි.

1. යම් වස්තුවක් සොරකම් කිරීමට අනිකෙකුට නියෝග කළ කල්හි අණ ලැබූ තැනැත්තා නොවරදවාම එය සොරකම් කරන්නේ නම් නියෝග කළ තැනැත්තා ගේ සීලය සොරකමටත් කලින් ම බිඳෙයි. මෙය **පුබ්බපයොග** නම් වේ.

2. යමක් සියතින්ම සොරකම් කිරීමේ දී ද, ඉඩම් මැනීම දී අවස්ථාවන්හිදී මායිම් වෙනස් කොට වැට කඩුලු බැඳීමාදියෙහිදී ද එම ක්‍රියාව අවසන් වීමත් සීලය බිඳීමත් එකවිට සිදුවන බැවින් සහපයොග නම් වේ.

3. පිරිසක් විසින් සොරකමක් පිණිස සංවිධාන වී ගොස් එයින් එක් අයෙක් හෝ එම වස්තුව සොරකම් කරයි නම් සියල්ලන්ගේ ම සීලය බිඳෙයි මෙය සංවිධාවහාර නම් වේ.

4. අසවල් වෙලාවෙහි දී අසවල් භාණ්ඩය සොරාගනුව යැයි යමෙකුට අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා ඒ කියූ කාලයෙහි දීම ඒ භාණ්ඩය සොරාගන්නේම නම් අණ කළ තැනැත්තා ගේ සීලය ඒ මොහොතේ ම බිඳෙයි. මෙය සංකෙතකම්ම නම් වේ.

5. මම මෙසේ සඤ්ඤා කළ විට සොරා ගනුව යැයි භාණ්ඩය ළඟට

කෙනෙකු කලින් යවා එය ගැනීමට සුදුසු කාලයෙහි කියූ ලෙස කළ සඤ්ඤාවෙන් අණ ලැබූ තැනැත්තා භාණ්ඩය සොරාගනී නම් දෙදෙනාගේම සීලය එකවිට බිඳෙයි. මෙය නිමිත්තකම්ම නම් වේ.

## 5. ථෙය්‍යාවහාර පඤ්චකය

**ථෙය්‍යාවහාර, පසය්‍යාවහාර, පරිකප්පාවහාර, පටිච්ඡන්නාවහාර, කුසාවහාර** යැයි මෙහි ප්‍රයෝග පසකි.

1. සොර පඩි, සොර තරාදි, භාජන ආදියෙන් වඤ්චා කොට කිරුම් මිනුම් ආදිය කිරීම, ව්‍යාජ මුදල් ආදියෙන් ගනුදෙනු කිරීම, තත්වයෙන් බාල භාණ්ඩ උසස් තත්වයේ භාණ්ඩ ලෙස විකිණීමාදී කූට උපක්‍රමවලින් අන්‍යයන්ට අලාභ කිරීම **ථෙය්‍යාවහාර** නම් වේ.
2. අන්‍යයන්ට පහර දී බිය ගන්වා වස්තුව පැහැර ගැනීම පසය්‍යාවහාර නම් වේ.
3. අසවල් දෙය ඇතොත් ගණිමි යැයි යම් තැනකට (රාත්‍රියෙහි) ගොස් අත ගා බලා යමක් ගත් කල්හි අපේක්ෂා කළ දෙයම ගත්තෙහි නම් එකෙනෙහිම සීලය බිඳෙයි. අපේක්ෂා කළ දෙය යැයි රැවටී වෙනත් දෙයක් ගෙන බැහැරට ගොස් පරීක්ෂා කොට බලා කුමක් වුවත් ලැබුණු දෙය හොඳ යැයි ගත්තෙහි නම් එයින් ද සීලය බිඳෙයි. එය අනවශ්‍ය යැයි දමා ගියේ නම් සීලය රැකේ. එම භාණ්ඩය හිමි කරුට නො ලැබී විනාශ වූයේ නම් එහි වටිනාකම ගෙවිය යුතු වෙයි. නැතහොත් සීලය බිඳීම හා පාපය සිදු වෙයි. මෙය පරිකප්පාවහාර නම් වේ.
4. අන්සතු වස්තුවක් දැක එය පසුව ගැනීමේ අදහසින් වැලි, පස්, කොළරොඩු ආදියකින් වසාදමා ගොස් හිමිකරුවන් විසින් සොයා බලා නො දැක ගිය කල්හි ඇවිත් ගත් කෙනෙහි සීලය බිඳෙයි. ඒවා වැල්ලෙහි හෝ කොළරොඩු ආදියෙහි යට කරන ලද්දෙහි නම් එකෙනෙහිම වරදට පැමිණෙයි. මෙය පටිච්ඡන්නාවහාර නම් වේ.

5. බඩු කොටස් කර බෙදන විටෙක දී නම් ලියූ කුසපත් ඒ ඒ ගොඩවල් මත දමා ඇති කල්හි අනිකෙකුට හිමි වූ දෙයක් ගනු කැමති ව තමන්ට හිමි කුස පත හෝ බඩු හෝ අන් කෙනෙකුට අයත් ගොඩකින් තබා එහි ඇති කුස පත හෝ බඩු හෝ තමාට අයත් ගොඩෙහි දැමූ කල්හි සොරකම සිදු වේ. මෙය **කුසාවහාර** නම් වේ.

අන්සතු දේ පිළිබඳව අන්සතු බව දැන දැනම සොර සිතින් යුතුව කියන ලද පස්විසි අවහාරයන්ගෙන් යම් අවහාරයකින් ගැනීම **අදින්නාදානා** නම් වේ.

හිමිකරුවෙකු නැති දෙයක් සොර සිතින් ගත් කල්හි ද, හිමිකරුවෙකු ඇති දෙයක් වුව ද සොර සිතින් තොරව හිමියා කෙරෙහි විශ්වාසයෙන් ගැනීමෙන් ද, අන්සතු දෙයක් තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන් ද සොරකම සිදු නොවේ.

"**වෙරමණී**" යන්නෙහි "**වෙරං මණතීති = වෙරමණී**" වෛරය දුරු කරන්නේ නුයි "**වෙරමණී**" නම් වේ. මෙයින් සොරකමෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. "**සික්ඛාපදං**" යන මෙහි සොරකම් ආදී වැරදි අතහැරීම, හික්මීම, සංවර වීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් "**පද**" නම් වේ. මෙසේ නිස්සරණධ්‍යාශයෙන් යුතුව සොරකමෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින් ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

**ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී** කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීමෙන් ද, යම් හේතුවකින් සිල් බිඳුනේ නම් වහාම එය සමාදන්ව ආයති සංවරයෙහි පිහිටීමෙන් ද, "**අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික**" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්තව රැකීම "**සමාදියාමි**" නම් වේ.

අංග සතරක් සම්පූර්ණ වීමෙන් අදත්තාදනය සිදු වේ. ඒවා මෙසේ ය.

1. අන්සතු වස්තුවක් වීමය.
2. අන්සතු වස්තුවක් බව දැනීම.
3. පැහැර ගනු කැමති සිත.
4. පැහැර ගැනීමට උපක්‍රම කිරීම.

## ☸ අදත්තාදනයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

මනුෂ්‍ය ජාතික සත්වයෙකුට අයත් සස්වාමික දෙයක් වීම, අනුන් අයත් දෙයක් බව දැනීම, සොර සිත, පස්විසි අවහාරයන්ගෙන් යමකින් උපක්‍රම කිරීම, එයින් ගැනීම යන අංග පස සම්පූර්ණ වීමෙන් සොරකම සිද්ධ වේ. මෙම අංග පසෙන් එකක් හෝ අඩු වූයේ නම් සොරකම සිද්ධ නොවේ. තිරිසන් ගත සත්වයන්ට අයත් දෙයක් ගැනීමෙන් ද, ප්‍රේතයන්ට අයත් දෙයක් ගැනීමෙන් ද, අස්වාමික දෙයක් ගැනීමෙන් ද, කෙනෙක් කෙරෙහි විශ්වාසයෙන් ගැනීමෙන් ද, තාවකාලික හැඟීමෙන් ගැනීමෙන් ද, පංශුකූලික චේතනාවෙන් ගැනීමෙන් ද, තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන් ද,ශාරීරික ධාතු කිපීමකින් හෝ අමනුෂ්‍ය ආරූඩයකින් උමතු වූ විටෙක ගැනීමෙන් ද සොරකම සිද්ධ නොවේ.

අඩු වටිනාකමක් ඇති දෙයක් සොරකම් කිරීම අල්ප සාවද්‍ය වේ. වැඩි වටිනාකමක් ඇති දෙයක් සොරකම් කිරීම මහා සාවද්‍ය වේ. ගුණ හීනයන්ගේ දෙයක් ගැනීම අල්ප සාවද්‍ය වේ. ගුණවතුන් සතු දෙයක් ගැනීම මහා සාවද්‍ය වේ. දුස්සීලයෙක් සතු දෙයක් ගැනීම අල්ප සාවද්‍ය වේ. සිල්වතෙකු සතු දෙයක් ගැනීම මහා සාවද්‍ය වේ. තිසරණ පන්සිල් රකින ගිහි පින්වතෙකුට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. අටසිල් දසසිල් රකින පින්වතෙකුට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. සාමණේරයන් වහන්සේ

නමකට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. උපසම්පද භික්ෂුවකට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා අතිශයින් මහා සාවද්‍ය වේ. මෙලෙස සෝවාන් ආදී ආර්‍ය්‍යයන් වහන්සේලාට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා අතිශයින් මහා සාවද්‍ය වේ. මෙලෙස මෙහි විභාගය දත යුතුය. රත්නත්‍රයට අයත් දේ ගැනීම මේ සියල්ලට ම වඩා බැරෑරුම් වේ.

## ☸ අදත්තාදාන කර්‍මයෙහි විපාක

අන්සතු දේ සොරකම් කළ අයට මෙලොව දීම නින්ද ලබන්නට සිදු වේ. අත් පා ගල් මුගුරු ආදියෙන් පහර ලැබීමට සිදු වේ. සොරෙක් මංකොල්ල කරුවෙක් යැයි අපකීර්තියට පත් වෙයි. බරපතළ වැඩ සහිත සිර දඬුවම් විඳීමට සිදු වෙයි.

රත්නත්‍රයට අයත් වූද, මවපිය ගුරුවරාදීන්ට අයත් වූද, සිල්වතුන්ට-ගුණවතුන්ට අයත් වූද වස්තූන් පැහැර ගත්තවුන් හා විනාශ කළවුන් මරණින් මතු මහා රෞරව නරකයෙහි උපදියි. එහි දී අතිශයින් රුදුරු වූ ගින්නෙන් හා දුමින් ශරීරය ඇතුළත හා පිටත තවනු ලැබීමෙන් ලෝදිය බොමින් ලෝහ ගුලි ගිලිමින් මහ හඬින් හඬමින් අපමණ දුක් විඳීමට සිදු වෙයි. එහි ආයුෂය මෙසේ ය. මනුෂ්‍ය වර්‍ෂ අටදහසක් (8000) නිම්මාණරතී දෙවු ලොවට එක් දවසකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දොළොසක් එක් වර්‍ෂයකි. එසේ වූ වර්‍ෂ අටදහසක් එහි ආයුෂය වේ. එම දිව්‍ය ආයුෂය මනුෂ්‍ය වර්‍ෂවලින් ගණනය කළ විට වර්‍ෂ දෙසිය තිස් කෝටි හතළිස් ලක්‍ෂයක් (230,40,000,00) වේ. මෙම වර්‍ෂ දෙසිය තිස් කෝටි හතළිස් ලක්‍ෂය මහා රෞරව නරකයට එක් දවසකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දොළොසක් එක් වර්‍ෂයකි. එසේ වූ වර්‍ෂ අටදහසක් එහි ආයුෂය වේ.

ඉන්පසු ප්‍රේත ලෝකයෙහි ඉපිද ස්වල්ප වූද ආහාරයක් පානයක් නැතිව, වස්ත්‍ර නැතිව, වාසස්ථාන නැතිව, කිසිවෙක්ගේ අනුකම්පාවක් පිහිටක් නැතිව, වසර දහස් ගණන් දුක් විඳීමට සිදු වෙයි.

ඉන්පසු තිරිසන් ලොව ඇත්, අස්, ගව ආදී ලෙස දහස් ගණන් වාරවල ඉපිද වස්තු හිමියන්ට මෙහෙ කරමින් දුක් විඳීමට සිදු වෙයි.

අපායෙන් නිදහස් ව මිනිසත් බව ලැබූ කල්හි ද ඇට නහර මතු වූ කුණු තැවරුණු ශරීරයෙන් යුතුව උකුණු ආදී සත්වයන්ගෙන් පිරුණු හිස් ඇතිව නොයෙක් රෝග ආබාධ ඇතිව ඉරී ගිය කිලිටි වූ වස්ත්‍ර ඇතිව ශෝකයෙන් පීඩිත ව විසීමට සිදු වේ. ගිය ගිය තැන ගැරහුම් ලබමින් අනුන්ගේ ගෙවල්වල බැල මෙහෙවර කරමින් නින්ද ලබමින් තැන තැන සිඟා කමින් විසීමට සිදු වෙයි. ධනය ඉපයීමට කොතෙක් වෙහෙසුණ ද බලාපොරොත්තු ඉටු නොවෙයි. යන්තමින් හෝ යමක් උපයා ගත්තේ නමුත් ඒවා ගින්නෙන් දැවෙයි. දියේ ගසාගෙන යයි. සොර සතුරන් පැහැර ගනියි. නොකළ වැරදිවලට හසුව වරදකරු වී එම වස්තුව රාජසන්තක වෙයි. උපදවා ගත් ධන ධාන්‍ය වැඩිකලක් නො රැඳී අස්ථාන ගත වෙයි. නිතරම පාහේ නැත නැත යැයි කියමින් තැව තැවී සිටීමට සිදු වෙයි. අදත්තාදනය අප්‍රමාණ දුක් ගෙන දෙන සාපරාධී ක්‍රියාවක් වේ. එබැවින් මෙහි ආදීනව හා විපාකයන් හි බරපතළ කම සලකා සොර සිතක් වත් නූපදනා ලෙස සිත සංවර කර ගැනීමට අධිෂ්ඨාන කර ගත යුතුය.

## ❄ කාමමිථ්‍යාචාරය

**කාම** යනු මනස ප්‍රිය කරන්නා වූ රූප,ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, සැප ඇතිරිලි, පොරෝනා, දස-දසීන්, ඇත්, අස්, ගව, මහිස, එළු, බැටළු, කෙත්, වතු, රන්, රිදී, ගම්, නියම්ගම්, රාජධානි ආදී වස්තූන්ට ඇති කැමැත්තය. එය **වස්තුකාම, ක්ලේශකාම** යනුවෙන් දෙ වැදෑරුම් වේ. එයින් මනසට ප්‍රිය වූ රූප,ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන් **වස්තුකාම** නම් වේ. ඒ කාම වස්තූන් කෙරෙහි ඇති කැමැත්ත රාගය ආශාව ගිජුබව **ක්ලේශකාම** නම් වේ.

**කාමෙසුමිච්ඡාචාරා** යන මෙහි **කාමෙසු** යන්නෙන් මෛථුන ධර්මය අදහස් කරන ලදි. **මිච්ඡාචාරා** ඒකාන්ත නින්දිත වූ ලාමක වූ පහත් හැසිරීමයි. මෙම වචන දෙක එක් වූ කල්හි **කාමෙසුමිච්ඡාචාරා**

නම් වේ. එයින් අසද්ධර්ම සේවන අදහසින් මනුෂ්‍යය ගතිය ඉක්මවා සම්බන්ධකම් නො පැවැත්විය යුතු අය සමග සංසර්ගයෙහි යෙදීමේ සිතින් සිදු කරන ලාමක හැසිරීම කියවේ.

මෙහි පුරුෂයන් විසින් ඇලුම් නොකළයුතු ස්ත්‍රීන් **දස ස්ත්‍රීන්** හා **දස භාර්යාවන්** වශයෙන් විසි දෙනෙක් කියන ලදි.

## ☸ දස ස්ත්‍රීන්

1. **මාතුරක්ඛිතා** = මව විසින් කොතැනක වත් යාමට නොදී ආරක්ෂා කරන, අන්‍යයන්ට නො පෙනෙන ලෙස සඟවා රකින, ස්ව කැමැත්තට අනුව කටයුතු කිරීමට නොදී පාලනය කරන, මෙය මෙසේ කරව- මෙය මෙසේ නො කරව යි තම වසඟයෙහි පවත්වන මව විසින් රකින ස්ත්‍රිය යි.
2. **පිතුරක්ඛිතා** = එලෙස ම පියා විසින් රකින ස්ත්‍රිය යි.
3. **මාතුපිතුරක්ඛිතා** = එලෙස මවපිය දෙදෙනා විසින් ම රකිනා ස්ත්‍රිය යි.
4. **භාතුරක්ඛිතා** = එලෙස සොහොයුරා විසින් රකින ස්ත්‍රිය යි.
5. **භගිනිරක්ඛිතා** = එලෙස සොහොයුරිය විසින් රකින ස්ත්‍රිය යි.
6. **ඤාතිරක්ඛිතා** = එලෙස ම ඥාතීන් විසින් රකින ස්ත්‍රිය යි.
7. **ගොත්තරක්ඛිතා** = එලෙස තමා උපන් කුල ගෝත්‍ර සම්ප්‍රදය අනුව රැකෙන ස්ත්‍රිය යි.
8. **ධම්මරක්ඛිතා** = පණ්ඩරංග පරිබ්බාජකයන් මෙන් එක් ශාස්තෘකෙනෙකුන් වෙත පැවිදි වූවන් විසින් හෝ මාලාකාරා දී එක් පිරිසකට අයත් වූවන් විසින් හෝ ආගමික සම්ප්‍රදයන් අනුව රැකෙන ස්ත්‍රිය යි.
9. **සාරක්ඛා** = පුරුෂයෙකු විසින් මැය මගේ යැයි මවුකුසේ වසන කල පටන් වෙන් කරගනු ලැබූ ස්ත්‍රිය හා මැය මගේ යැයි මල් මාලා දැමීමෙන් අයත් කරගනු ලැබූ ස්ත්‍රිය යි. එතැන් පටන් ඇය සස්වාමික ය.

10. **සපරිදණ්ඩා** = රජවරු විසින් මැය ඇසුරු කරන්නාට මෙපමණ දඩ යැයි සෙස්සන්ට තහනම් කරනු ලැබූ ස්ත්‍රිය යි.

## ☸ දස භාර්‍යාවන්

1. **ධනක්කීතා** = මිලයට ගනුලැබූ භාර්‍යාව යි.
2. **ඡන්දවාසිනී** = සිය කැමැත්තෙන් පුරුෂයෙකු හට භාර්‍යාව වන තැනැත්තිය යි.
3. **භොගවාසිනී** = ගෘහ උපකරණ දී භාර්‍යාව බවට පත්කරගත් පසුව භාර්‍යාව වන ස්ත්‍රිය යි.
4. **පටවාසිනී** = අඳින පොරෝනා වස්ත්‍ර මාත්‍රයක් ලැබී භාර්‍යාව බවට පත් දිලිඳු ස්ත්‍රිය යි.
5. **ඔදපත්තකිනී** = දිය බඳුනේ අත් බහා ඒකී භාවයට පත් භාර්‍යාව යි.
6. **ඔභතචුමභටා** = දරදිය ඇදීමට හිසෙහි බැඳි දරඬුව ඉවත් කොට භාර්‍යාව බවට පත්කරගත් ස්ත්‍රිය යි.
7. **දසී ච භරියා** = දසියක්ව සිට භාර්‍යාව බවට පත්කරගත් ස්ත්‍රිය යි. යි.
8. **කම්මකාරී ච භරියා** = කුලියට වැඩ කරමින් සිට භාර්‍යාව බවට පත් ස්ත්‍රිය යි.
9. **ධජාහටා** = ධජ ඔසවා සේනාවත් සමග ගොස් බලහත්කාරයෙන් පැහැර ගෙන විත් භාර්‍යාව බවට පත් ස්ත්‍රිය යි.
10. **මුහුත්තිකා** = තාවකාලිකව සංවාසයට ගනු ලැබූ ස්ත්‍රිය යි.

මෙම දස ස්ත්‍රීන් හා දස භාර්‍යාවන් කරා යන පුරුෂයාට කාමමිථ්‍යාචාරය සිද්ධ වේ. එසේම දස ස්ත්‍රීන්ගෙන් සාරක්ඛා සපරිදණ්ඩා යන දෙදෙනාට ද, දස භාර්‍යාවන්ට ද යන දෙළොස්දෙනාට පර පුරුෂයන් කරා යාමෙන් කාමමිථ්‍යාචාරය සිද්ධ

වේ. එසේම අස්වාමික ස්ත්‍රීන් වෙත යන පුරුෂයන්ට කාමමිථ්‍යාචාරය වේ. එහෙත් එම ස්ත්‍රියට කාමමිථ්‍යාචාරය නොවේ.

අංග සතරක් සම්පූර්ණ වීමෙන් කාමමිථ්‍යාචාරය සිද්ධ වේ. එනම්:-

1. සේවනය නොකළයුතු ස්ත්‍රියක් වීම.
2. සේවන සිත ඇතිවීම.
3. සේවනයට උත්සාහ කිරීම.
4. ආස්වාද සිතින් එය ඉවසීම යන සතරයි.

අනුන් විසින් බලහත්කාරයෙන් සිදු කරවන විටක වුව ද එය ඉවසුවේ නම් වරදට හසු වේ. නො ඉවසුවේ නම් වරදට හසු නොවේ. මෙය ප්‍රාණඝාතාදිය මෙන් අනුන් ලවා නොකළ හැකිය. තම කායික ස්පර්ශයෙන් ආස්වාදය විඳින්නාට ම සිද්ධ වේ.

## ☸ කාමමිථ්‍යාචාරයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

ශීලා දී ගුණ විරහිත ස්ත්‍රී පුරුෂයන් ගේ කාමමිථ්‍යාචාරය අල්ප සාවද්‍ය වේ. එහි ද බලහත්කාරයෙන් යෙදීමෙන් මහා සාවද්‍ය වේ. සීල ගුණ සම්පන්නයන් කෙරෙහි වරදවා පිළිපැදීමෙන් මහා සාවද්‍ය වේ. දෙදෙනාගේ ම කැමැත්ත ඇති කල්හි අල්ප සාවද්‍ය වේ. එසේම ක්ලේශයන් ගේ හා උපක්‍රමයන්ගේ බලය අඩු වීමෙන් අල්ප සාවද්‍ය වේ. අධික වීමෙන් මහා සාවද්‍ය වේ.

## ☸ කාමමිථ්‍යාචාරයෙහි විපාක

කාමමිථ්‍යාචාරයෙහි යෙදෙන්නවුන් කෙලෙස් පිපාසය සන්සිඳවාගත නොහැකි කාම ආතුරයන් බවට පත් වේ. එය බලවත්

වීමෙන් මවු පිය, දූ දරු, ගුරු ශිෂ්‍ය බාල මහලු ආදී වැටහීමක් තැනක් නො තැනක් නො වැටහෙයි. ඔවුහු මෙලොව දී ම නින්දාවට ගර්හාවට හස්ත පාද දඬු මුගුරු ප්‍රහාරයන්ට ලක් වෙයි. සිරේ විලංගුවේ වැටීමට සිදු වෙයි. මරණින් මතු නරකයෙහි ඉපිද අපමණ දුක් විඳීමට සිදු වෙයි.

විශේෂයෙන් කාමමිථ්‍යාචාරයෙහි යෙදුනවුන් කටු ඉඹුල් වන නරකයෙහි උපදිති. එහි යොදුන් හැටක් පමණ දිග පළල වූ යොදුන් ගණන් උස් වූ සොළොස් අඟල් පමණ දික් වූ තියුණු කටු ඇති කටු ඉඹුල් ගස්වලින් පිරුණු වනයකි. කාමමිථ්‍යාචාරයෙහි යෙදුණු ස්ත්‍රී පුරුෂයන් එහි උපන් විට යමපලුන් විසින් දික් වූ තියුණු කටු ඇති දඬුවලින් පහර දී ලේ ගලන ශරීරයන්ගෙන් යුක්තව කටු ඉඹුල් ගස්වල නංවති. ඔවුන් ගසේ නඟින විට ඒ කටු පහළට හැරෙයි. අධික ලෙස දරා ගත නොහැකි දුකින් පීඩිත වූ ඒ ස්ත්‍රී පුරුෂ වූ නිරි සතුන් ගසේ උඩට නැග කෑ ගසති. බිම සිටින නිරි සතුන්ට ඒ හඬ මිහිරි හඬින් කියන ගීත මෙන් ඇසෙයි. එයින් මුසපත් ව රාගයෙන් දැවෙමින් ගස උඩ සිටින ස්ත්‍රී පුරුෂයන් සොයා කටු ඇමිණෙමින් එම ගස්වල නගියි. එවිට උඩ සිටින සත්වයින් ගසේ අනෙක් පසින් බසියි. එවිට එම කටු උඩු අතට හැරෙයි. එම කටු ඇමිණී කය විනිවිද යැමෙන් අපමණ දුකට පත් වෙයි. මෙලෙස අනේක කෝටි වර්ෂ ශත සහස්‍රයක් විපාක අවසන් වන තුරු දුක් විඳියි.

එහි ආයුෂය ගෙවී ගිය පසු ප්‍රේත ව ඉපිද ඉතා විශාල අණ්ඩ කෝෂ ඇතිව දුකසේ ඒවා කර පිට තබා එහා මෙහා ඇවිදිමින් වසර දහස් ගණන් දුක් විඳීමට සිදු වේ. ඉන් පසු තිරිසන් ව ඉපිද ආත්ම දහස් ග නන් වාරවල දී බීජෝත්පාටනාදී දුක්වලට පත් වේ. මෙසේ මහත් වූ විපාක අපාගත ව විඳ අවසන් ව එහි ශේෂ විපාක වශයෙන් ආත්ම දහස් ගණන් වාර නපුංසක ව උපදී. ආත්ම දහස් ගණන් වාර ස්ත්‍රී පුරුෂ නිමිති හරිහැටි නො පිහිටමින් පණ්ඩකව උපදී. ආත්ම දහස් ගණන් වාර ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇතිව උභතෝබ්‍යඤ්ජනකව උපදී. පුරුෂයන් ස්ත්‍රී ව උපදී. ස්ත්‍රීන්ට ස්ත්‍රීභාවයෙන් නො මිදෙයි. විරූපී ශරීර ඇත්තන් වේ. බොහෝ සතුරන් ඇත්තෝ වේ. ලිංගාශ්‍රිත හා අනේක විධ රෝගීහු වේ.

කාමමිථ්‍යාචාරයෙහි බරපතළ කම මෙයින් තේරුම් ගත හැකිය. මෙසේ අපමණ දුක් ගෙන දෙන මහත් වූ අකුශලයක් වන නමුත් ඉඳුරන් පිනවීම උදෙසා ම සත්වයෝ සැමවිටම වෙහෙසෙති. බලාපොරොත්තු වෙති. ප්‍රාර්ථනා කරති. අවිද්‍යාවෙන් මුලා වී තෘෂ්ණාවෙන් බැඳී දිට්ඨියෙන් වෙලී සිටිනා තාක් මෙහි බැරෑරුම් කම නො වැටහෙයි. එයින් නිදහස් වීමට නො සිතයි. ලොවුතුරා බුදු කෙනෙකුන් පහළ නොවන්නට මේ දුක් කෙසේ ජය ගත හැකි වේද?. නොහැකිමය. එබැවින් ලද දුර්ලභ බුද්ධෝත්පාදය, මිනිසත්බව, සද්ධර්මශ්‍රවණය ලද මේ උතුම් මොහොතේ අපමණ දුක් සසර පුරාවට විඳීමට හේතු වූ කෙලෙසුන් ජය ගැනීමට සුසිරිත් පුරුදු කරලීමට, සීල, සමාධි, ප්‍රඥා පූර්ණයට උත්සාහවත් වීම මැනවි.

## ❄ මුසාවාදය

**මුසා**:- යනු, සිදු නොවූ අසත්‍ය වූ දෙයයි. **වාද**:- යනු, එසේ සිදු නොවූ අසත්‍ය වූ දෙය සිදු වූ සත්‍ය වූ දෙයක් වශයෙන් හැඟවීමයි. **මුසාවාද**:- යනු අනුන් රවටන අදහස ඇතිව කීමට ප්‍රථමයෙන් ද, කියන කල්හි ද මුසාවක් කියන්නෙමි යැයි දැන දැනම සිදු වේ. අට ආකාරයකින් මුසාවාදය සිදු වේ. ඒවා මෙසේ ය.

**අදිට්ඨං දිට්ඨං මෙති**= නුදුටු දෙය දුටුවෙමි යැයි ද, **දිට්ඨං අදිට්ඨං මෙති**= දුටු දෙය නුදුටුවෙමි යැයි ද, **අසුතං සුතං මෙති**= නො ඇසූ දෙය ඇසුවෙමි යැයිද, **සුතං අසුතං මෙති**= ඇසූ දෙය නො ඇසුවෙමි යැයි ද, **අමුතං මුතං මෙති**= ගඳ සුවඳ නොවිඳි දෙය වින්දෙමි යැයි ද, රස නොවිඳි දෙය වින්දෙමි යැයි ද, කයෙන් නොවිඳි ස්පර්ශ වින්දෙමි යැයි ද, **මුතං අමුතං මෙති**= ගඳ සුවඳ විඳි දෙය නො වින්දෙමි යැයි ද, විඳි රස නො වින්දෙමි යැයි ද, විඳි ස්පර්ශ නො වින්දෙමි යැයි ද, **අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙති**= සිදු නොවූ දෙය සිදු වූයේ යැයි ද, **විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙති**= සිදු වූ දෙය සිදු නොවූයේයැයි ද මෙසේ අසත්‍ය දෙය සත්‍ය දෙයක් ලෙස ද, සත්‍ය දෙය අසත්‍ය දෙයක් ලෙස ද කීමෙන් හෝ ලිවීමෙන් හෝ හස්තවිකාරාදියකින් හෝ හැඟවීම යි. අංග සතරක් සම්පූර්ණ වීමෙන්

මුසාවාදය සිදු වේ. එනම්:-

1. කියන කරුණ මුසාවක් වීම,
2. අනුන් රවටන අදහස,
3. වචනයෙන් හෝ ලිවීමෙන් හෝ හස්තවිකාරාදියකින් උත්සාහ කිරීම,
4. අසන තැනැත්තා එය පිළිගැනීම ය.

කියන දෙය බොරුවක් වුව ද, නො දන්න භාෂාවකින් කීමෙන් ද, කලබල වීමකින් හෝ නො සිතා යමක් කියන විටෙක දී මුසාවක් කියවුණු කල්හි ද එයින් මුසාවාද කර්‍මය සිදු නොවේ. යමක් කී කල්හි අසන්නා එය තේරුම් නො ගැනීමෙන් ද මුසාවාද සිදු නොවේ. ඉටු කිරීමේ අදහසින් යමක් කිරීමට පොරොන්දු වී එය කිරීමට නොහැකි වීමෙන් ද මුසාවාදය සිදු නොවේ. සිදු නොකරන අදහසින් ම බාරගත්තහුට එකෙනෙහි ම මුසාවාදය සිදු වේ. ඒ දෙය පසුව කරන ලද්දේ නමුත් වරදින් නො මිදෙයි. එසේම අනුන් ලවා බොරු කියවීමේ දී කියන කියවන දෙදෙනාම බොරු කීමේ චේතනාව ඇතහොත් දෙදෙනාට ම පාපය සිද්ධ වේ. වෙළඳම් කිරීමාදියෙහි දී අසත්‍ය දේවල් දැන්වීම් පලකිරීමාදී ක්‍රමවලින් ඉදිරිපත් කිරීමෙන් ඒවා පවතිනා තාක් කියවා බලා රැවටෙන අයගේ ගණනින් ඒවා කළවුන්ට මුසාවාදය අකුසල කර්‍ම රැස් වේ.

## ☸ මුසාවාදයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය.

තමා සතුව දීමට තරම් දෙයක් නැති විට නොදෙන අදහසින් බොරු කීම අල්ප සාවද්‍ය වේ. දීමට ප්‍රණීත දෙයක් ඇති විට නොදෙන අදහසින් බොරු කීම මහා සාවද්‍ය වේ. එසේම සත ගණනක් වැනි කුඩා දෙයක් වෙනුවෙන් බොරු කීම අල්ප සාවද්‍ය වේ. සැලකිය යුතු වටිනාකමක් ඇති දෙයක් වෙනුවෙන් බොරු කීම මහා සාවද්‍ය වේ. අගය කළ නොහැකි මහත් වටිනාකම් ඇති දේ වෙනුවෙන් බොරු කීම අතිශයින් ම මහා සාවද්‍ය වේ. අවම වූ සීලයෙන් ගුණයෙන් යුක්ත වූවන් බොරු කියා රැවටීම අල්ප සාවද්‍ය වේ. තිසරණ ගත උපාසකයා ගේ පටන් සීලයෙන් ගුණයෙන් උසස්

වූවත් බොරු කියා රැවටීම මහා සාවද්‍ය වේ. ක්‍රීඩා පිණිස අනුන් රවටන අදහසින් කරන කියන දේ වලින් අල්ප සාවද්‍ය කර්ම රැස් වේ. අන්‍යයන් රැවටීමට කරන ප්‍රයෝගයන්හි දී සිතෙහි කෙලෙසුන් අඩුව යෙදුණු කල්හි කර්මය අල්ප සාවද්‍ය වේ. වැඩියෙන් යෙදීම අනුව එහි මහා සාවද්‍ය භාවය වැඩි වේ.

## ☸ මුසාවාදයෙහි විපාක

බොරු කියන්නා මෙලොව දීම නින්දවට අපහාසයට පිළිකුලට ලක් වේ. අන්‍යයන්ගෙන් පහර කෑමට ද රාජ දණ්ඩනාදී දඬුවම් විඳීමට ද සිදු වේ. තම මවපිය ගුරුවර ඥාත්‍යාදීන්ගේ ද අන්‍යයන්ගේ ද අවිශ්වාසයට ලක් වන්නෙක් වේ.

මරණින් මතු අවීචි මහ නරකයෙහි ඉපිද අප්‍රමාණ කාලයක් අනේක විධ දුක් විඳීමට සිදු වේ. එහි ඇති අධික තේජසින් යුත් ගින්නෙන් අතරක් නැර පිලිස්සෙයි. යමපලුන් විසින් ගිනි ගෙන දිලිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අතරක් නැර අප්‍රමාණ දුක් දෙති. නළයක අබ පිරෙව්වා සේ අබ රේණුවක් තරම් දෙයක් බිමට නො වැටෙන ලෙස සත්වයන්ගෙන් පිරී පවතී. එහෙත් එක් සත්වයෙකුට දුක් විඳින තව සතෙක් නො පෙණෙයි. මෙහි උපන් සත්වයන් අනේක කෝටි වර්ෂ ශත සහස්‍රයක් පැසෙති. බොහෝ කලකට පසු නරකයෙහි නැගෙනහිර දිසාවේ දොරටුව විවෘතව වෙයි. එය දුටු නිරි සතුන් ඒ විඳින දුකෙන් ගැලවෙනු කැමති ව එහි දුවත්. ඒ යන අතර දී යමපලුන් විසින් ගිනි ගෙන දිලිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අප්‍රමාණ දුක් දෙති. දොරටුව වෙත ළඟා වෙන විට අපගේ වර්ෂ දහසක කාලයක් ගත වෙයි. ළංවත් ම දොර වැසෙයි. තවත් බොහෝ කලකට පසු දකුණු දෙස,... බටහිර දෙස,... උතුරු දෙස දොරටුව විවෘත වෙයි. එය දුටු නිරි සතුන් ඒ විඳින දුකෙන් ගැලවෙනු කැමති ව එහි දුවත්. ඒ යන අතර දී යමපලුන් විසින් ගිනි ගෙන දිලිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අප්‍රමාණ දුක් දෙති. දොරටුව වෙත ළඟා වෙන විට අපගේ වර්ෂ දහසක කාලයක් ගත වෙයි. ළංවත් ම දොර වැසෙයි. මෙසේ රැවටෙමින්

බොහෝ කල් දුක් විඳිති. මෙපමණ කල් දුක්ම විඳි නමුත් බඩගිනි පිපාසා නිවා ගැනීමට බත් ඇටයක් තරම් අහරක් වත් දිය බිඳක් තරම් වත් පානයක් ලැබී නැත. මෙසේ බඩගිනි පිපාසා දුකින් යුක්තව රුදුරු වූ අප්‍රමාණ දුක් විඳින නිරි සතුන් වෙත යමපලුන් පැමිණ නුඹට අවශ්‍ය මොනවා දැයි අසයි. නිරි සතා "ස්වාමීනි, මට බඩගිනියි. අහරක් ලැබෙන්නේ නම් හොඳයි කියයි." එවිට යමපල්ලන් ගිනි ගෙන දිලිසෙන ලෝහ ගුලි රැගෙන එයි. තමන්ට ලෝහ ගුලි ගිල්ලවන්නට සූදානම් වන බව දැන නිරි සතා කට පියා දත්වලින් තද කර ගනී. කට අරින්නට කී විට නො අරියි. එවිට යමපල්ලන් නිරි සතා දැඩිව අල්ලා ගෙන අඬු ආදියෙන් බලෙන් කට විවර කොට ලෝහ ගුලි ගිල්ලවයි. එයින් නිරිසතු ගේ කටත් ද ගෙන උගුරත් ද ගෙන පපුවත් ද ගෙන බඩවැල් ආදී සියල්ල ද ගෙන ගොස් අධෝ මාර්ගයෙන් පිටවී යයි. මෙසේ තවත් බොහෝ කලකට පසු යමපලුන් නුඹට අවශ්‍ය මොනවා දැයි අසයි. එවිට නිරිසතු "ස්වාමීනි මට පිපාසයි. බීමට පානයක් ලැබෙයි නම් හොඳයි කියයි." එවිට යමපල්ලන් ගිනි ගෙන දිලිසෙන ලෝදිය රැගෙන එයි. තමන්ට ලෝදිය පොවන්නට සූදානම් වන බව දැන නිරි සතා කට පියා දත්වලින් තද කර ගනී. කට අරින්නට කී විට නො අරියි. එවිට යමපල්ලන් නිරි සතා දැඩිව අල්ලා ගෙන අඬු ආදියෙන් බලෙන් කට විවර කොට ලෝදිය පොවයි. එයින් නිරිසතු ගේ කටත් ද ගෙන උගුරත් ද ගෙන පපුවත් ද ගෙන බඩවැල් ආදී සියල්ල ද ගෙන ගොස් අධෝ මාර්ගයෙන් පිටවී යයි." මෙලෙස මුසාවාදය හේතුවෙන් නරකයෙහි වැටී අප්‍රමාණ දුක් විඳීමට සිදු වේ.

ඉන් පසු ප්‍රේත ව ඉපිද අනේක වර්ෂ ශත සහස්‍රයෙහි අප්‍රමාණ දුක් විඳීමට සිදු වේ. එයින් චුතව තිරිසන් ව ඉපිද අප්‍රමාණ කාලයක් දුක් විඳීමට සිදු වේ.

මෙසේ මහත් වූ විපාක වාර අපාගත ව විඳ එයින් චුතව මිනිසත් බව ලැබූ කල්හි එම අකුසලයන්ගේ ශේෂ විපාක වශයෙන් සිය දහස් ගණන් ජාතිවල දී නොකළ වැරදිවලට හසුව නින්දා අපහාසයන්ට ලක් වේ. දඬුවම් විඳීමට සිදු වේ. අනුවණයන් වේ. දුප්පතුන් වේ. ගොත ගසමින් කථා කරන්නන් වේ. ගොළුවන් වේ. කට ගඳ ගසන්නන් වේ. අශෝභන දත් ඇත්තන් වේ. මුඛ රෝග, දත්

රෝග ඇත්තන් වේ. කල් නො පවත්නා දත් ඇත්තන් වේ. විරූප වූ ශරීර වර්ණය ඇත්තන් වේ. නිවෙසක හෝ ගමක හෝ රැකියා ආයතනයක හෝ රටක හෝ නායකත්වයට පත් වූයේ නමුත් අන්‍යයන් ඔහුගේ කීම නො අසයි. ඔහු අබිබවා යති. දරුවන් නො ලබන්නන් වේ. උපදින්නේ නම් ගැහැනු දරුවන් උපදිති. ඔවුහු ද අකීකරු දරුවෝ වෙති.

බොරු කියන්නාට නොකළ හැකි පාපයක් නැත. බොරුව බොහෝ අකුසලයන්ට මුල් වන බලවත් පාපයක් වේ. නිවනට යන මාර්ගය සත්‍ය පදනම් කර ගත් එකකි. එයට බාධක ධර්ම අතර අසත්‍ය වූ බොරුව ම බලවත් වේ. එබැවින් එයින් වැළකී සත්‍යවාදී ව කටයුතුවල යෙදීමෙන් තමන්ටත් අන්‍යයන්ටත් සියලු යහපත උදා කර ගැනීමට හැකි වනවා ඇත.

## ❄ සුරාපානය

**සුරා:-** යනු, පිටි ආදියෙන් සාද පෙරා ගන්නා ලද මද්‍ය වර්ගයෝ ය. ඒවා **පිට්ඨසුරා, පූවසුරා, ඕදනීයසුරා, කිණ්ණපක්ඛිත්තසුරා, සම්භාරසංයුත්තසුරා** යැයි වර්ග පසක් වෙති.

පිටි භාජනයක දමා ප්‍රමාණවත් ලෙස ජලය වත් කොට කලතා පසුව පෙරා ගන්නා ලද්ද **පිට්ඨසුරා** නම් වේ. **පුව** යනු කැවුම් ආදී කැවිලි වර්ගයන්ට නමකි. එබඳු කැවිලි වර්ග භාජනයක දමා ප්‍රමාණවත් ලෙස ජලය වත් කොට කලතා පසුව පෙරා ගන්නා ලද්ද **පූවසුරා** නම් වේ. **ඔදන** යනු බත් ය. බත් හා ධාන්‍ය වර්ගවලින් පෙර සේම පෙරා ගන්නා ලද්ද **ඕදනීයසුරා** නම් වේ. සුරා බීජ හෙවත් මණ්ඩි බහා පෙරාගන්නා ලද්ද **කිණ්ණපක්ඛිත්තසුරා** නම් වේ. මයිල මල්, අබ ආදී නොයෙක් දේ මිශ්‍ර කොට කලතා පැසුණු පසු පෙරා ගන්නා ලද්ද **සම්භාරසංයුත්තසුරා** නම් වේ.

පල් කරන ලද දෙයින් සකසන ලද ආශ්‍රව වර්ග **මේරය** නම් වේ. එය **පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුලාසව, සම්භාරසංයුත්ත**

යැයි පඤ්ච විධ වේ. මී තෙල් පොල් මල් ආදී මල් වර්ගවල යුෂ ගෙන කිහිප දවසක් පල් කොට එයින් ගත් සාරය **පුප්ඵාසව** නම් වේ. වැල වරකා දී පල වර්ගවල යුෂ පල් කොට එයින් ගත් සාරය **ඵලාසව** නම් වේ. මිදි යුෂ ආදිය ගෙන පල් කොට එයින් ගන්නා ලද්ද හා මී පැණි ආදියෙන් කරන ලද්ද **මධ්වාසව** නම් වේ. උක් පැණිවලින් හා හකුරු ආදියෙන් කරන ලද්ද **ගුලාසව** නම් වේ. අරළු බුලු නෙල්ලි කුළුබඩු ආදී බොහෝ දෑ මිශ්‍ර ව ගෙන දියෙහි කලතා පල් කොට එයින් ගත් සාරය **සම්භාරසංයුක්ත** නම් වේ. මෙම ආශ්‍රව නාමයට අයත් වර්ග පැසෙනු පිණිස සැළියෙහි බහාලූ තැන් පටන් පානය කිරීම සුරා පානයට අයත් වේ.

මේ කියන ලද සුරා හා මේරය යන දෙකම පානය කළවුන් මත් කරවන බැවින් **මජ්ජ** නම් වේ. තවද වර්තමානයෙහි ඇති අරක්කු වර්ග, දුම්වැටි වශයෙන් පානය කරන කංස වැනි දෑ ද මත් වීමට හේතුවන ආහාර වර්ග ද **මජ්ජ** සංඛ්‍යාවෙන් ගැනෙයි. ආස්වාදයක් විඳීමේ චේතනාවෙන් පානය කරන බැවින් කුසල සිත පිරිහී ගොස් අකුසල් සිත බලවත් ව සසරෙහි පමා කරවන බැවින් **පමාදට්ඨානා** නම් වේ. මෙසේ මදයට හා ප්‍රමාදයට හේතුවන දෙයින් වැළකීම **වෙරමණී** නම් වේ.

සුරාව හා මේරය ස්වල්පයක් පානය කිරීම අල්ප සාවද්‍ය වේ. වැඩියෙන් පානය කිරීම මහා සාවද්‍ය වේ. කාය බලය ලැබීමට මහත් කොට පානය කොට ගම් පැහැරීම් ආදිය කරන්නාට අතිශයින් බලවත් වූ මහා සාවද්‍ය කර්ම රැස් වේ.

## ☸ සුරාපානයෙහි ආදීනව

සුරාපානය වනාහි මෙලොව පරලොව නසන්නා වූ මහත් අනර්ථකර ක්‍රියාවකි. සුරාවෙන් මත් වූ විට උන්මත්තකයන් මෙන් වෙයි. ස්වකීය සිත කය පාලනය කර ගැනීමට නොහැකි වෙයි. මව්පියන් වැඩිහිටියන් නො හඳුනන පිරිස් ඉදිරියෙහි නො හොබිනා ලෙස හැසිරෙන හිරි ඔත්තප්ප ගුණ නැත්තෙක් වේ.

බුදුරජාණන් වහන්සේ වැඩසිටි දවස කොසැඹෑ නුවර සාගත නම් පඤ්ච අභිඥා ලාභී කීර්තිමත් තෙරුන් වහන්සේ නමක් සිටියේ ය. ඒ කාල පරිච්ඡේදයෙහි අම්බතිත්ථ නම් ජටිලයාගේ අසපුවෙහි සෘද්ධිමත් දරුණු නාගයෙක් සිටියේ ය. තෙරුන් වහන්සේ වැඩ එම නාගයා තම සෘද්ධි බලයෙන් දමනය කළේ ය. එයින් සතුටු වූ මිනිස්සු තෙරුන් වහන්සේට මඟ දිගට ම රැඳී සිට කාපොතිකා නම් සුරාවක් පූජා කළහ. ඒ වන විට සුරාව පිළිබඳ සිකපද පනවා නො තිබුණු බැවින් ද පානය කිරීමෙන් වන හානි නොදත් බැවින් ද තෙරණුවෝ මිනිසුන් කෙරෙහි මෛත්‍රියෙන් ඒවා පානය කළේ ය. එයින් මත් වී ටික දුරක් ගොස් නගර ද්වාරයෙහි වැටුණේ ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පිරිවරා වඩින විට මත් වී වැටී සිටි තෙරුන් දැක භික්ෂූන් අමතා සාගත තෙරුන් ඔසවා ගෙන එන ලෙස වදාළහ. භික්ෂූහු තෙරුන් ඔසවා ගෙන විත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි භාග්‍යවතුන් වහන්සේ දෙසට හිස සිටින සේ බිම තැබූහ. තෙරණුවෝ සිහි විකල් ව කැරකී භාග්‍යවතුන් වහන්සේ දෙසට පා සිටින සේ සිටියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මේ සාගත භික්ෂුව තථාගතයන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් යහපත් පැවැත්මෙන් සිටියෙහි ද?" යැයි අසා වදාළ සේක. "එසේය ස්වාමීනි" යැයි භික්ෂූහු පිළිවදන් දුන්හ. "දැනුත් සාගත තෙරුන් එසේම ද?" යැයි අසා වදාළ සේක. "නැත ස්වාමීනි" යැයි භික්ෂූහු පිළිවදන් දුන්හ. "මහණෙනි මේ සාගත තෙරුන් අම්බතීර්ථයෙහි නාගයත් සමග සංග්‍රාමයක් කොට පැමිණියේ නොවේ ද?"යි අසා වදාළ සේක. "එසේය ස්වාමීනි" භික්ෂූහු පිළිවදන් දුන්හ. "සාගත තෙරුන්ට දැනුත් එසේ කළ හැකි ද?" යැයි අසා වදාළ සේක. "නොහැකිය ස්වාමීනි" භික්ෂූහු පිළිවදන් දුන්හ. මහණෙනි මෙය නොගැළපෙන දෙයකි යැයි එහි ආදීනව දක්වා භික්ෂූන්ට සුරා පානයෙන් වැළකීමට සිකපදයක් පනවා වදාළ සේක.

සුරාවට පුරුදු වූවන් ඒ වෙනුවෙන් ධනය විනාශ කරයි. අඹු දරුවන්ට පහර දෙයි. දුටු දුටුවන් සමග කලහ කරයි. භාණ්ඩ උපකරණ විනාශ කරයි. මහා ධනවතුන් ව සිට දිළින්දන් බවට පත් වේ. ඉන් පසු සොරුන්, මංකොල්ල කරුවන්, ගෙවල් බිඳින්නන් බවට පත් වේ. ඒවාට වරදකරුවන් වී දඬුවමට ලක් වේ. සිර ගෙවල්වල දුකසේ විසීමට සිදු වේ. නොයෙක් රෝග ව්‍යසනයන්ට ගොදුරු වී

අකාලයෙහි මිය යාමට සිදු වේ. විකෘති සිතින් මියගොස් නරකයෙහි උපදිති. එහි අනේක වර්‍ෂ කෝටි ශත සහස්‍රයක් පැසී ඉන් ච්‍යුතව ප්‍රේත ව උපදිති. එහි ද බොහෝ කලක් දුක් විඳ එයින් ච්‍යුතව තිරිසන් ව උපදිති. එහි දී ද බොහෝ කලක් දුක් විඳ මනුලොව උපදින විට මන්ද බුද්ධිකයන්ව උපදිති. උමතු බවට ද පත් වේ. නොයෙක් ජාතිවල විරූප වූ ශරීර ඇත්තන් වේ.

උතුම් බුද්ධෝත්පාදය, සද්ධර්‍මශ්‍රවණය, කල්‍යාණමිත්‍ර ඇසුර සැම කල්හි හමු වන්නේ නොවේ. ඒ සියල්ල ලැබී ඇති විටෙක මන්ද බුද්ධිකයන් හෝ සිහි විකල් වූවන් වුවහොත් කොතරම් අභාග්‍යයක් ද?. වත්මන් ලෝකය අධර්‍මයෙන් දුසිරිතෙන් පිරී ගොස් ඇත. එවන් කලෙක අධර්‍මයෙන් දුසිරිතෙන් වැළකී සියලු සසර දුකින් නිදහස් වීමට අවස්ථාව බුද්ධෝත්පාදය, සද්ධර්‍මශ්‍රවණය, කල්‍යාණමිත්‍ර ඇසුර තුලින් හමුව ඇත. එබැවින් මේ උතුම් මොහොත අත් නො හැර යහපත් පැවැත්මෙන් යුත් ශික්‍ෂාකාමී දිවි පෙවෙතක් ගොඩනගා ගැනීමට අධිෂ්ඨාන කර ගත යුතුය.

# 8. පන්සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස

සිල් රැකීමේ ආනිශංස බොහෝ ය. සීලානිශංස එලෙස ම ලැබීමට නම් මනාකොට සිල් රැකිය යුතු වේ. උසස් ලෙස පන්සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස අනූ දෙකක් බුද්දකපාඨ හා ඉතිවුත්තක අට්ඨකථාවන්හි දක්වේ. ඒවා මෙසේ ය.

## ❄ සත්ව ඝාතනයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. ආරෝහපරිණාහසම්පත්තියෙන් යුක්ත වීම.

2. ජව සම්පත්තියෙන් යුක්ත වීම.

3. මනාව පොළොවෙහි පිහිටන සම වූ පතුල් ඇත්තෙකු වීම.
4. රන්වන් පාට සිරුරක් ඇත්තෙකු වීම.
5. මෘදු මොලොක් සිරුරක් ඇත්තෙකු වීම.
6. නිර්මල පිරිසිදු පැවතුම් ඇත්තෙකු වීම.
7. සූර වීර ගති ඇත්තෙකු වීම.
8. මහා බලවතෙකු වීම.
9. නො පැකිළ කිව හැකි වචන ඇත්තෙකු වීම.
10. ලෝ සතුන්ට ප්‍රිය මනාප පුද්ගලයකු වීම.
11. අන්‍යයන්ගේ දෝෂ දර්ශනයට ලක් නොවන කටයුතු ඇත්තෙකු වීම.
12. අන්‍යයන්ට කේලාම් කියා බිඳවිය නො හැකි පරිවාර සම්පත්තියක් ලැබීම.
13. බිය තැති ගැනීම් නැත්තෙකු වීම.
14. පරෝපක්‍රමවලින් විනාශ නොකළ හැකි කෙනෙකු වීම.
15. පරෝපක්‍රමයන්ගෙන් අකල් මරණයට පත් නොවන බව.
16. බොහෝ පිරිවර ඇත්තෙකු වීම.
17. සුරූපී පුද්ගලයෙකු වීම.
18. මනා සටහන් (හැඩහුරුකම) ඇත්තෙකු වීම.
19. අල්ප ආබාධ ඇත්තෙකු වීම.
20. ශෝක නොකරන්නෙකු වීම.
21. ප්‍රියයන්ගෙන් වෙන් නො වන්නෙකු බව.
22. දීර්ඝායුෂ ලබන බව.
23. මනාව පිහිටි අඟපසඟ ඇති බව. මේ ආදී තවත් බොහෝ

ආනිශංස ලැබෙන බව කියා ඇත.

## ❄ සොරකමෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. මහා ධනවතෙකු වීම.
2. බොහෝ ධන ධාන්‍ය ලබන්නෙකු වීම.
3. අනන්ත භෝග සම්පත් ඇත්තෙකු වීම.
4. නූපන් වස්තුව ඉපදවීමට පුණ්‍ය ශක්තිය ඇත්තෙකු වීම.
5. ඇත්තා වූ භෝග රැක ගැනීමේ වාසනාව ඇති බව.
6. කැමති වස්තූන් වහා ලබන්නෙකු වන බව.
7. ගිනි ජල ආදියෙන් විනාශ නොවන රජ සොර ආදීන්ට සාධාරණ නොවූ විනාශ කළ නො හැකි වස්තුව ඇති බව.
8. අන්‍යයන්ට නො ලැබිය හැකි ධන සම්පත් ලැබීමේ වාසනා ඇත්තෙකු බව.
9. ලෝකයෙහි උත්තම පුද්ගලයකු වන බව.
10. නැත යන වචනය අසන්නට වත් නො ලැබෙන්නකු වන බව.
11. සැප විහරණ ඇත්තෙකු වන බව ආදී තව බොහෝ ආනිශංස ලැබෙන්නේ ය.

## ❄ කාමමිථ්‍යාචාරයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. සතුරන් නැත්තෙකු බව.
2. සියළු ජනයාට ම ප්‍රියයෙකු වන බව.

3. ආහාර පාන ඇඳුම් පැලඳුම් ඉදුම් හිටුම් ආදිය සුවසේ ලබන්නෙකු වන බව.

4. සැපසේ නිදන බව.

5. සැපසේ පිබිදෙන බව.

6. අපා භය නැත්තෙකු වන බව.

7. ස්ත්‍රීභාවයක් ලැබූ කලකවත් පණ්ඩක, නපුංසක, උභතෝබ්‍යංජනක ආදී අභව්‍යත්වයකට පත් නොවන බව.

8. ක්‍රෝධ අඩු පුද්ගලයෙකු වීම.

9. සෑම දෙයක් ම පරීක්‍ෂා කොට බලා කරන බව.

10. උසස් වූ කායික, වාචසික, මානසික කටයුතු ඇත්තෙකු බව.

11. සැක බිය නිසා බිම බලා නො සිටින්නෙකු බව.

12. ඔවුනොවුන්ට ප්‍රිය වූ අඹුසැමියන් ලබන බව,

13. පිරිපුන් ඉඳුරන් ඇත්තෙකු වීම.

14. පිරිපුන් දේහ ලක්‍ෂණ ඇත්තෙකු වන බව.

15. සැක ශාංකා නැත්තෙකු බව.

16. වෙහෙස නොවී ධනය ලබන බව.

17. සුව සේ වෙසෙන බව.

18. කිසි තැනක බිය නො වන්නෙකු බව.

19. ප්‍රියයන්ගෙන් වෙන් නො වන්නෙකු වන බව ආදී තව බොහෝ ආනිශංස ලැබෙන්නේ ය.

## ❈ මුසාවාදයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. අතිශයින් ප්‍රසන්න ඉඳුරන් ඇත්තෙකු වීම.
2. මිහිරි කටහඬ ඇත්තෙකු වීම.
3. සමානව පිහිටි සුදු වන් දත් දෙපලක් ලැබෙන බව.
4. අශෝභන වූ මහත් ශරීර නො ලබන්නෙකු බව.
5. අශෝභන වූ කෙට්ටු ශරීර නො ලබන්නෙකු බව.
6. අශෝභන වූ උස ශරීර නො ලබන්නෙකු බව.
7. අශෝභන වූ මිටි ශරීර නො ලබන්නෙකු බව.
8. සැප දයක වූ (රූප, ශබ්ද, ගන්ධ, රස, සුව පහසුව ඇති ඇඳ පුටු ආදිය) ස්පර්ශයන් ලබන්නෙකු බව.
9. දුගඳ නැති මානෙල් මල් සුවඳ විහිදෙන මුඛයක් ලැබීම.
10. සුවච කීකරු පිරිවර ඇත්තෙකු වීම.
11. විශ්වාස කළ යුතු වචන ඇත්තෙකු වීම.
12. නෙළුම් පෙත්තක් බඳු වූ රතු වන් මෘදු දිවක් ලබන්නෙකු වීම.
13. උඩඟු නොවන බව.
14. චපල වචන හා ක්‍රියා නැත්තෙකු වීම ආදී තව බොහෝ ආනිශංස ලැබෙන්නේ ය.

## ❈ සුරාපානයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. අතීත අනාගත වර්තමාන යන තුන් කාලය පිළිබඳ වහා වැටහීම ඇති නුවණින් සියලු කටයුතු කළ හැකි වීම.
2. සැම කල්හි සිහිය පිහිටුවා ගෙන කටයුතු කළ හැකි වීම.

3. උමතු නොවී ඉපදීම.
4. ඥානවන්තයෙකු වීම.
5. අලස නො වන්නෙකු වීම.
6. ජඩ හෙවත් නො හික්මුණු ගති නැත්තෙකු වීම.
7. කෙලතොලු නොවීම.
8. තරුණ මඳ ආදියෙන් මත් නො වන්නෙකු බව.
9. අප්‍රමාදී ව කටයුතු කරන්නෙකු වීම.
10. මෝහයෙන් මුලා නො වන්නෙකු වීම.
11. තැති ගැනීම් නැත්තෙකු වීම.
12. එකට එක නො කරන්නෙකු වීම.
13. ඊර්ෂ්‍යා නො කරන්නෙකු වීම.
14. සත්‍යවාදීයෙකු වීම.
15. කේලාම් හිස් වචන පරුෂ වචන කථා නොකරන්නෙකු වීම.
16. දිවා රෑ අලස නොවී කටයුතු කරන්නෙකු වීම.
17. කළ ගුණ දන්නෙකු වීම.
18. කළ උපකාරයන්ට ප්‍රත්‍යුපකාර කරන්නෙකු වීම.
19. මසුරුමල නැත්තෙකු වීම.
20. ත්‍යාගවන්තයෙකු වීම.
21. මහා සිල්වතෙකු වීම.
22. ඍජු වූ ගති පැවතුම් ඇත්තෙකු වීම.
23. ක්‍රෝධ නොකරන සත්පුරුෂයෙකු වීම.
24. පව් කිරීමට ලැජ්ජාසීලී වූ ගුණවතෙකු වීම.

25. පව් කිරීමට බිය ඇත්තෙකු වීම.

26. ඍජු අදහස් ඇත්තෙකු වීම.

27. මහා ප්‍රඥාවන්තයෙකු වීම.

28. මහා චිත්ත බලයක් ඇත්තෙකු වීම.

29. දාර්ශනික අදහස් ඇත්තෙකු වීම.

30. අර්ථානර්ථ වැටහෙන හසල බුද්ධිමතෙකු වීම. මේ ආදී තව බොහෝ ආනිශංස ලබන්නේ ය.

තව ද අංගුත්තර නිකාය අට්ඨක නිපාතයේ අභිසන්ද සූත්‍රයෙහි රත්නත්‍රය සරණගතව පන්සිල් රැකීමෙන් සැප ගෙන දෙන ධර්ම අටක් බව දක්වේ. එය මෙසේ ය.

මහණෙනි, පින් ගලා එන, කුසල් ගලා එන, සැප ගෙන දෙන, ස්වර්ගයෙහි ඉපදීම පිණිස පවතින, ස්වර්ග සැප පිණිස පවතින, කැමති දේ ලබා දෙන, ප්‍රිය දේ ලබා දෙන, මනාප දෙය ලාබ දෙන, යහපත පිණිස, සැපය පිණිස හිත පිණිස පවතින ධර්ම අටකි.

බුදු රජාණන් වහන්සේ සරණ යාම, ධර්මය සරණ යාම, සංඝයා සරණ යාම, ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමෙන් වැළකීම, කාමමිථ්‍යාචාරයෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, සුරා පානයෙන් වැළකීම යන අටයි. මෙසේ පන්සිල් රැකීම අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙහිම බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා විසින් ද, සිල්වතුන් ගුණවතුන් නැණවතුන් විසින් බැහැර නොකරන ලද ගර්හා නොකරන ලද්දකි. එසේම පන්සිල් රැකීම මහා දාන පසක් දීමකි.

ආර්යය ශ්‍රාවකයා ප්‍රාණඝාතයෙන් වැළකුණේ වේ. මෙසේ ප්‍රාණඝාතයෙන් වැළකීම අප්‍රමාණ සත්වයන්ට ජීවිත දානය දෙයි. අවෛරය දෙයි. නිදුක් බව දෙයි. ඔහු අප්‍රමාණ සත්වයන්ට අභය දී, අවෛරය දී, නිදුක් බව දී ඒ හේතුවෙන් අප්‍රමාණ අභයට, අවෛරයට, නිදුක් බවට හිමිකරුවෙක් වෙයි. සොරකමෙන් වැළකුණේ වේ. පෙ...

කාමමිථ්‍යාචාරයෙන් වැළකුණේ වේ. පෙ... බොරු කීමෙන් වැළකුණේ වේ. පෙ... සුරා පානයෙන් වැළකුණේ වේ. මෙසේ සුරා පානයෙන් වැළකීම අප්‍රමාණ සත්වයන්ට ජීවිත දනය දෙයි. අවෛරය දෙයි. නිදුක් බව දෙයි. ඔහු අප්‍රමාණ සත්වයන්ට අභය දී, අවෛරය දී, නිදුක් බව දී ඒ හේතුවෙන් අප්‍රමාණ අභයට, අවෛරයට, නිදුක් බවට හිමිකරුවෙක් වෙයි.

තව ද සීල් රැකීමෙහි අනුසස් ථෙර ගාථා පාලියේ සීලව ථෙරගාථාවන්හි මෙසේ කියවෙයි.

මේ ලෝකයෙහි අභිවෘද්ධිය කැමති තැනැත්තා චාරිත්‍ර වාරිත්‍ර සීලයම රක්නේ ය. රක්නා ලද සීලය ඔහුට සකල සම්පත්තියම ගෙන දෙන්නේ ය. ප්‍රසංසාව, සතුට, දෙව්ලොව සතුටු වීම යන කරුණු තුන ප්‍රාර්ථනා කරන්නා සීලය රක්නේ ය. සීලයෙන් හික්මුණු තැනැත්තා බොහෝ මිත්‍රයන් ලබන්නේ ය. දුස්සීලයා ගේ පව් කම් නිසා මිත්‍රයන් ඔහුගෙන් ඈත් වන්නේ ය. දුසිල්වතා ඉදිරියෙහි ගර්හාව අපකීර්තිය ඇතිවෙයි. සිල්වතා ඉදිරියෙහි කීර්තිය ප්‍රශංසාව ගුණ වර්ණනාව සැම කල්හි ඇතිවෙයි. සීලය සියලු කුසලයන්ට මුල ය. ධ්‍යානා දී උත්තරිමනුෂ්‍ය ධර්මයන් ලැබීමට ඇති පිහිට ය. සීලය සමථ විදර්ශනා වැඩීමට පිහිටවන මව ය. සියලු යහපතෙහි මුල ය. සීල සංවරය දුසිරිත් සංඛ්‍යාත ජලස්කන්ධය නවත්වන වෙරළ ය. සතුටු වීමට සීලය හැර අන් දෙයක් නැත. සියලු බුදුරජාණන් වහන්සේලා නිර්වාණය නමැති සයුරට බසින තොට ය. සීලය මාර සේනාව මර්ධනය කරන අසදෘශ බල සේනාව ය. කෙලෙසුන් සිඳින උතුම් ආයුධය ය. පලඳින ආභරණයන්ගෙන් උසස් ම ආභරණය ය. කෙලෙස් යුද්ධය පිණිස අද්භූත වූ සන්නාහකය ය. සීලය සසර සයුරෙන් එතර වීමට ඇති මහානුභාව සම්පන්න ඒ දණ්ඩ ය. පහල වායු තලයේ පමණක් විහිදෙන මල් සඳුන් ආදියෙහි සුවඳ අබිබවා දෙව්ලොව බඹලොව දක්වා විහිදෙන එකම සුවඳ ය. ඇඟ ගල්වන සුවඳ අතර සීලය හා සම විලවුනක් නැත. සීලය සංසාර කාන්තාරයෙහි ගමන් කරන්නාට ගෙන යා හැකි පිළුණු නොවන නොනැසෙන ආහාරයකි. උවමනා දේ ලබා දෙන සොර සතුරන්ට පැහැර ගත නොහැකි උසස් මාර්ගෝපකරණයකි. කිසි අනතුරකට ලක් නොවන කැමති දිශාවකට යා හැකි උතුම් යානයකි. සීලයෙහි නො පිහිටි අඥනයා මෙලොව ද

නින්ද ලබා මරණින් මතු අපාගත ව කනගාටු වේ. සැම තැන දුකින් වසයි. සිල් රක්නා වූ නුවණැත්තා මෙලොව ද කීර්තියට පත්ව මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද සතුටු වේ. සැම තැන්හිම සතුට ලබන්නේ ය. නොයෙක් ලෞකික සැප ද නිවන ද ලබා දෙන සීලය ද නුවණ ද උතුම් ය. සීලයත් නුවණත් ඇති නම් සියලු තැන ජය ලැබිය හැක. එබැවින් මනා ගෞරවයෙන් සිල් රැකීමෙන් ම සීල පාරමිතාව සම්පූර්ණ වන බව දැන සිල් පිරිය යුතු ය.

## 9. උපාසකත්වය

උපාසකත්වය පිළිබඳව දීඝ නිකායට්ඨකථා සාමඤ්ඤඵල සූත්‍ර වර්ණනාවෙහි මෙසේ සඳහන් වේ.

**"කො උපාසකො ති = යො කොචි සරණගතො ගහට්ඨො"** තෙරුවන් සරණ ගිය ගිහි පින්වතා උපාසක නම් වේ.

**"කස්මා උපාසකො ති = රතනත්තයං උපාසනතො"** කුමක් නිසා උපාසක නම් වේ ද? රත්නත්‍රය කරා එළඹෙන බැවින් ඇසුරු කරන බැවින් උපාසකයා නම් වේ.

**"කිමස්ස සීලන්ති = පඤ්ච වෙරමණියො"** පඤ්ච දුෂ්චරිතයන්ගෙන් වැළකීම ඔහු ගේ සීලය යි.

යමෙක් බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද, එපමණකින් හෙතෙම උපාසකයෙකු වෙයි.

**"කො ආජීවො ති = පඤ්ච මිච්ඡාවණිජ්ජා පහාය ධම්මෙන සමෙන ජීවිතකප්පනං"** සත්ව හින්සනයට යොදා ගන්නා ආයුධ වෙළඳම, දස බව ආදියට මනුෂ්‍යයන් විකිණීම, සුනබයන් ඇති දැඩි කරන්නා සේ මුව, ඌරු, එළුවන් වැනි සතුන් ඇති කොට මස් පිණිස විකිණීම, මත් ද්‍රව්‍ය වෙළඳම, වස විස වෙළඳම යන අධර්ම වෙළඳම්වලින් වැළකී ධර්මානුකූල ජීවිත පැවැත්ම ඔහුගේ ආජීවය යි.

**"කා විපත්තීති = යා තස්සෙව සීලස්ස ච ආජීවස්ස ච විපත්ති, අයමස්ස විපත්ති"** යමෙක් සිල් නො රකියි ද, අධර්‍ම වෙළඳම් කරයි ද මෙය ඔහු ගේ විපත්තිය හෙවත් පිරිහෙන මඟ වේ. එබඳු තැනැත්තා ගේ ලක්‍ෂණ මෙසේ දැක්වේ.

යමෙක් ශ්‍රද්ධාව නැත්තේ වේ ද, සිල් බිඳියි ද, කෝතුහල මංගල නම් වූ අසන දකින දේවල් ශුභ අසුභ වශයෙන් පිළිගන්නෙක් වේ ද, කෝතුහල මංගල සළකා කර්‍ම විපාක පිළි නොගන්නෙක් වේ ද, බුදු සසුනෙන් බැහැර දන් දීමට සුදුස්සන් සොයයි ද මෙම කරුණු පස සීල විපත්තියට හා ආජීව විපත්තියට හේතු වේ. යමෙක් මෙම කරුණු පසෙන් යුක්ත වේ ද හෙතෙම උපාසක චණ්ඩාලයෙකි. මල බැඳුණු යකඩයක් මෙන් උපාසක මලයෙකි. උපාසක හීනයෙකි.

**"කා සම්පත්තීති = යා චස්ස සීලසම්පදා චෙව ආජීවසම්පදා ච, සා සම්පත්ති"** යමෙක් මනාව පන්සිල් රකියි ද, පිරිසිදු ආජීවයෙන් යුක්ත වේ ද, මෙය ඔහු ගේ සම්පත්තිය හෙවත් දියුණුවන මඟ වේ. එබඳු යහපත් උපාසකයා ගේ ලක්‍ෂණ මෙසේ දැක්වේ.

යමෙක් ශ්‍රද්ධාව ඇත්තේ වේ ද, සිල්වත් වේ ද, කෝතුහල මංගලිකයෙක් නොවෙයි ද, කර්‍ම ඵල විශ්වාස කරන්නෙක් වේ ද, බුදු සසුනෙන් බැහැර දක්ෂිණාර්හයන් නො සොයයි ද හෙතෙම භික්‍ෂු - භික්‍ෂුණී - උපාසක - උපාසිකා යන සිවු පිරිසෙහි ප්‍රසාදයට පත්වන බැවින් උපාසක රත්නය නම් වේ. මෛත්‍රිය, කරුණාව, ඉවසීම, ආදී ගුණයන්ගෙන් ද, සීල සුගන්ධය, කීර්ති සුගන්ධය, ගුණ සුගන්ධය ආදියෙන් ද යුත් උපාසක තෙමේ උපාසක පදුමය නම් වේ. සුදු නෙළුම් මලක් සේ මංගල සම්මත අවස්ථාවන්හි දී පෙරමුණෙහි තබා ගන්නා බැවින් ද, සැමට ප්‍රිය මනාප වන බැවින් ද උපාසක පුණ්ඩරිකය නම් වේ.

එබඳු උපාසකයා ගේ ගුණ දසයක් මිලින්ද ප්‍රශ්නයෙහි දක්වා ඇත. ඒවා මෙසේ ය.

1. සඞ්ඝයා හා සමාන සුව දුක් ඇත්තේ ධර්‍මය අධිපති කොට ඇත්තේ වේ.

2. දන් දීමෙහි ඇලුණේ වේ.
3. සර්වඥ ශාසනයෙහි පිරිහීම දැක එය නගා සිටවීමට උත්සාහ කරන්නෙකු වේ.
4. දුරු කරන ලද කෞතුහල මංගල ඇත්තේ සම්‍යක් දෘෂ්ටිය ඇත්තෙකු වේ.
5. ජීවිත හේතුවෙන් වත් සර්වඥයන් වහන්සේ හැර අනෙකෙකු තම ශාස්තෲවරයා වශයෙන් නො දක්වන්නෙකු වේ.
6. කාය කර්ම වාක් කර්ම ආරක්‍ෂා කරන්නෙකු වේ.
7. සමගියෙහි ඇලුණෙක් වේ.
8. ඊර්ෂ්‍යා නොකරන්නෙකු වේ.
9. අන්‍යයන් රැවටීමට නොව සත්‍යයෙහි පිහිටා ම සර්වඥ ශාසනයෙහි හැසිරෙන්නෙකු වේ.
10. බුදුන් සරණ ගිය දහම් සරණ ගිය සඟුන් සරණ ගිය කෙනෙකු වේ.

## ❄ තමාගේ හා අන්‍යයන්ගේ යහපත පිණිස පවතින උපාසක තුමා

1. තමා ශ්‍රද්ධාව ඇත්තේ අන්‍යයන් ශ්‍රද්ධාවෙහි පිහිටුවයි.
2. තමා සිල්වත් වූයේ අන්‍යයන් සීලයෙහි පිහිටුවයි.
3. තමා ත්‍යාගවන්ත වූයේ අන්‍යයන් ත්‍යාගවන්ත භාවයෙහි පිහිටුවයි.
4. තමා භික්‍ෂූන් දකිනු කැමැත්තේ අන්‍යයන් භික්‍ෂූන් දැකීමෙහි යොදවයි.
5. තමා ධර්මය අසන්නේ අන්‍යයන් ධර්මය ඇසීමෙහි පිහිටුවයි.

6. තමා ඇසූ ධර්මය ධරන්නේ (සිහියෙහි තබා ගන්නේ) අන්‍යයන් ධර්මය ධාරණයෙහි යොදවයි.

7. තමා මතකයෙහි තබා ගත් ධර්මයෙහි අර්ථ විමසන්නේ අන්‍යයන් ධර්මය අර්ථ පරීක්ෂාවෙහි යොදවයි..

8. තමා ධර්මානුකූල පිළිවෙතෙහි යෙදුණේ අන්‍යයන් ධර්මානුකූල පිළිවෙතෙහි යොදවයි.

මෙබඳු ලක්ෂණයන්ගෙන් සමන්වාගත සෑම දෙනාට ම සියලු කරදර බාධක අභියෝග මැඩ ගෙන අපරාජිත ව මනා ඍජු ප්‍රතිපදාව අනුගමනය කොට ලෞකික ලෝකෝත්තර සියලු ප්‍රාර්ථනා ජය ගත හැකි වන්නේම ය.

## 10. බ්‍රහ්මචරියක පඤ්ච සීලය

තිසරණ සහිත පන්සිල් රකින උපාසකයා විසින් එය මැනවින් රැකීමට කාලාන්තරයක් පුරුදු කළ යුතු ය. එසේ එය පුරුදු කළ තැනැත්තාට කෙලෙස් බරින් ඈත් ව නිවන් මඟ සරු කර ගැනීම පිණිස තථාගතයන් වහන්සේ බ්‍රහ්මචරියක පඤ්ච සීලය අනු දැන වදාළ සේක. පඤ්ච සීලයෙහි ඇති තුන් වන සිකපදය වන **"කාමෙසුමිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** යන මේ සිකපදය වෙනුවට **"අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** කියා සමාදන් වීම මෙහි ඇති වෙනස ය. එහි අර්ථ විවරණය මෙසේ ය.

**"අබ්‍රහ්මචරියන්ති අසෙට්ඨචරියං"** බුද්ධාදී උතුමන් විසින් පිළිකුල් කරන ලද පහත් වූ ලාමක වූ නින්දිත වූ හැසිරීම අබ්‍රහ්මචරියාව නම් වේ. මෙයින් මෛථුන ධර්මය අදහස් කරන ලදි.

**"බ්‍රහ්මන්ති = සෙට්ඨං උත්තමං විසුද්ධං"** යන මෙහි බ්‍රහ්ම

යන්නෙන් ශ්‍රේෂ්ඨ උත්තම විශුද්ධ යන අර්ථ කියවේ.

"**චරිතන්ති චරියා**" හැසිරීම ක්‍රියා කිරීම චරියා නම් වේ. මෙහි චරියා යන්නෙන් පාරමිතා සංඛ්‍යාත දන සීල භාවනාමය ප්‍රතිපත්තියෙහි හැසිරීම කියන ලදි. මෙහි "**ඉරියාපථචරියා, ආයතනචරියා, සතිචරියා, සමාධිචරියා, ඤාණචරියා, මග්ගචරියා, පත්තිචරියා, ලොකත්ථචරියා**" චරියා අටකි.

සතර ඉරියව්ව සිහි නුවණින් විසීම "**ඉරියාපථචරියා**" නම් වේ. ඉන්ද්‍රිය සංවරය "**ආයතනචරියා**" නම් වේ. සතර සතිපට්ඨානයෙහි යෙදීම "**සතිචරියා**" නම් වේ. ධ්‍යාන භාවනාවෙහි යෙදීම "**සමාධිචරියා**" නම් වේ. ආර්‍ය්‍ය සත්‍ය විදර්ශනාව "**ඤාණචරියා**" නම් වේ. සෝවාන් ආදී මාර්ගයන්ට පැමිණීම "**මග්ගචරියා**" නම් වේ. සෝවාන් ආදී ඵලයන්ට පැමිණීම "**පත්තිචරියා**" නම් වේ. බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා සත්වානුකම්පාවෙන් ලෝ වැඩ කිරීම "**ලොකත්ථචරියා**" නම් වේ.

"**සෙට්ඨට්ඨෙන බ්‍රහ්මභූතානං බුද්ධ - පච්චෙකබුද්ධ - බුද්ධසාවකානං චරියතො බ්‍රහ්මචරියන්ති වුච්චති**" යන මේ නිරුක්තිය අනුව බ්‍රහ්මචරියාව යනු උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් ගත් කල්හි මෛථුන ධර්මයෙන් ද, රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්ච කාමයන් ගෙන් ද සම්පූර්ණයෙන් වැළකී පිරිය යුතු වූ, බුදු, පසේ බුදු, බුද්ධ ශ්‍රාවක උතුමන් වහන්සේලාට අයත් වූ ශ්‍රේෂ්ඨ චර්‍ය්‍යාව වන ආර්‍ය්‍ය මාර්ග ප්‍රතිපදව හඳුන්වන විශේෂ නාමයකි.

තව ද "**බ්‍රහ්මචරියන්ති සික්ඛාත්තයසඞ්ගහිතං සකලං සාසනබ්‍රහ්මචරියං**" යන්නෙන් අධි සීල අධිචිත්ත අධි පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් සංගෘහිත වූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් විසින් පිරිය යුතු ශාසන ප්‍රතිපත්ති මාර්ගය අදහස් කරන ලදි. තව ද "**බ්‍රහ්මචරියන්ති මෙථුනවිරති**" යන මෙහි මෛථුනයෙන් වැළකීම ම බ්‍රහ්මචර්‍ය්‍යාව යනුවෙන් අදහස් කරන ලදි. මේ කියන ලද්දේ උත්කෘෂ්ට පරිච්ඡේදයෙනි.

"**බ්‍රහ්මචරිය සද්දො දනෙ වෙය්‍යාවච්චෙ පඤ්චසික්ඛාපදසීලෙ**

**අප්පමඤ්ඤාසු මෛථුනවිරතියං සදාරසන්තොසෙ වීරියෙ උපොසථඞ්ගෙසු අරියමග්ගෙ සාසනෙති ඉමෙසුචපොෙසු දිස්සති"** තව ද මේ බ්‍රහ්මචර්‍යාව යන්නෙහි විවිධ අර්ථ කුශලතා දක්වයි. ඒ අතර දන් දීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. වතාවත් කිරීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. පන්සිල් රැකීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. කරුණා-මුදිතා භාවනා වැඩීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. මෛථුනයෙන් වැළකීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. තම භාර්‍යාවගෙන් සතුටු වීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. කුසල වීර්‍ය ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. උපෝසථ සිල් (අටසිල්, දසසිල්) රැකීම ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. ආර්‍ය මාර්ගය ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි. සීල සමාධි ප්‍රඥා සංඛ්‍යාත බුද්ධානුශාසනාව ද ශ්‍රේෂ්ඨ චර්‍යාවකි.

ගිහිව වාසය කරන්නෙකු විසින් වුව ද මෙසේ බ්‍රහ්මචරියක පඤ්ච සීලය කලින් කලට හෝ සමාදන්ව පුරුදු කර ගැනීමෙන් පහසුවෙන් ආත්ම දමනය සිදුකළ හැකි වේ. අබ්‍රහ්මචරියාවෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස දහ නවයකි. ඒවා කාමමිථ්‍යාචාරයෙහි කියූ ආනිශංසයෝම ය.

# 11. ආජීව අෂ්ටමක සීලය

සිල් ඉල්ලීමේ වාක්‍යය.

**ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං ආජීව අට්ඨමක සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ.**

**දුතියම්පි---තතියම්පි අහං භන්තෙ, තිසරණෙන සද්ධිං ආජීව අට්ඨමක සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ. අනුකම්පං උපාදාය.**

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
2. **අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
3. **කාමෙසුමිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**

4. **මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
5. **පිසුනාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
6. **ඵරුසාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
7. **සම්ඵප්පලාපා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
8. **මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.** යන මේ ශික්ෂාපද අට ආජීවාෂ්ටමක සීලය නම් වේ.

පඤ්චසීලය වනාහි අබුද්ධෝත්පාද කාලයන්හි ද ශිෂ්ට මිනිසුන් අතර පවතින්නකි. ආජීව අෂ්ටමක සීලය වනාහි බුද්ධෝත්පාද කාලයෙහි පමණක් පවතින විශේෂ ශීලයකි. මහ බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කොට අනෝමා ගං තෙරට පැමිණ පැවිදි ව ආජීවාෂ්ටමක සීලය සමාදන් වූ බව සුත්ත නිපාතයට අයත් පබ්බජ්ජා සූත්‍රයෙහි සඳහන් වේ. මෙම සීලය සමාදන් වීමෙන් මනාව පන්සිල් රැකිය හැකි වන්නේ ය. **පාණාතිපාතා වෙරමණී, අදින්නාදනා වෙරමණී, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී, මුසාවාද වෙරමණී** යන මුල් සිකපද සතර ද පඤ්ච සීලයෙහි දී විස්තර කරන ලදි. ඉතිරි සික්ෂාපදයන්හි අර්ථ විවරණය මෙසේ ය.

## ❄ පිසුනාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

පිසුණාවාචා යන මෙහි **පිංසති සමගෙග සතෙත භිනෙන කරොතී'ති= පිසුණා** යම් කිසි වචනයකින් සමගි වූවන් භේද කෙරේ ද, ඒ වචනය පිසුණා නම් වේ. එනම් කේලාම් කීමයි. තමන් ප්‍රිය පුද්ගලයෙක් වීමේ කැමැත්තෙන් හා අන් දෙදෙනෙකු බිඳුවීමේ කැමැත්තෙන් කෙනෙකු කී දෙයක් අනිකෙකුට කීමෙන් පිසුණාවාචාව සිදු වේ. එය ජාති, නාම, ගොත්ත, කම්ම, සිප්ප, ආබාධ, ලිංග, කිලෙස, ආපත්ති, අක්කොස යන දස ආකාරයෙන් සිදුකළ හැකිය. ඒවා මෙසේ ය.

1. **ජාති** = යනු සමාජ සම්මත විවිධ කුල වංශයෝය. උසස්

කුලවතෙකුට, අසවලා ඔබට ගොවිගමයෙක්, වලවුකාරයෙක් කීවේය කියා හෝ චණ්ඩාලයෙක්, කුළුපොත්තෙක් යැයි පහත් ජාතියක් ආරෝපණය කොට කීම ද, පහත් කුලයක උපන්නෙකුට අසවලා ඔබට චණ්ඩාලයෙක්, කුළුපොත්තෙක් වළං හදන්නෙක් කීවේය කියා හෝ ගොවිගමයෙක්, වලවුකාරයෙක් කීවේය කියා උසස් ජාතියක් ආරෝපණය කොට කීමයි.

2. **නාම**= යනු පරම්පරා ගත හෝ කාලානුරූප වූ හෝ ජනසමාජයෙහි සම්මත නාමයෝ ය. උසස් යැයි සම්මත නමක් ඇතියෙකුට උසස් හෝ පහත් නමක් ආරෝපණය කොට ද, පහත් නාමයක් ඇතියෙකුට අපීවත් නාමයක් හෝ පහත් නාමයක් ආරෝපණය කොට කීමයි.

3. **ගොත්ත** = යනු එක් එක් කුල පරම්පරා නාමයෝ ය. උසස් ගෝත්‍ර නාම ඇතියෙකුට උසස් හෝ පහත් ගෝත්‍ර නාමයක් හෝ ආරෝපණය කොට ද, පහත් ගෝත්‍ර නාමයක් ඇතියෙකුට උසස් හෝ පහත් ගෝත්‍ර නාමයක් ආරෝපණය කොට කීමයි.

4. **කම්ම** = යනු ඒ ඒ ප්‍රදේශවල ඇති උස් පහත් රැකියාවෝ ය. උසස් රැකියාවක් කරන්නෙකුට උසස් හෝ පහත් රැකියාවක් ආරෝපණය කොට ද, පහත් රැකියාවක් කරන්නෙකුට පහත් හෝ උසස් රැකියාවක් ආරෝපණය කොට හෝ කීමයි.

5. **සිප්ප** = යනු මැටි, ලී, වේ වැල්, රෙදි ආදියෙන් කරන්නා වූ විවිධ ශිල්ප හෙවත් වෘත්තීන් ය. උසස් ශිල්පීය දක්ෂතා ඇතියෙකුට උසස් හෝ පහත් ශිල්පයක් ආරෝපණය කොට ද, පහත් ශිල්ප කරන්නෙකුට පහත් හෝ උසස් ශිල්පයක් ආරෝපණය කොට හෝ කීමයි.

6. **ආබාධ**= යනු සියලු රෝගයෝ ය. මේ අතර මධුමේහය උසස් ආබාධයක් යැයි ද අන් සියල්ල පහත් යැයිද කියා ඇත. මේ ආබාධ වැළඳී ඇතියෙකුට උසස් හෝ පහත් ආබාධයක් ආරෝපණය කොට කීමයි.

7. **ලිංග**= යනු ශරීර වර්ණ හා හැඩහුරුකම් ය. යම් අඩුවක් හෝ වැඩියක් හෝ වර්ණයක් හෝ මුල්කොට කීමයි.

8. **කිලෙස**= යනු ඇත්තා වූ චරිත ස්වභාවයකින් හෝ නැත්තා වූ

ක්ලේශයක් හෝ මුල්කොට කීමයි.

9. **ආපත්ති** = යනු සත්ව ඝාතන සොරකම ආදී කළ හෝ නොකළ වරදක් මුල්කොට කීමයි.

10. **අක්කොස**= යනු දස අක්‍රෝෂ වස්තුවලින් කීමයි. මෙය ද හීන උත්කෘෂ්ට යැයි දෙ වැදෑරුම් වේ. එහි හීන නම්= අසවලා නුඹට ගොනෙක් යැයි කීවේය, බූරුවෙක්, බැටළුවෙක්, කොටලුවෙක්, තිරිසනෙක්, නිරය ගතිකයෙක් කීවේය, නුඹට සුගතියක් නැත, නුඹ විසින් අපායම කැමති විය යුතු යැයි කීවේය. යනාදී ලෙස කීමයි. උත්කෘෂ්ට නම්= නුඹට අසවලා පණ්ඩිතයෙක්, ව්‍යක්තයෙක්, ඥානවන්තයෙක්, බහුශ්‍රැතයෙක්, කථිකයෙක් කීවේය යනාදී වචන යොදා කීමයි.

අංග සතරක් සම්පූර්ණ වීමෙන් පිශුණාවාචාව සිදු වේ.

1. භේද කළ යුතු අනෙකෙකු ඇති බව.
2. කෙනෙකු හා තව කෙනෙකු බිඳවන අදහස ඇති බව.
3. බිඳවීමට දස අක්‍රෝෂ වස්තූන් ගෙන් යමක් කීම.
4. ඇසූ තැනැත්තා එය තේරුම් ගැනීම යි.

කියන දේ සත්‍ය වුව ද අසත්‍ය වුව ද අන්‍යයන් බිඳවන අදහස ඇත්තෙ නම් වරදට පැමිණේ. අන් කෙනෙකු යම් අනතුරකට පැමිණෙන්නට යාමේ දී ඔහු එයින් ගලවා ගැනීමේ චේතනාවෙන් කීමෙන් පිශුණා වාචා අකුසලය සිදු නොවේ. පිශුණා වාචයක් කීමෙන් අන්‍යයන් නො බිඳුනේ නම් එයින් ද කර්මය සම්පූර්ණ නොවේ. භේද වීමෙන් ම කර්ම පථයක් සිදු වේ. කේලමෙන් ගුණ හීනයන් බිඳුවීමේ කර්මය අල්ප සාවද්‍ය වේ. ගුණයෙන් උසස් වූවන් ගේ තරමට කර්මය මහා සාවද්‍ය වේ. කීමේ දී කෙලෙස් අඩුවෙන් යෙදුණ කල්හි අල්ප සාවද්‍ය කර්මයක් වේ. වැඩියෙන් යෙදුණු කල්හි මහා සාවද්‍ය කර්මයක් වේ. කේලාම් කීමෙහි විපාක හා එයින් වැළකීමේ ආනිශංස මුසාවාද සිකපදය හා සම වේ.

## ❄ ඵරුසාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

**පරෙසං මම්මච්ඡෙදිකා ඵරුසා වාචා එතෙසන්ති ඵරුසවාචා** = යම් වචනයක් කීමෙන් අන්‍යයන්ගේ මර්මස්ථාන හෙවත් බල නහර සිඳින්නාක් මෙන් වේ ද, එබඳු වචන පරුසා වාචා නම් වේ. තව ද

**යා වාචා සයම්පි ඵරුසා නෙව කණ්ණසුඛා න හදයඞ්ගමා, අයං ඵරුසාවාචා.**= යම් වචනයක් ස්වභාවයෙන් ම කර්කශ වේද ඇසීමෙන් කනට සුවයක් නොවේ ද, සිතට ප්‍රිය නොවේ ද එබඳු වූ සිත් රිදවන වචන පරුෂා වාචා නම් වේ. තව ද

**යාය හි වාචාය අත්තානම්පි පරම්පි ඵරුසං සිනෙහාභාවෙන ලූඛං කරොති, සා ඵරුසාවාචා.**= යම් වචනයක් කීමෙන් එය කියන්නා ද අසන්නා ද රෞද්‍ර බවට නපුරු බවට පමුණුවයි ද හිතවත් බව මිත්‍ර බව දුරු ව යයි ද ඒ වචනය ඵරුසාවාචා නම් වේ. විනය පිටකයේ පාචිත්තිය පාළියෙහි අක්‍රෝෂ කිරීම ජාති, නාම, ගොත්ත, කම්ම, සිප්ප, ආබාධ, ලිංග, කිලෙස, ආපත්ති, අක්කොස යනුවෙන් දස අයුරකින් කළ හැකි බව දක්වේ.

1. උසස් කුලයක උපන්නෙකුට ඔහුගේ කුලය ගෙන හෝ රොඩියා පද්දු හකුරා ආදී ලෙස පහත් කුලයක් ආරෝපණය කොට හෝ පහත් කුලයක උපන්නෙකුට එම කුලයෙන් හෝ නිලමේ රාලහාමි හාමු ආදී ලෙස උසස් කුලයක් ආරෝපණය කොට හෝ අවමන් කිරීම ජාතියෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.
2. ජන සමාජයෙහි උසස් කොට සලකන නම් ඇතියෙකුට එම නාමය ගෙන හෝ පහත් යැයි සම්මත කරෝලිස් හරමානිස් ආදී නම් යොදා හෝ පහත් යැයි සම්මත නම් ඇතියන්ට එම නාමයෙන් ම හෝ අවමන් පිණිස උසස් නමක් යොදා හෝ කථා කිරීම නාමයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.
3. ඒ ඒ කුලයන්ට අයත් පරම්පරා නාම ගෝත්‍ර නම් වේ. උසස් ගෝත්‍රයක කෙනෙකුට එම ගෝත්‍රයෙන් ම හෝ පහත් ගෝත්‍ර නාමයකින් අවමන් කිරීම ද, පහත් ගෝත්‍රයක කෙනෙකුට එම ගෝත්‍රයෙන් ම හෝ උසස් ගෝත්‍ර නාමයකින් අවමන් කිරීම ද

ගෝත්‍රයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

4. ඒ ඒ ජනපදයන්හි උසස් කොට සලකන ගොවිතැන වාණිජ ආදී කර්මාන්ත කරන්නෙකුට එයින් ම හෝ වැදි කෙවුල් ආදී පහත් ක්‍රියාවකින් හෝ අවමන් කිරීම ද, පහත් කර්මාන්ත කරන්නෙකුට එයින් ම හෝ ගොවි කම් ආදී උසස් ක්‍රියාවකින් හෝ අවමන් කිරීම ද කර්මයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

5. මනුෂ්‍යයෝ ජීවත් වන ඒ ඒ ප්‍රදේශයන්හි ඇති ස්භාවික සම්පත් ආදිය උපයෝගී කරගෙන ජීවනෝපාය වශයෙන් කරන්නා වූ ශිල්පයෝ වෙති. ඒ අතර උසස් යැයි සම්මත ශිල්පයකින් ජීවත් වන්නෙකුට එයින් ම හෝ පහත් යැයි සම්මත කුඹල් ආදී ශිල්පයකින් හෝ අවමන් කිරීම ද, පහත් යැයි සම්මත ශිල්ප ඇත්තෙකුට එයින් ම හෝ ලේඛක ආදී උසස් ශිල්පයකින් අවමන් කිරීම ද ශිල්පයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

6. මධුමේහය, ක්‍ෂය, රෝගය, හොරි, කබර, ලාදුරු, පරංගි ආදිය ආබාධ නම් වේ. එසේ වූ ආබාධ ඇතියෙකුට එයින් ම හෝ වෙනත් ආබාධයකින් හෝ අවමන් කිරීම ද නිරෝගී අයෙකුට එවැනි ආබාධ නාම යොදා නිග්‍රහය පිණිස කථා කිරීම ද ආබාධයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

7. කර්ම, චිත්ත, ඍතු, ආහාර ආදී විෂමතාවයන් අනුව ඒ ඒ පුද්ගලයාට උස් මිටි කම් හැඩහුරුකම් ශරීර වර්ණයන් සකස් වී ඇත. ඒවා මුල් කොට දිගා, මිට්ටා, සුද්ද, රත්තා, කලුවා ආදී ලෙස අවමන් පිණිස කීම ලිංගයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

8. කර්ම චිත්තා දී හේතූන් අනුව පිහිටි ගති ස්වභාවයන් යම් යම් පුද්ගලයන්ට ඇත. ඒවා මුල්කොට පෙරේතයා, මසුරා, ලොභයා, තිරිසනා, යකා ආදී ලෙස අවමන් පිණිස කීම ක්ලේශයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

9. කළ හෝ නො කළ වරදකින් අවමන් කිරීම ආපත්තියෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

10. ඇතමුන් අන්‍යයන්ට අපහාස කිරීම පිණිස ගොනා, බූරුවා, බල්ලා, එළුවා, අශ්වයා නිරි සතා, බේබද්ද, සල්ලාලයා, නාටාඕියා යනාදී ලෙස විවිධ නම් හා වචන යොදා ගනිති. එලෙස සිත් රිදවන

වචන කීම අක්‍රෝෂයෙන් අක්‍රෝෂ කිරීම නම් වේ.

අංග තුනක් සම්පූර්ණ වීමෙන් පරුෂ වචනය සිදු වේ. එනම්:

1. අක්‍රෝෂ කළ යුතු කෙනෙකු සිටීම.
2. ක්‍රෝධ සිත ඇතිවීම.
3. අනුන්ගේ සිත් රිදවන වචන කීම යි.

පරුෂ වචන කීම ක්‍රෝධයෙන් මැඩුණු දූෂිත වූ සිත ඇතිව කීමෙන් ම සිදු වේ. එයින් තොරව සිදු නොවේ. මේ පිළිබඳ දීඝ නිකාය අට්ඨකථාවෙහි දැක්වෙන කථාවක් මෙසේ ය.

එක් අකීකරු දරුවෙක් මව වළක්වද්දී ම මවට අකීකරු ව වනයට යෑමට පිටත් වූයේ ය. දරුවාගේ ගමන වැළැක්වීමට නොහැකි වූ මව "වනයේ දී කුළු මී දෙන තා පස්සේ එළවයි" යැයි කියා දරුවාට අක්‍රෝෂ කළා ය. එදා වනයෙහි දී ඒ දරුවාට අභිමුඛව කුළු මී දෙන පසුපස දිව ආවා ය. එකල්හි ඒ දරුවාට තම මවගේ කීම සිහි වී "මාගේ මව යමක් කීවා ද එය නොවේවා, මව යමක් සිතුවා ද එයම මට සිදු වේවා" යැයි සත්‍යක්‍රියා කළේ ය. එකෙණෙහි ම කුළු දෙන නැවතුණා ය. මෙයින් පැහැදිලි වන්නේ මව ඒ වචනය කීවේ ක්‍රෝධයෙන් නොව දරුවා කෙරෙහි මෛත්‍රියෙනි. එබඳු වූ ක්‍රෝධයෙන් තොරව කියන වචනයෙන් පරුෂ වචන කීමක් නොවන බව දැක්වේ.

## ☸ ඵරුසාවාචාවෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

සීලයෙන් ගුණයෙන් උසස් අයට අක්‍රෝෂ පරිභව කිරීම මහා සාවද්‍ය කර්මයක් වේ. සීලයෙන් ගුණයෙන් හීන වූවන්ට අක්‍රෝෂ පරිභව කිරීම අල්ප සාවද්‍ය වේ. තමන් හා සම වූවන්ට කීමේ දී සිතෙහි මහත් ද්වේෂයකින් කීමේ දී මහා සාවද්‍ය වේ. අඩුවෙන් යෙදුණු විට අල්ප සාවද්‍ය වේ. ඵරුසාවාචාවෙහි විපාක හා එයින් වැළකීමේ ආනිශංස මුසාවාද සිකපදය හා සම වේ.

## ❄ සම්ඵප්පලාපා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

**සං සුඛං, හිතඤ්ච ඵලති විසරති විනාසෙතීති සම්ඵං, අත්තනො, පරෙසඤ්ච අනුපකාරං යං කිඤ්චි, තං පලපති එතෙනාති සම්ඵප්පලාපො.** ස්වල්ප වූ වින්දනයක් සහනයක් ගෙන දේ ද, කුසල සිත විසිර යයි ද, මෙලොවත් පරලොවත් අර්ථය විනාශ කරයි ද එබඳු නිරර්ථක දෙය සම්ඵ නම් වේ. තමන්ටත් අනුන්ටත් අර්ථයක් ප්‍රයෝජනයක් නොවන එබඳු අර්ථ ශූන්‍ය දේ කථා කිරීම **සම්ඵප්පලාප** නම් වේ. භාරත යුද්ධය, රාමායනය, සීතාහරණාදී වූ කථාවස්තු ආදිය **සම්ඵප්පලාප** නම් වේ. යම් කරුණක් පැහැදිලි කිරීමට නිදර්ශන වශයෙන් එවැනි කථාවන් උපයෝගී කරගෙන කරුණු ඉදිරිපත් කිරීම සම්ඵප්‍රලාප කීමක් නොවේ. රටේ ලෝකයේ සිදුවන හොර මැර වඤ්චා ආදිය ගැන නොදන්නවුන් ඒවාට ගොදුරු වීම වැළැක්වීම පිණිස අවබෝධයක් ලබා දීමට ඒවා සිදුවන හැටි කියා දීම ද සම්ඵප්‍රලාප නොවේ. පිරිස් වශයෙන් එක් වූ අවස්ථාවන්හිදී කාලය ගෙවා දැමීම පිණිස නොයෙක් විධ මාතෘකා යොදගෙන කරන රාජ කථා දී නොකළයුතු නිරර්ථක කථා **සම්ඵප්‍රලාප** නම් වේ. නිස්කාරණයේ නොකළයුතු කථා දෙතිසක් වේ. ඒවා මෙසේ ය.

රජවරු පිළිබඳ කථා, සොරු පිළිබඳ කථා, මහ ඇමතියන් පිළිබඳ කථා, සිවුරඟ සේනාව පිළිබඳ කථා, භය පිළිබඳ කථා, යුද්ධ පිළිබඳ කථා, ආහාර පිළිබඳ කථා, පාන (මත්පැන් හා අනෙකුත් පාණවර්ග) පිළිබඳ කථා, වස්ත්‍ර පිළිබඳ කථා, ඇඳ පුටු ආදී ආසන පිළිබඳ කථා, මල් වර්ග පිළිබඳ කථා, සුවඳ වර්ග පිළිබඳ කථා, ඤාතීන් පිළිබඳ කථා, යාන වාහන පිළිබඳ කථා, ගම් පිළිබඳ කථා, නගර-ජනපද පිළිබඳ කථා, ස්ත්‍රී පුරුෂයන් පිළිබඳ කථා, යෝධ ආදී සූරයින් පිළිබඳ කථා, වීථි (මාවත්) පිළිබඳ කථා, තොටු පොළවල් පිළිබඳ කථා, අතීත ඤාතීන් පිළිබඳ කථා, මෙහි නො කියවුණු අනේක කථා, දියුණුව හා පිරිහීම පිළිබඳ කථා යන මේවා ය. මේවාගෙන් එදිනෙද අවශ්‍යතාවයන් අනුව ප්‍රයෝජනවත් වන දේ කථා කළ යුතුය. එය වුව ද පමණ ඉක්මවා කිරීම අර්ථ ශූන්‍ය බැවින් නිරර්ථක කථා වේ.

යම් විටෙක නිරර්ථක කථා කියවුණේ නම් ඒවා විදර්ශනාවට

හරවා අවසන් කළ යුතුය. එවිට එයින් යහපතක් වේ. අංග දෙකක් සම්පූර්ණ වීමෙන් සම්ඵප්‍රලාපය සිදු වේ.

1. අසන කියන දෙපක්ෂයටම නිස්ප්‍රයෝජන දේ කීමේ අදහස,
2. එබඳු දේ කීම ය.

නිශ්ප්‍රයෝජන දෙයක් කී විට අන්‍යයන් එය නො පිළිගත හොත් එය කර්ම පථයක් නොවේ. පිළිගත හොත් එය කර්ම පථයක් වේ. සාමාන්‍ය වශයෙන් සම්ඵප්‍රලාප කීම අල්ප සාවද්‍ය වේ. බහුලව කීම මහා සාවද්‍ය වේ. එසේම අසන්නන්ට එයින් වන හානිය අල්ප වූ විට එය අල්ප සාවද්‍ය කර්මයක් වේ. අසන්නන්ට මහත් වූ හානියක් වීමෙන් මහා සාවද්‍ය කර්මයක් වේ.

අපගේ කය පවතින්නේ ආහාර පානා දී ප්‍රත්‍යයන්ගෙනි. ඒවා නැතිව කය නො පැවැත්විය හැකි ය. සිතෙහි ස්වභාවය ද එසේම ය. සිතෙහි පැවැත්මට ද ආහාර අවශ්‍ය ය. ඇස කන ආදී පඤ්චද්වාරයන්ගෙන් ගනු ලබන රූප ශබ්දදිය ද මනසෙහි පහළ වන අරමුණු ද සිතෙහි ආහාරයෝ වෙති. නොයෙක් අරමුණු ඔස්සේ කථා කරමින් ක්‍රියාකරමින් කරන්නේ ඒ ආහාර සෙවීම ය. එහෙත් බොහෝ විට සිදු වන්නේ මෙලොවටත් පරලොවටත් වැඩකට නැති සසර දුකට නැවත නැවත ඇද දමන අනර්ථකර ආහාර සෙවීම ය. එබැවින් මේ කරුණ හොඳින් තේරුම් ගත යුතු ය. ක්‍රමානුකූලව සිහිය නුවණ දියුණු කරගෙන සිතට කුසල ආහාර ලබා දීමට උත්සාහය ඇති කර ගත යුතු ය. එයින් මෙලොවත් ජය ගෙන පරලොවත් ජය ගෙන සසර දුකින් නිදහස් ව ලබන අමා නිවන් සුව ලැබිය හැකි වේ. ඒ සඳහා යන උතුම් මාවතට මේ ව්‍යායාමය අවබෝධ ඥානය ලැබීම පිණිස හේතු වේවා!

## ❄ මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

"**මිච්ඡා ආජීවන්ති ඛාදනීයභොජනීයාදීනං අත්ථාය පවත්තිතං කායවචීදුච්චරිතං**" යන නිරුක්තිය අනුව ජීවිත පැවැත්ම උදෙසා ආහාර පානා දී ප්‍රත්‍යය සැපයීම පිළිබඳ වූ කාය වාක් දුෂ්චරිතයන් මිච්ඡාජීවය නම් වේ.

තව ද "**ආජීවහෙතු පන පවත්තිතා පාණාතිපාතාදයො සත්තකම්මපථචෙතනාපි මිච්ඡා ආජීවො**"= යන මෙහි ජීවනෝපාය පිණිස කයින් සිදුවන ප්‍රාණඝාතය, සොරකම, කාමයෙහි වරදවා හැසිරීම ද, වචනයෙන් සිදුවන බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම ද යන සප්ත කර්ම පථයන්ගෙන් යුක්තව කරන ජීවනෝපාය මිථ්‍යාජීවය නම් වේ.

තව ද නොකළයුතු අධර්ම වෙළඳම් පස මිථ්‍යාජීවයට අයත් වේ. එනම් සත්ව හිංසනයට යොදා ගන්නා ආයුධ වෙළඳම, දාස බව ආදියට මනුෂ්‍යයන්(දරුවන්) විකිණීම, සුනඛයන් ඇති දැඩි කරන්නා සේ මුව, ඌරු, එළුවන් වැනි සතුන් ඇති කොට මස් පිණිස විකිණීම, මත් ද්‍රව්‍ය වෙළඳම, වස විස වෙළඳම යන අධර්ම වෙළඳම් පසයි.

තව ද **කුහනා, ලපනා, නෙමිත්තිකතා, නිප්පෙසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතා** යනාදී පැවතුම් වලින් යුක්තව කරන ජීවනෝපාය මිථ්‍යාජීවය නම් වේ.

අන්‍යයන්ගෙන් උදව් උපකාර ලැබීමේ අදහසින් තමා තුළ නැති ගුණ පෙන්වීම, කිලිටි වූ වස්ත්‍ර ඇඳ තමන්ට නැති බව පෙන්වීම ආදියෙන් අන්‍යයන් වඤ්චා කිරීමාදිය **කුහනා** නම් වේ. අන්‍යයන්ගෙන් ලාභ සත්කාර බලාපොරොත්තුව ඒවාට ගිජු ව අනුන් විස්මයට පත්වන කථා කීම **ලපනා** නම් වේ. තමාට අවශ්‍ය දෙය කෙළින්ම නො ඉල්ලා එය ලබා ගැනීම පිණිස කයින් හෝ වචනයෙන් ඒ පිළිබඳව ඉඟි කිරීම **නෙමිත්තකතා** නම් වේ. නො දෙන්නවුන්ට අක්‍රෝෂ කිරීමාදියෙහි පීඩා කොට අවශ්‍ය දේ ලබා ගැනීම **නිප්පෙසිකතා** නම් වේ. ලාභ ඉපයීමේ කැමැත්තෙන්

කෙනෙකුගෙන් ලද දෙය අනිකෙකුට දී ඔහුගෙන් ලද දෙය තවත් කෙනෙකුට දී එයින් වඩා හොඳ දේවල් ලැබීමේ කැමැත්ත **ලාභෙන ලාභං නිජිගිංසනතා** නම් වේ.

අංග දෙකක් සම්පූර්ණ වීමෙන් මිථ්‍යාජීවය සිදු වේ. එනම්:-

1. මිථ්‍යාවෙන් ජීවනෝපායෙහි උත්සාහය
2. එලෙස ජීවනෝපාය කිරීම යන දෙකයි.

## ☸ මිථ්‍යාජීවයෙහි ආදීනව

මිථ්‍යාජීවයෙන් ජීවිකාව කරන්නා මෙලොව දීම නින්දවට අපකීර්තියට ලක් වේ. කුසල සිත සම්පූර්ණයෙන්ම පිරිහී දෘඩි මිථ්‍යා අදහස් ඇතිව මුලාවට පත් වේ. කර්මපල විශ්වාසය නැත්තෙක් වේ. මරණින් මතු නිරයෙහි උපදියි. එහි දී අප්‍රමාණ කාලයක් රුදුරු දුක් විඳීමට සිදු වේ. එයින් ච්‍යුතව මිනිසත් බව ලැබූ කල්හි අංගවිකල ව උපදියි. ඇට නහර මතු වූ කුණු තැවරුණු ශරීරයෙන් යුතුව උකුණු ආදී සත්වයන්ගෙන් පිරුණු හිස් ඇතිව නොයෙක් රෝග ආබාධ ඇතිව ඉරී ගිය කිලිටි වූ වස්ත්‍ර ඇතිව ශෝකයෙන් පීඩිත ව විසීමට සිදු වේ. ගිය ගිය තැන ගැරහුම් ලබමින් අනුන්ගේ ගෙවල්වල බැල මෙහෙවර කරමින් නින්ද ලබමින් තැන තැන සිඟා කමින් විසීමට සිදු වෙයි. ධනය ඉපයීමට කොතෙක් වෙහෙසුණ ද බලාපොරොත්තු ඉටු නොවෙයි. යන්තමින් හෝ යමක් උපයා ගත්තේ නමුත් ඒවා ගින්නෙන් දැවෙයි. දියේ ගසාගෙන යයි. සොර සතුරන් පැහැර ගනියි. නොකළ වැරදිවලට හසුව වරදකරු වී එම වස්තුව රාජසන්තක වෙයි. උපදවා ගත් ධන ධාන්‍ය වැඩිකලක් නො රැඳී අස්ථාන ගත වෙයි. අන්‍යයන්ගේ මෛත්‍රියට කරුණාවට ලක් නොවී සා පිපාස දුක් ඇතිව ගෙයක් දොරක් නැතිව අතරමං ව අපමණ දුක් විඳීමට සිදු වේ.

එබැවින් මිථ්‍යාජීවයෙන් වැළකී සම්මා ආජීවයෙන් යුක්ත වීම බුදු පසේබුදු මහරහත් ආදී මහෝත්තමයන් වහන්සේලාගේ ප්‍රශංසාවට ලක්වන මෙලොව දියුණුව පරලොව සුගතිය ශාන්ත නිවනට පමුණුවන උසස් චර්‍යාවක් වේ.

# 12. උපෝසථ අෂ්ටාංග සීලය

**උපොසථ** යන්නෙන් පොහොය දිනය, භික්ෂු භික්ෂුණීන්ගේ පොහොය විනය කර්‍මය, අෂ්ටාංග සමන්වාගත- නවාංග සමන්වාගත- දසාංග සමන්වාගත සීලය යනාදී අර්‍ථයන් හි යෙදේ. මෙහි දී උපෝසථ අෂ්ටාංග සීලය අදහස් කරනු ලැබේ. **ගෝපාල උපෝසථය, නිගණ්ඨ උපොසථය, ආර්‍ය උපෝසථය** යනුවෙන් උපෝසථය තුන් වැදෑරුම් වන බව අංගුත්තර තික නිකායේ විසාඛුපෝසථ සූත්‍රයෙහි දක්වේ.

**ගොපාල උපෝසථය**-: ගව පාලකයා විසින් ගවයන්ට තෘණ කවා දිය පානය කරවා සවස ගවයන් හිමියාට භාර දී "මාගේ ගවයෝ අද දින අසවල් තැන්වල තෘණ කෑවාහුය, අසවල් තැන්වල දිය බීවාහුය. හෙට දින අසවල් තැන්වල දී ගවයන්ට තෘණ කවන්නාහ, දිය පානය කරවන්නනාහ" යැයි සිතයි. එපරිද්දෙන් ම මේ ලෝකයෙහි පෙහෙවස් සමාදන් වූ ඇතමෙක් "මම අද දින මේ මේ දෙය කෑවෙමි, මේ මේ දෙය පානය කළෙමි. හෙට දින මම අසවල් දෙය කන්නෙමි, අසවල් දෙය පානය කරන්නෙමි" යැයි ලෝභයෙන් හා අභිද්‍යාවෙන් යුතුව දවස ඉක්මවයි. මෙය **ගොපාල උපෝසථය** නම් වේ. මෙය මහත් ඵල මහත් ආනිශංස නො ලැබේ.

**නිගණ්ඨ උපොසථය**-: නිගණ්ඨ නම් ශ්‍රමණ කොටසක් ඇත. ඔවුහු තම ශ්‍රාවකයන්ට මෙසේ අවවාද දෙති. "පින්වත්නි, පූර්‍ව දිශාවෙහි ද, පශ්චිම දිශාවෙහි ද, උතුරු දිශාවෙහි ද, දකුණු දිශාවෙහි ද යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත්නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු ඉවත් කරව්. හිරිහැර කිරීම් මරණයට පැමිණවීම් නො කරව්" යැයි කියා යොදුන් සිය ගණන් ඈත සිටින සත්වයන් කෙරෙහි කරුණාව අනුකම්පාව දක්වා සමහර සත්වයන් කෙරෙහි අකරුණාව අනනුකම්පාව පිණිස සමාදන් කරවත්. ඔවුහු පොහෝ දිනයන්හි තම ශ්‍රාවකයන්ට මෙසේ කියත්. "පින්වත් පුරුෂය, මම සියලු වස්ත්‍ර ඉවත් කොට වාසය කරමි. මට ඇතුළත හෝ පිටත හෝ කිසි තැනක එක් පිරිකරකින් වත් බාධාවක් නැත. පළිබෝධයක් නැත. මම සිඳළු පළිබෝධ ඇත්තෙක්මි" යැයි කියයි. එහෙත් ඔහු පසු දින මේ සියල්ල අන්‍යයන් නො දුන් නමුත් පරිභෝග කරයි. මෙසේ

අන්‍යයන් මුලා කොට ආහාර පාන ඇඳ පුටු ආදිය පරිභෝග කරති. මෙසේ අනුන් මුලා කොට කරන ලද්ද **නිගණ්ඨ උපොසථය** නම් වේ. මෙය ද මහත් ඵල මහත් ආනිශංස නො ලැබේ.

**ආර්‍ය උපෝසථය**-: යනු අනාගාමී රහත් ආර්‍යයන් විසින් දිවි හිමියෙන් රක්නා සීලය වූ උපෝසථ අෂ්ටාංග සීලයයි. එසේම යම් කෙනෙක් මෙම උපෝසථ සීලය සමාදන්ව රකී ද එය ද **ආර්‍යෝපෝසථය** නම් වේ.

බුදු සසුනෙහි ශ්‍රාවකත්වය ලැබූවහු විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං, සම්මා සම්බුද්ධ ආදී ගුණයන්ගෙන් යුක්ත යැයි බුදුගුණ භාවනාව වැඩීම කොට භාග්‍යවතුන් වහන්සේ සමග එක්ව වාසය කිරීමක් බඳු වෙයි ද මෙය **බ්‍රහ්ම උපෝසථය** නම් වේ. මෙහි බ්‍රහ්ම යනු බුදුරජාණන් වහන්සේට නාමයකි. ස්වාක්ඛාතා දී දහම් ගුණ සිහි කිරීම කොට ධර්‍මය හා එක්ව විසීමක් බඳු වෙයි ද මෙය **ධර්‍ම උපෝසථය** නම් වේ. සුපටිපන්නා දී සඟ ගුණ සිහි කිරීම කොට සංඝයා හා එක්ව විසීමක් බඳු වෙයි ද මෙය **සංඝ උපෝසථය** නම් වේ.

තමන් සමාදන්ව ගත් කඩ නොවූ නො කැලැල් තෘෂ්ණාවෙන් තොර වූ සමාධිය පිණිස පවත්නා තමාගේ සීලය සිහි කිරීම **සීල උපෝසථය** නම් වේ.

චාතුර්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුෂිතය, නිර්‍මාණරතිය, පරනිර්මිතවසවර්තිය යන සදිව්‍ය ලෝකවල දෙවියෝ ද, එයින් මත්තෙහි වූ බ්‍රහ්ම ලෝකවල වූ බ්‍රහ්මයෝ ද යම් බඳු වූ ශ්‍රද්ධාවකින් ඒ දෙව්ලොව බඹලොව උපන්නාහු ද මට ද එබඳු වූ ශ්‍රද්ධාවක් - සීලයක්- ශ්‍රැතයක්- ත්‍යාගයක්- ප්‍රඥාවක් ඇත යැයි දෙවියන්ගේ ශ්‍රද්ධා සීලාදී ගුණ සිහි කිරීම කොට සංඝයා හා එක්ව විසීමක් බඳු වෙයි ද මෙය **දේවතා උපෝසථය** නම් වේ.

එසේම රහතන් වහන්සේලා දිවි හිමියෙන් ප්‍රාණඝාතය, අදත්තාදනය, අබ්‍රහ්මචර්‍යාව, මුසාවාදය, සුරා පානය, විකාලභෝජනය, නැටීම-ගැයීම-වාදනය කිරීම- රඟ දැක්වීම් බැලීම,

මල් සුවඳ හා අනෙකුත් සුවඳ වර්‍ග ඇඟ ගැල්වීම- රන් රුවන් ආභරණ පැලඳීම- ශරීරයෙහි අඩු තැන් පිරවීම- පැහැපත් කිරීම- සැරසීම, උස් ආසන හා මහ ආසනයන් පරිභෝගයෙන් වෙන් ව වසති. මම ද ප්‍රාණඝාතය, අදත්තාදනය, අබ්‍රහ්මචර්‍යාව, මුසාවාදය, සුරා පානය, විකාලභෝජනය, නැටීම-ගැයීම-වාදනය කිරීම- රඟ දැක්වීම් බැලීම, මල් සුවඳ හා අනෙකුත් සුවඳ වර්‍ග ඇඟ ගැල්වීම- රන් රුවන් ආභරණ පැලඳීම- ශරීරයෙහි අඩු තැන් පිරවීම- පැහැපත් කිරීම- සැරසීම, උස් ආසන හා මහ ආසනයන් පරිභෝගයෙන් වෙන් ව රහතුන් අනුව යමි. ආර්‍ය උපෝසථ සීලය රකිමි යැයි අධිෂ්ඨාන කොට ගෙන එය සමාදන්ව රැකිය යුතුය. මෙසේ වූ ආර්‍ය උපෝසථ සීලය සමාදන්ව රැකීම මහත් ඵල මහත් ආනිශංස ලැබීමට හේතු වේ. මහත් බැබළීම ඇත්තේ වේ. එහි ශික්‍ෂාපද සමාදනය මෙසේ ය.

සිල් ඉල්ලීමේ වාක්‍යය.

**ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං අට්ඨංග සමන්නාගතං උපෝසථ සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ.**

**දුතියම්පි---තතියම්පි අහං භන්තෙ, තිසරණෙන සද්ධිං අට්ඨංග සමන්නාගතං උපෝසථ සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ. අනුකම්පං උපාදය.**

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
2. **අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
3. **අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
4. **මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
5. **සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
6. **විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
7. **නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**

8. **උච්චාසයන මාහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**

**ප්‍රාණඝාත, අදත්තාදන, මුසාවාද, සුරාමෙර** යන සිකපදයන්හි විවරණය පඤ්ච සීලය පිළිබඳ විවරණයෙහි ඇත. ඉතිරි සිකපදයන්හි විවරණය මෙසේ ය.

## ❄ අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

**අබ්‍රහ්මචරියන්ති අසෙට්ඨචරියං**= බුද්ධාදී උතුමන් විසින් පිළිකුල් කරන ලද පහත් වූ ලාමක වූ නින්දිත වූ හැසිරීම අබ්‍රහ්මචරියාව නම් වේ. මෙයින් මෛථුන ධර්මය අදහස් කරන ලදි.

**බ්‍රහ්මන්ති**= **සෙට්ඨං උත්තමං විසුද්ධං**:- යන මෙහි බ්‍රහ්ම යන්නෙන් ශ්‍රේෂ්ඨ උත්තම විශුද්ධ යන අර්ථ කියවේ.

**චරිතන්ති චරියා**= හැසිරීම ක්‍රියා කිරීම චරියා නම් වේ. මෙහි චරියා යන්නෙන් පාරමිතා සංඛ්‍යාත දන සීල භාවනාමය ප්‍රතිපත්තියෙහි හැසිරීම කියන ලදි. මෙහි **ඉරියාපථචරියා, ආයතනචරියා, සතිචරියා, සමාධිචරියා, ඤාණචරියා, මග්ගචරියා, පත්තිචරියා, ලොකත්ථචරියා** චරියා අටකි.

සතර ඉරියව්ව සිහි නුවණින් විසීම **ඉරියාපථචරියා** නම් වේ. ඉන්ද්‍රිය සංවරය **ආයතනචරියා** නම් වේ. සතර සතිපට්ඨානයෙහි යෙදීම **සතිචරියා** නම් වේ. ධ්‍යාන භාවනාවෙහි යෙදීම **සමාධිචරියා** නම් වේ. ආර්‍ය්‍ය සත්‍ය විදර්ශනාව **ඤාණචරියා** නම් වේ. සෝවාන් ආදී මාර්ගයන්ට පැමිණීම **මග්ගචරියා** නම් වේ. සෝවාන් ආදී ඵලයන්ට පැමිණීම **පත්තිචරියා** නම් වේ. බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා සත්වානුකම්පාවෙන් ලෝ වැඩ කිරීම **ලොකත්ථචරියා** නම් වේ.

**සෙට්ඨෙන බ්‍රහ්මභූතානං බුද්ධ-පච්චෙකබුද්ධ-බුද්ධසාවකානං චරියතො බ්‍රහ්මචරියන්ති වුච්චති.** යන මේ නිරුක්තිය අනුව

බ්‍රහ්මචරියාව යනු උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් ගත් කල්හි මෛථුන ධර්මයෙන් ද, රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්ච කාමයන් ගෙන් ද සම්පූර්ණයෙන් වැළකී පිරිය යුතු වූ, බුදු පසේබුදු බුද්ධ ශ්‍රාවක උතුමන් වහන්සේලාට අයත් වූ ශ්‍රේෂ්ඨ චර්යාව වන ආර්ය මාර්ග ප්‍රතිපදාව හඳුන්වන විශේෂ නාමයකි.

තව ද **"බ්‍රහ්මචරියන්ති සික්ඛාත්තයසඞ්ගහිතං සකලං සාසනබ්‍රහ්මචරියං"** යන්නෙන් අධි සීල අධිචිත්ත අධිපඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් සංගෘහිත වූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් විසින් පිරිය යුතු ශාසන ප්‍රතිපත්ති මාර්ගය අදහස් කරන ලදි. තව ද **"බ්‍රහ්මචරියන්ති මෙථුනවිරති"** යන මෙහි මෛථුනයෙන් වැළකීම ම බ්‍රහ්මචර්යාව යනුවෙන් අදහස් කරන ලදි. මේ කියන ලද්දේ උත්කෘෂ්ට පරිච්ඡේදයෙනි.

**"බ්‍රහ්මචරිය සද්දො දානෙ වෙය්‍යාවච්චෙ පඤ්චසික්ඛාපදසීලෙ අප්පමඤ්ඤාසු මෙථුනවිරතියං සදාරසන්තොසෙ විරියෙ උපොසථඞ්ගෙසු අරියමග්ගෙ සාසනෙති ඉමෙසවත්ථෙසු දිස්සති"** තව ද මේ බ්‍රහ්මචර්යාව යන්නෙහි විවිධ අර්ථ කුශලතා දක්වයි. ඒ අතර දන් දීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. වතාවත් කිරීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. පන්සිල් රැකීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. කරුණා-මුදිතා භාවනා වැඩීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. මෛථුනයෙන් වැළකීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. තම භාර්යාවගෙන් සතුටු වීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. කුසල වීර්ය ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. උපෝසථ සිල්(අටසිල්, දසසිල්) රැකීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. ආර්ය මාර්ගය ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. සීල සමාධි ප්‍රඥා සංඛ්‍යාත බුද්ධානුශාසනාව ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. ගිහිව වාසය කරන්නෙකු විසින් වුව ද මෙසේ බ්‍රහ්මචරියක පඤ්ච සීලය කලින් කලට හෝ සමාදන්ව පුරුදු කර ගැනීමෙන් පහසුවෙන් ආත්ම දමනය සිදු කළ හැකි වේ.

**"වෙරමණී"** යන්නෙහි **"වෙරං මණතීති වෙරමණී"** වෛරය දුරු කරන්නේනුයි **"වෙරමණී"** නම් වේ. මෙයින් කාම මිථ්‍යාචාරයෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. **"සික්ඛාපදං"** යන මෙහි සත්ව ඝාතනාදී වැරදි අතහැරීම, හික්මීම,

සංවර වීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් "**පද**" නම් වේ. මෙසේ නිස්සරණාධ්‍යාශයෙන් යුතුව ප්‍රාණඝාතයෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින් ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීමෙන් ද, යම් හේතුවකින් සිල් බිඳුනේ නම් වහාම එය සමාදන්ව ආයති සංවරයෙහි පිහිටීමෙන් ද **අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤූපසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික** වශයෙන් ගෞරව සම්ප්‍රයුක්තව රැකීම "**සමාදියාමි**" නම් වේ.

## ❄ විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

"**විකාලභොජනා**" යන මෙහි "**විකාල**" යනු ඉර මුදුන් වූ තැන් පටන් පසු ද අරුණ නැගීම දක්වා වූ කාලයයි. "**භොජන**" යනු "**භුඤ්ජියතීති භොජනං**" බුදිනු ලබන හෙවත් වළඳනු ලබන දෙය භොජන නම් වේ. මෙයට "**ආහාර**" යැයි ද කියනු ලැබේ. "**ආහරතීති ආහාරො**" (අන්‍යයන්ට යැපීමට) තම ඵලය එළවන බැවින් "**ආහාර**" නම් වේ. මෙය අතින් පිඬු කොට ගෙන වළඳන බැවින් "**කබලිංකාර ආහාරය**" නම් වේ. මේ කබලිංකාර ආහාරය "**ඕදනො, සත්තු, කුම්මාසො, මච්ඡො, මංසං**" යනුවෙන් ප්‍රධාන වශයෙන් කොටස් පහකි.

එහි "**ඕදන**" යනු හැල් වී හා අනෙකුත් වී වර්ග, යව, බාර්ලි, මෙනේරි, තණ හාල්, අමු, වර, තිරිඟු, ගෝධුම, රසාල යන සහල් වර්ගවලින් නිපදවන ලද බත් ය. "**සත්තු**" යනු හැල්, වී, යව ධාන්‍යවල බැදි පිටි ය. වර්තමාන ලෝකයෙහි ඇති බිස්කෝතු කේක් වැනි සියලු ආහාර වර්ග මෙහි ඇතුළත් වේ. "**කුම්මාස**" යනු යව කුරක්කන් සහල් තිරිඟු ආදී පිටිවලින් ආදියෙන් නිපදවන පිට්ටු ය. "**මංස**" යනු අලි

මස්, කොටි මස්, වලස් මස්, කලු වලස් මස්, සිංහ මස්, අශ්ව මස්, බලු මස්, සර්ප මස්, ව්‍යාඝ්‍ර මස්, මිනී මස් යන මස් වර්ග දසය හැර අන් සියලු මස් වර්ග කැප වේ. "**මච්ඡ**" යනු දියෙහි උපදින සියලු මත්ස්‍ය වර්ගයන් ය. තව ද එළකිරි පිටි කිරි ආදී සියලු කිරි වර්ග ද, තැඹිලි පොල් වතුර ද, තල් පොල් පැණි හකුරු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ද අනුභව කරන්නාට විකාල භෝජනය සිදු වේ. තව ද කිරි පිටි වැනි දෑ මිශ්‍ර කොට සාදන ලද ටොෆී වැනි දෑ ද සුදුසු නැත.

උදේ ආහාරය දිවා ආහාරය හා රාත්‍රී ආහාරය යැයි දිනකට මනුෂ්‍යයන් ආහාර අනුභව කරන කාල තුනකි. එයින් පෙරවරු ආහාරය අරුණ පටන් මධ්‍යාහ්නය දක්වා දස වරක් අනුභව කළේ නමුත් එය එක් ආහාරයක් ගැනීම් අර්ථයෙන් "**එකභත්තික**" (එක බතක්) නම් වේ. ඉර අවරට ගිය තැන් පටන් අනුභව කරන භෝජනය විකාල භෝජනය නම් වේ. එය දහවල් හා රාත්‍රී වශයෙන් දෙකකි. විකාල භෝජනය යනාර්ථයෙන් එකකි. මෙසේ තුන් වේල ආහාර ගැනීම සංසාරයෙහි බොහෝ කලක් පුරුදු කරන ලද්දකි. ඉතා සියුමැළි ව සැපෙන් වැඩුණු දිනකට තුන් වේල ආහාර අනුභව කළ ඇතමකුට එක් වරම දහවල් හා රාත්‍රී ආහාර වේල් දෙක අතහැරිය නොහැකි වූ බැවින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමයෙන් දහවල් ආහාරය වළක්වා පසුව රාත්‍රී ආහාරය වැළැක්වූ සේක. රාත්‍රී කාලය මනුෂ්‍යයන් නිදා ගන්නා කාලයයි. එසේම රාත්‍රියෙහි ගමන් යාම ද පහසු නොවේ. මේ හේතුවෙන් බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා රාත්‍රී භෝජනයෙන් වැළකුණාහු වෙති. මෙසේ පාලනය කොට ආහාර ගැනීමෙන් නිරෝගී බව ද නිදුක් බව ද සැහැල්ලු පැවැත්ම ද කාය බලය ද සුවසේ වාසය ද සිදු වේ. වර්තමානයෙහි රසයට ගිජු වීම හා පමණ නො දන ආහාර ගැනීම හේතුවෙන් බොහෝ දෙනා නොයෙක් රෝගාබාධයන්ට ලක්ව ඇත. එබැවින් පමණ දන ආහාර ගැනීම ඉතා වැදගත් වේ.

විකාල භොජන සිකපදය සමාදන් වූවහුට විකාලයෙහි දී පැමිණෙන වේදනා අපහසුතා ආබාධ වළක්වා ගැනීමට පලතුරු යුෂ වැනි දෑ පරිභෝග කිරීමට අනු දන වදාළ සේක. ඒවා අෂ්ටපාන නම් වේ. එනම් "**අම්බපාන, ජම්බුපාන, චොචපාන, මොචපාන, මධුපාන, මුද්දිකපාන, සාලුකපාන, ඵාරුසකපාන**" යන මේ අටයි.

"**අම්බපාන**" යනු අඹ යුෂවලින් සකසන ලද පානය. "**ජම්බුපාන**" යනු ජම්බු, දඹ වැනි ගෙඩිවල යුෂයෙන් සාදන ලද පානය. "**චොචපාන**" යනු ඉදුණු ඇට කෙසෙල් ගෙඩිවලින් සාදන ලද පානය. "**මොචපාන**" යනු අනෙක් වර්ගවල ඉදුණු කෙසෙල් ගෙඩිවලින් සාදන ලද පානය. "**මධුපාන**" යනු මී පැණි හා අමු මුද්‍රප්පලම් වලින් සාදන ලද පානය. "**මුද්දිකපාන**" යනු වියලි මුද්‍රප්පලම් වලින් සාදන ලද පානය. "**සාලුකපාන**" යනු  ඕලු ගෙඩිවලින් සාදන ලද පානය. "**ඵාරුසකපාන**" යනු උගුරැස්ස ගෙඩිවලින් සාදන ලද පානය.

තවද දෙහි දෙඩම් බෙලි, පේර, රට ඉඳි ආදී කුඩා පලතුරුවලින් කළ පාන වර්ග සියල්ල කැප ය. මේ පාන වර්ග සැකසීමේ දී ඇල් දියෙන් හෝ අව්වෙන් රත් වූ දියෙන් සකසා ගැනීම කැප ය. උණු දියෙන් කිරීම අකැප ය. පැපොල් වැළ වරකා ආදී මහ පලතුරුවලින් කරන ලද්ද අකැප වේ. එසේම තේ කෝපි හා අනෙකුත් ඖෂධ වර්ග ද බටර්, වෙඬරු, ගිතෙල් තලතෙල්, මී පැණි, හකුරු ද, චතුමධුර ද කැප වේ. උණු පැන් සිසිල් පැන් සැම කල්හි ම කැප ය.

## ❄ නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

යන මෙහි "**නච්ච**" යනු නැටීම, නර්තනය, රංගනය යන මේවා ය. උපෝසථ සිල් සමාදන් වූවහුට අඩුම තරමින් මොනර නැටුමක් හෝ බැලීමට නො හැකි ය.

"**ගීත**" යනු භක්ති ගීත, ගීත, කවි, ශ්ලෝක ආදියයි. බුද්ධ වචනය වූ ත්‍රිපිටක ධර්මයට අයත් කිසිවක් ගීත ස්වරයෙන් නො කිය යුතු ය. ගීත ස්වරය පිළිබඳව අංගුත්තර නිකාය පඤ්චක නිපාත අනාගත භය වර්ගයෙහි නවවන සූත්‍රයෙහි මෙසේ දක්වේ.

මහණෙනි, අනාගත කාලයෙහි මාගේ ශ්‍රාවක වූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් සිත කය වචනය දමනය නොකරන ලද්දහු වෙති. මෙසේ ඉන්ද්‍රිය සංවරය නැති වීමෙන් ධ්‍යාන භාවනා, විදර්ශනා භාවනා වැඩීමට නො හැකි වූවන් වෙති. ඒ හේතුවෙන් සතර මාර්ග සතර ඵල නිවන යන නව ලෝකෝත්තර ධර්ම ප්‍රතිසංයුක්ත වූ ගැඹුරු අර්ථ විවරණ ඇති ත්‍රිපිටක බුද්ධ වචනය හා අට්ඨකථාවන්හි අන්තර්ගත වූ පඤ්චස්කන්ධ, පඨවි ආපෝ ආදී ධාතු, ඇස කණ ආදී ආයතන පටිච්ච සමුප්පාද හේතුඵල ධර්ම වශයෙන් බෙද දක්වන ලද ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර ධර්ම ආදිය දෙසනු ලබන කල්හි ඒවා ඇසීමට අකමැති වෙති. කන යොමු නොකරති. එබඳු ධර්ම ඥානය ලැබුමට අකමැති වෙති. උගත යුතු යැයි නො සිතති. කවියන් විසින් ගොතන ලද විසිතුරු යෙදුම් ඇතිව ගීත ස්වරූපයෙන් කියන දහම් ඇසීමට කැමති වෙති. ඒවා දන ඉගෙන ගැනීමට සිතති. මෙසේ පරම්පරා දෙක තුනක් යෑමෙන් මා විසින් අපමණ කලක් දුක් විඳ අවබෝධ කරගත් සාරවත් ධර්ම සාරය වැළලී යයි. ලොවෙන් අතුරුදහන් ව යයි. මෙසේ වූ භයක් අනාගතයෙහි වන්නේ ය. එබැවින් නුඹලා විසින් එසේ නො කිරීමට වග බලා ගත යුතු ය යැයි මෙසේ වදාළ සේක.

"**වාදිත**" යනු සංගීත භාණ්ඩ වාදන කිරීමයි. "**විසූකදස්සන**" යනු සිතෙහි කෙලෙස් වැඩීමට හේතුවන කුසල් සිත විනාශ වන විෂම දේවල් බැලීමයි. ඒවා නම් නැටීම, ගී කීම, බෙර ආදිය වාදනය, බොහෝ නළු නිළියන් රැස්ව කරන නැටුම්, රාමායනය ආදී කථා කීම, තාලම් ගැසීම, ඇත් පොර, අශ්ව පොර, මී හරකුන් ගේ පොර, එළ හරකුන් ගේ පොර, එළු පොර, බැටළු පොර, කුකුළු පොර, වටු පොර, පොලුවලින් කරන පොර, මිටින් කරන පොර, මල්ලව පොර, සෙබළුන්ගේ යුද්ධ, යුධ සේනා ගණින තැන්, සේනා රැස් වන තැන්, ඇත්- අස්- රථ- පාබළ බල ඇණි බැලීම යනාදියයි. මේවා තමන් සිටින තැනකට පෙනුණු විටෙක දී එය බලා සිටීමෙන් සීලය නො බිඳෙයි. නැවත එය බැලීම පිණිස හැරි හැරී බැලීමෙන් ද පියවරක් හෝ ඉදිරියට ගොස් බැලීමෙන් ද සීලය බිඳීම සිදු වේ.

"**මාලාගන්ධවිලෙපන**" යන මෙහි "**මාලා**" යනු වර්ණ ගන්ධ සම්පන්න මල් වර්ගයි. "**ගන්ධ**" යනු මල්, කොළ, ගෙඩි, පොතු, මුල්, කඳ, වැනි සුවඳ ජාතීහු ය. "**විලෙපන**" යනු ශරීරාලංකාරය පිණිස හා

සුවඳවත් වීම පිණිස එවැනි දේවල් ද විලවුන් වගී ද, ඇඟ ගැල්වීම හා ඇඳුම්වලට යෙදීම හා සුවඳ දුම් වගී ඇල්ලීමයි.

"**ධාරණ**" යනු අලංකාරය පිණිස රන් රිදී මුතු මැණික් පළිඟු පබළු වැනි දෑ අලංකාරය පිණිස හා මහන්තත්වය පිණිස දැරීම හෙවත් පැලඳීමයි. "**මණ්ඩන**" යනු ශරීරයෙහි අඩු තැන් පිරවීම සඳහා යම් යම් දෑ ආලේප කිරීම හා ආභරණ ආදියෙන් සැරසීමයි. ශරීරයෙහි අඩු තැන් පිරවීම පිණිස ආහාර පාන වැළඳීම ද නොකළ යුතු ය. "**විභූසනං**" යනු පැහැය පිණිස හා සුවඳ පිණිස ඉහත කී දෑ කැමති වීම හෙවත් සිතින් ඉවසීමයි. "**ඨාණං**" යනු මේ ඉහත කී නැටීම ගී කීම වාදනය කිරීමාදිය කිරීමේ චේතනාව ඇති බව හා ඒ ඒ දේවල් කිරීමයි. මේවායින් වැළකීමේ චේතනාව "**වෙරමණී**" නම් වේ. කයින් වචනයෙන් වරදට නො පැමිණ සංවර වීම "**සික්ඛා**" නම් වේ. මෙසේ සංවර වී කුසල් වැඩීම නිවනට මාර්ගය වීම "**පද**" නම් වේ. නැවත නැවත එම කුශලතා පුරුදු කිරීම ප්‍රගුණ කිරීම "**සමාදියාමි**"නම් වේ.

## ❄ උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

"**උච්චාසයන**" යන මෙහි "**උච්ච**" යනු මිටි රියනකට වඩා උස් වූ "**ආසන්දි**" නම් වූ ආසන විශේෂයකි. මිටි රියන යනු අතේ ඇඟිලි මිට මොලවා ගත් කල්හි වැළමිට දක්වා වූ වියත් දෙකක් පමණ උස ඇති ආසන මෙයින් කියවේ. "**සයන**" යනු නිදන හිඳින ඇඳ පුටු ආදියයි. බුද්ධ කාලයෙහි උස් ආසන ගරු කොට සැලකූ බැවින් ද පරිහරණයේ දී අනතුරු සිදු විය හැකි බැවින් ද උස් ආසන පරිහරණය වළක්වා ඇත්තේ ය. මෙසේ උස් ආසන ඇති විට එහි වැඩි කොටස කපා දමා හෝ පොළොවෙහි යට කොට හෝ පරිභෝග කළ හැකිය.

"**මහාසයන**" යනු වටිනා කමින් වැඩි වූ අලංකාරමත් වූ ඉතා සුව පහසුව ඇති "**පල්ලඞ්ක, ගොණක, චිත්තක, පටිකා, පටලිකා, තූලිකා, විකතිකා, උද්දලොමි, එකන්තලොමි, කට්ඨිස්ස, කොසෙය්‍ය,**

**කුත්තක, හත්ථත්ථර, අස්සත්ථර, රථත්ථර, අජිනප්පවෙණි, කදලිමිගපවර පච්චත්තරණ, සඋත්තරච්ඡද උභතොලොහිතකූපධාන**" යන මේවා ය.

එහි "**පලලඞ්ක**" යනු පාදයන්හි සිංහ ව්‍යාඝ්‍රාදී සත්ව රූප යොද කළ ඇඳ පුටු ය. "**ගොණක**" යනු සතරඟුලකට වඩා දික් වූ එළු ලොම්වලින් කළ ඇතිරිලි ය. "**චිත්තක**" යනු එළු ලොම්වලින් විසිතුරු කොට වියන ලද ඇතිරිලි ය. "**පටිකා**" යනු එළු ලොමින් කළ සුදු ඇතිරිලි ය. "**පටලිකා**" යනු ඝනට මල් ඇතිව කළ එළු ලොම් ඇතිරිලි ය. "**තූලිකා**" යනු පුළුන් පුරවා කළ ඇතිරිලි ය. "**විකතිකා**" යනු සිංහ ව්‍යාඝ්‍රාදී රූපවලින් විසිතුරු කළ ඇතිරිලි ය. "**උද්දලොමි**" යනු එක් පැත්තක ලොම් මතු ව ඇති සත්ව ලොම්වලින් කළ ඇතිරිලි ය. "**එකන්තලොමි**" යනු දෙපස ම ලොම් මතු ව ඇති ඇතිරිලි ය. "**කට්ඨිස්ස**" යනු රන් නූලෙන් විසිතුරු කළ තිහිරි නූලෙන් කළ ඇතිරිලි ය. "**කොසෙය්‍ය**" යනු රන් නූලෙන් විසිතුරු කළ පට පණු නූලෙන් කළ ඇතිරිලි ය. "**කුත්තක**" යනු නාටිකාවන් සොළොස් දෙනෙකුට නැටීමට ප්‍රමාණවත් වූ එළු ලොමින් කළ ඇතිරිලි ය. "**හත්ථත්ථර**" යනු ඇතු පිට අතුරන ඇතිරිලි ය. "**අස්සත්ථර**" යනු අසු පිට අතුරන ඇතිරිලි ය. "**රථත්ථර**" යනු රථයෙහි අතුරන ඇතිරිය ය. "**අජිනප්පවෙණි**" යනු ඇඳේ ප්‍රමාණයට අඳුන් දිවි සමින් කළ ඇතිරිලි ය. "**කදලිමිගපවර පච්චත්තරණ**" යනු කදලිමිග නම් වූ මුවන්ගේ සමින් කළ උතුම් ඇතිරිලි ය. "**සඋත්තරච්ඡද උභතොලොහිතකූපධාන**" යනු රතු වියන් ඇති හිස සහ පාද තැබීමට දෙපස රතු කොට්ට තබන ලද ඇඳ (කවිච්චිය) යන මේවා ය. මේ කිය ලද දේවල් හැර කොහු මෙට්ට ද, ඒ හා සමාන අනෙක් මෙට්ට ද ගුදිරි ද පාවිච්චිය කැප වේ. පුළුන් යෙදූ කොට්ට මෙට්ට හිස තැබීමට කැප ය. හිඳීමට නිදීමට අකැප ය.

උච්චාසයන මහාසයන පරිභෝගයෙන් වැළකීමේ චේතනාව "**වෙරමණී**" නම් වේ. කයින් වචනයෙන් වරදට නො පැමිණ සංවර වීම "**සික්ඛා**" නම් වෙ. මෙසේ සංවර ව කුසල් වැඩීම නිවනට මාර්ගය වීම "**පද**" නම් වේ. නැවත නැවත එම කුශලතා පුරුදු කිරීම ප්‍රගුණ කිරීම "**සමාදියාමි**" නම් වේ.

# 13.නවාංග උපෝසථ සීලය

අෂ්ටාංග උපෝසථ සීලයෙහි එන සිකපදයන්ට තවත් සිකපදයක් එකතු වීමෙන් සිකපද නවයක් වීම නවාංගුපෝසථ සීලය නම් වේ. එවා මෙසේ ය.

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
2. **අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
3. **අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
4. **මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
5. **සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
6. **විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
7. **නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
8. **උච්චාසයන මාහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
9. **සබ්බ සත්තෙසු මෙත්තා සහගතෙන චෙතසා විහරණං සමාදියාමි.**

මුල් සිකපද අටෙහි අර්ථ අෂ්ටාංගුපෝසථ සීලයෙහි දී විස්තර කරන ලදි. නවවැන්නෙහි අර්ථ මෙසේ ය. සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී සහගත සිතින් විසීම සමාදන් වෙමි යැයි යනු එහි තේරුම යි.

නො හික්මුණු ජනයන් ගේ යහපත අභිවෘද්ධිය කැමති වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ඔවුනොවුන් ගේ සුහදත්වය හා ආරක්‍ෂාව ඇතිවන හෙයින් ද, නිවනට මාර්ගයක් වන පහසු කමටහනක් වන හෙයින් ද මෛත්‍රිය ශික්‍ෂා පදයක් වශයෙන් සමාදන් වීම උදෙසා මේ සීලය වදාළ සේක.

# 14. ගහට්ඨ දස සීලය

ගිහි පින්වතුන්ට සමාදන් විය හැකි උසස් ම සීලය ගහට්ඨ දස සීලයයි. බෞද්ධයන් විසින් සාමාන්‍ය ජීවිතයෙහි දී දෛනික ව පඤ්ච සීලය හෝ ආජීව අෂ්ටමක සීලය සමාදන්ව රැකීම **"සීල"** නම් වේ. ගෘහ කටයුතුවලින් වෙන් ව සමාදන්ව රැකිය යුතු බැවින් උපෝසථ සීලය "**අධි සීල**" නම් වේ. ගහට්ඨ දස සීලය මෙසේ ය.

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
2. **අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
3. **අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
4. **මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
5. **සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
6. **විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
7. **නච්ච ගීත වාදිත විසූකදස්සනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
8. **මාලාගන්ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
9. **උච්චාසයන මාහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**
10. **ජාත රූප රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.**

උපෝසථ අෂ්ටාංග සීලයෙහි දී මුල් සිකපද නවයෙහි විස්තර කියන ලදි. අෂ්ටාංග සීලයෙහි ඇති සත් වන සිකපදය දස සීලයෙහි දී සිකපද දෙකකට බෙදී ඇත. අට සිල් සමාදන් වූවහුට නැටීම ගී කීමාදිය කළ නොහැකි බව එයින් කියන ලදි. දස සීලයෙහි ඇති විශේෂත්වය තමන්ට ඒවා නොකළ හැකි වන්නා සේම අන්‍යයන් ඒවායෙහි යෙදවීම ඒවාට දිරි ගැන්වීම ඒවා පිළිබඳව කථා කිරීම නොකළ යුතු ය. සම්පූර්ණයෙන් වැළකිය යුතු ය. දසවන සිකපදයෙහි අර්ථ විවරණය මෙසේ ය.

**"ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** යන මෙහි **"ජාතරූප"** යනු රන් ය. **"රජත"** යනු රිදීය. තව ද රජත යන්නෙන් **කහාපණක, ලොහමාසක, ජතුමාසක, දරුමාසක** යන මේවා කියවේ. එහි **"කහාපණ"** යනු කහවණු ය. **"ලොහමාසක"** යනු තඹ ආදි ලෝහයෙන් කරන ලද සම්මත මුදල් වර්ගයන් ය. **"ජතුමාසක"** යනු ලාකඩ හා ලාටු මැලියම් වර්ගවලින් රූප යොදා කරන ලද සම්මත මුදල් වර්ගයන් ය. **"දරුමාසක"** යනු ශක්තිමත් අරටු වලින් හෝ උණ පතුරුවලින් හෝ තල් කොළ වැනි කොළ වර්ගවලින් හෝ රූප ඇඳ කරන ලද සම්මත මුදල් වර්ගයන් ය. **"පටිග්ගහණා"** යනු පිළිගැනීමයි. එය තමන් විසින් සියතින් පිළිගැනීමෙන් ද, තමා වෙනුවෙන් අන්‍යයන් ලවා ගැන්වීමෙන් ද, තමා ඉදිරියෙහි තබන ලද්දක් සිතින් ඉවසීමෙන් ද සිදු වේ. මෙසේ මිල මුදල් පිළිගැනීමෙන් වැළකීමේ චේතනාව **"වෙරමණී"** නම් වේ. කයින් වචනයෙන් වරදට නො පැමිණ සංවර වීම **"සික්ඛා"** නම් වෙ. මෙසේ සංවර ව කුසල් වැඩීම නිවනට මාර්ගය වීම **"පද"** නම් වේ. නැවත නැවත එම කුශලතා පුරුදු කිරීම ප්‍රගුණ කිරීම **"සමාදියාමි"** නම් වේ.

# 15. උපෝසථ සීලයෙහි පිහිටිය යුතු ආකාරය

ඉහත විස්තර කරන ලද අෂ්ටාංග සීලය හා දස සීලය සමාදන් වන්නහු විසින් පෙහෙවස් සමාදන් වීමට පෙර දින තමා විසින් කළ යුතු කටයුතු අවසන් කිරීමෙන් හෝ මේ මේ දෙය මෙසේ කරව් යැයි කියා ආහාර සැපයීම් ආදී කෘත්‍යයන් නියමිත අයට පැවරීමෙන් හෝ ඒවා පසුවට කල් තැබීමෙන් හෝ තමන් ඒ සියල්ලෙන් නිදහස් විය යුතු ය. තව ද කයෙහි ආභරණ පළඳා ඇත් නම් ඒවා ශරීරයෙන් බැහැර කොට තැබිය යුතු ය. පසු ද අලුයම නැගිට මුහුණ කට දෝවනය කොට උණු පැන් ලීටරයක් පමණ පානය කොට වැසිකිළි කැසිකිලි ආදී ශරීර කෘත්‍යයන් සිදු කොට සුදු වතින් සැරසී වම් උරය වැසෙන සේ උතුරු සළුවක් පැළඳ හැකි නම් ආරණ්‍යයකට හෝ පන්සලකට ගොස් භික්ෂූන් වහන්සේ නමක් හෝ සාමණේරයන් වහන්සේ නමක් වෙත එළඹ අරුණ නැගීමෙන් පසුව සිල් සමාදන් විය යුතු ය. භික්ෂු සාමණේරයන් වහන්සේලා නැති විට

සීලය පිළිබඳව දැනුමැති උපාසකයෙකු හෝ උපාසිකාවක් වෙත එළඹ සිල් සමාදන් විය යුතු ය. සමාදන් වන විට ද සිතින් මුමුනන්නේ නැතිව හඬ නඟා සිල් සමාදන් විය යුතු ය. සිල් පද නො දන්නා වූ හා නො තේරෙන්නවුන් විසින් බුදු රජාණන් වහන්සේ විසින් පනවා වදළ උපෝසථය අධිෂ්ඨාන කරමි යැයි භික්ෂූන් වහන්සේ නමක් හෝ සාමණේරයන් වහන්සේ නමක් ඉදිරියෙහි ද, භික්ෂු සාමණේරයන් වහන්සේලා නැති විට උපාසකයෙකු හෝ උපාසිකාවක ඉදිරියෙහි කිව යුතු ය. එයින් සීලයෙහි පිහිටීම වේ. ඒ කිසිවෙකු නො ලබන්නකු විසින් තමා විසින් ම අධිෂ්ඨාන කළ යුතු ය. එය ද හඬ නගා කිව යුත්තේම ය. ආහාර පාන අන්‍යයන් විසින් පිළිගන්වන්නේ නම් ඔවුන් කෙරෙහි මෛත්‍රියෙන් ඒවා පරිභෝග කළ යුතු ය. නැතහොත් තමා විසින් ම කල් ඇතිව සියල්ල සූදානම් කොට තබා ගෙන ඒවායෙන් ආහාරය සකස් කර ගත යුතු ය. පෙහෙවස් වසන්නහු විසින් අන්‍යයන්ට බාධා වන ලෙස කායික වාචසික කටයුතු නොකළ යුතු ය. අයවැය ගණිමින් කල් නො ගෙවිය යුතු ය. තම නිවසෙහි සිට ම පෙහෙවස් වසන්නහු විසින් ගෘහ කර්මාන්තවලින් වෙන් ව සමාදන්ව ගත් සීලය ආවර්ජනා කරමින් වත් පිළිවෙත් කිරීම, බුද්ධ පූජා හා වන්දනා කිරීම, බුදුගුණ, මෛත්‍රී, අසුභ, මරණ සති ආදී භාවනාවක යෙදීම, ධර්ම ශ්‍රවණය කිරීම, ධර්ම සාකච්ඡා කිරීමාදී කුසල් පිරිය යුතු ය. ආහාර පාන, ගිලන්පස ආදිය පරිභෝගයෙහි දී ප්‍රත්‍යවේක්ෂා නුවණින් යුතුව ඒවා පූජා කරන්නවුන් කෙරෙහි මෛත්‍රියෙන් යුතුව පරිභෝග කළ යුතුය. සිල් සමාදන්ව දහවල් දවස පමණක් වෙසෙන්නේ නම් එය "**අර්ධ උපෝසථය**" නම් වේ. දවසක් පුරාවට සීලයෙහි පිහිටා සිටින්නවුන් විසින් පැය විසිහතරක් ම සීලයෙහි පිහිටා සිටිය යුතු ය. මේ සියල්ල පිළිබඳ වැඩි විස්තර **අති පූජනීය රේරුකානේ චන්දවිමල මහා නායක මාහිමිපාණන් වහන්සේ** විසින් රචිත "**පොහොය දිනය**" ග්‍රන්ථය බලා දත යුතු ය.

# 16.සීලයට හානිකර වූ අන්තරායක ධර්‍ම සිවුතිස

සීලයක පිහිටා එය මනාව රැකීම පහසු නොවේ. අපගේ සිතට පැමිණෙන ඇතැම් අරමුණු වලින් සමාදන්ව ගත් සිකපද බිඳීම ද සිදු විය හැකි ය. එලෙස සිල් බිඳීමට හේතුවන සීලයට අන්තරායකර ධර්‍ම තිස් සතරක් ඇත. ඒවා මෙසේ ය.

1. **කොධො** = ඊර්ෂ්‍යාව වෛරය තරහව ක්‍රෝධය මෙහි ලක්‍ෂණයොයි. එරමිණියා කටු අත්තක් කෙනෙකු ගේ පිටට දමා ඇදි කල්හි කටු සම තුළට වැඳී ඔහුට යන්නට නොදී නවත්වන්නාක් මෙන් කෝපාවිෂ්ට වූ සිත තම සතුරාට විරුද්ධ කාරයාට යන්නට ඉඩ නොදී ඇනුම් බැනුම් කියමින් නැවත නැවත එල්ලි එල්ලී යයි. මෙම ක්‍රෝධය තමන්ගේ ම සිතට ද කයට ද දේපළ වස්තූන්ට ද බොහෝ හානි ඇති කරවයි. අන්‍යයන්ගේ ද සිතට ද කයට ද දේපළ වස්තූන්ට ද බොහෝ හානි ඇති කරවයි. අන් සතු දේ පැහැර ගනියි. දාන සීල භාවනාදිය නවත්වයි. ප්‍රාණඝාතාදී අකුසල් වැඩෙන බැවින් ද, දාන සීල භාවනා දී කුසල් නසන හෙයින් ද ක්‍රෝධය ඉතා භයානක අකුසලයක් වේ.

2. **පලාසො** = ශ්‍රේෂ්ඨයන් හා සම කොට සිතන ගතිය **පලාස** නම් වේ. මේ හේතුවෙන් උගතුන් සිල්වතුන් ධනවතුන් හා තමන් සම කොට සිතා එලෙස පෙනී සිටීමට ගොස් වරදට පැමිණ සීල භේදයට පැමිණේ.

3. **ථම්භො** = යහපතට නො නැමෙන ගතිය **ථම්භ** නම් වේ. මවපිය ගුරුවර වැඩිහිටියන්ට, සිල්වතුන්ට, ගුණවතුන්ට, අවවාදයට නො හික්මෙන ධර්‍මයට, යුතුකමට නො නැමෙන මෝල් ගසක් මෙන් නො නැමෙන දළදඬු ගතිය මෙහි ලක්‍ෂණයි.

4. **මායා** = ඇති වරද සඟවන ස්වභාවය **මායාව** නම් වේ. අකුසල් කිරීමට ලැජ්ජාව බිය නැතිකමින් සැඟවී වැරදි කොට එය සඟවා තමන් සිල්වතෙක් ගුණවතෙක් වශයෙන් පෙන්වයි.

5. **සාඨෙය්‍ය** = කපටිකම **සාඨෙය්‍ය** නම් වේ. මෙයින් තමා තුළ නැති ගුණ ඇති ලෙසට පෙන්වයි. සිල් නො රැක සිල්වතෙකු ලෙස ද, දන් නොදී ත්‍යාගවන්තයෙකු ලෙස ද, භාවනා නො වඩා යෝගියෙකු ලෙස ද මේ ආදී ලෙසට අනුන් රවටා බොහෝ අකුසල් රැස් කරන ගතිය මෙහි ලක්ෂණයි.

6. **මච්ඡරි** = **මසුරුකම** යි. තමා ට ලැබෙන ලාභ අන්‍යයන් ලබනවාට, තමා විඳින සැප අන්‍යයන් විඳිනවාට, තමා උගතෙකු වී අන්‍යයන් එලෙස ඉගෙන ගන්නවාට අකමැති බව, විරුද්ධ බව මෙහි ලක්ෂණයි. තව ද තමාට ඇති දෙයින් අනුන් ප්‍රයෝජන ගන්නවාට, එයින් අන්‍යයන්ට යහපතක් වෙනවාට අකැමැති වේ. එබැවින් නො දෙයි.

7. **මාන** = අනුන් හා සම කොට මනින ස්වභාවය **මානය** නම් වේ. තම කුලවංශය, ධනය, උගත්කම, රූපවත් බව යනාදිය හේතු කොට තමන් අන්‍යයන්ට වඩා උසස් යැයි සිතීමෙන් සෙය්‍ය මානය උපදී. අන්‍යයන් හා සමාන යැයි සිතීමෙන් සදිස මානය උපදී. අන්‍යයන්ට වඩා පහත් යැයි සිතීමෙන් හීන මානය උපදී.

8. **අතිමානො** = අන්‍යයන්ට වඩා මම උසස් කෙනෙකු වෙමි යැයි සිතීම **අතිමානය** යි. ඒ හේතුවෙන් සිල්වතුන් ගුණවතුන් නැණවතුන් ඇසුරට අකමැති වෙයි. සිල්වතුන්ට ගුණවතුන්ට ඇනුම් බැනුම් ආදිය කියා අකුසල් කර ගනී.

9. **සාරම්භ** = එකට එක කිරීම, එකට එක කීම, පලි ගැනීම හෙවත් සුළු වරදකට වැඩි වරදක් කිරීම **සාරම්භය** යි.

10. **අසම්පජඤ්ඤ** = අසිහියෙන් අනුවණින් ක්‍රියා කිරීම **අසම්පජඤ්ඤය** යි. මෙයින් අනිත්‍ය වූ දෙය නිත්‍ය යැයි ගැනීමෙන් ද, දුක් වූ දෙය සැප යැයි ගැනීමෙන් ද, අනාත්ම වූ දෙය ආත්ම යැයි ගැනීමෙන් ද, අසුභ වූ දෙය සුභ යැයි ගැනීමෙන් ද, සත්ව පුද්ගල නොවූ දෙය සත්ව පුද්ගල වශයෙන් ගැනීමෙන් ද වරදවා ගැනීම සිදු වේ.

11. **දුබ්බච** = සිල්වතුන්ට ගුණවතුන්ට මව්පියන්ට වැඩිහිටියන්ට අවවාදයට අවනත නොවන නො හික්මෙන ස්වභාවය දුර්වච බව

නම් වේ.

12. **මද** = කොඩියක් මෙන් කොතක් මෙන් තමා අතිශයින් උසස් කෙනෙකු වශයෙන් සලකන්නා වූ ද, කළ යුත්ත නොකළ යුත්ත හොඳ නරක නො හඳුනන්නා වූ ද, ගරු බුහුමන් කළ යුත්තන් නො හඳුනන්නා වූ ද බලවත් මෝහය **මදය** නම් වේ. මෙය ජාති මද ගොත්ත මද ආදී වශයෙන් විසිහත් වැදෑරුම් වේ. ඒ පිළිබඳ විස්තර රේරුකානේ චන්දවිමල මහා නායක මාහිමිපාණන් වහන්සේගේ "**කෙලෙස් එක්දහස් පන්සියය**" පොතෙන් බලා ගත මැනවි.

13. **පමාද** = නිත්‍ය සීල, උපෝසථ සීල, දස පුණ්‍ය ක්‍රියා, දස පාරමී, සත් තිස් බෝධිපාක්ෂික ධර්‍ම, කය වචනය මනස යන තිදෙරින් සිදුකළ යුතු සුචරිත ධර්‍මයන්ට අකමැත්තා වූ ද පඤ්ච දුෂ්චරිත, දස අකුසල කර්‍මාදී දුෂ්චරිතයන්ට කැමැත්තා වූ ද ලක්‍ෂණය හෙවත් ස්වභාවය **ප්‍රමාදය** නම් වේ.

14. **අලසො** = තුනුරුවන් වැඳීම, වත් පිළිවෙත් කිරීම, ධර්‍ම ශ්‍රවණය, භාවනාව ආදියට සිත නො යොදන පසු බසින කුසීත කම **අලසකම** නම් වේ.

15. **මිච්ඡාදිට්ඨි** = වැරදි අදහස්, මත පිළිගැනීම - දැරීම **මිථ්‍යාදෘෂ්ටිය** යි. නිවැරදි වූ කායික වාචසික මානසික ක්‍රියාකාරකම් වැරදි යැයි ගැනීම ද, වැරදි වූ කායික වාචසික මානසික ක්‍රියාකාරකම් නිවැරදි යැයි ගැනීම ද මෙහි ලක්‍ෂණය වේ. මේ හේතුවෙන් බොහෝ අකුසල් සිදුවීම ද සිල් බිඳීම ද සිදු විය හැකිය.

16. **අහිරික** = පාපය පිළිකුල් නොකරන පව් කිරීමට ලැජ්ජා නැතිකම **අහිරික** නම් වේ.

17. **අනොත්තප්ප** = පව් කිරීමට බිය නොවන පව් කිරීම උසස් ක්‍රියාවක් වික්‍රමයක් කොට සැලකීම **අනොත්තප්පය** නම් වේ.

18. **මුට්ඨසති** = සිහියෙන් තොර බව සිහි මුළා බව **මුට්ඨසතිය** නම් වේ. කායික වාචසික මානසික සෑම ක්‍රියාවක දීම මෙය කුසල් ය, මෙය අකුසල් ය, මෙය වැරදිය, මෙය නිවැරදි ය යනාදී ලෙස සිහි කොට අයහපත් දෙය අත් හැරීම ද, යහපත් දෙය කිරීම ද

සිහියෙන් සිදු වේ. එසේ සිහි නොකිරීම මුලා වීම **අසිහිය** හෙවත් **මුට්ඨසතිය** නම් වේ.

19. **දුප්පඤ්ඤ** = අනුවණකම මෝඩකම **දුප්පඤ්ඤ** නම් වේ. මෙය දාන සීල භාවනා මාර්ග-ඵල පිළිබඳ අවබෝධය වළක්වයි. දුකින් නිදහස් වීමට ඉඩ නො දෙයි.

20. **පාපමිත්තතා** = පඤ්ච දුෂ්චරිතයන් කරන, දස අකුසල් කරන, දාන සීල භාවනා ධර්ම ශ්‍රවණාදී කුසල් නොකරන, ලාමක අදහස් ඇති, අපිරිසිදු කාය වාක් මනෝ දුසිරිත් ඇති ගිහි වූ ද, පැවිදි වූ ද පුද්ගලයෝ පාපී පුද්ගලයෝ ය. එබඳු අය ඇසුරු කිරීම **පාපමිත්‍රතාවය** යි.

21. **අරති** = කුසලයෙහි නො ඇලීම **අරතිය** නම් වේ. සීල සමාධි ප්‍රඥා වැඩීමටත් ආරණ්‍ය වෘක්ෂ මූල සේනාසන ඇසුරු කිරීමටත් පැවිද්දන්ට ඇතිවන අකමැත්ත නො සතුට හා සීල සමාදානය භාවනාව ධර්ම ශ්‍රවණය ආදියට ගිහියන්ට ඇතිවන අකමැත්ත මෙයින් සිදු වේ.

22. **ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා** = ඇස කන නාසය දිව ශරීරය මනස යන දොරටු සයෙහි සංවරය නැතිකම මෙයින් කියවේ. ඉන්ද්‍රිය සංවරය නිවන් මගෙහි ඇති ප්‍රධාන අංගයකි. ඉන්ද්‍රිය අසංවරය වැඩූ කුසලයෙන් ද වැඩීමට ඇති කුසලයන්ගෙන් ද පිරිහී සසරට අපා දුකට ඇද දමයි.

23. **අසද්ධතා** = රත්නත්‍රය නො පිළිගන්නා බව, විශ්වාස නොකරන බව **අශ්‍රද්ධාව** යි. නිවන් මග තහවුරු වීමට අත් නො හැර ඒ තුළ රඳා සිටීමට **ශ්‍රද්ධාව** ප්‍රධාන වේ. එය නැති කමින් නිවන් මගින් පහ වී මිථ්‍යාවන්ට හසු වී බොහෝ අකුසල් සිදු වී බොහෝ කලක් දුක් විඳීමට හේතු වේ.

24. **අසන්තුට්ඨිතා** = ලද දෙයින් සතුටු නොවන බව සෑහීමට පත් නොවන බව **අසන්තුට්ඨිතාවය** යි.

25. **මහිච්ඡතා** = කොපමණ දේ ලැබුනත්, කොතෙක් දේ තිබුණත් සෑහීමකට පත් නොවී තව තවත් රැස් කරන සොයන ස්වභාවය **මහිච්ඡතාවය** නම් වේ.

26. **සංසග්ගාරාමතා** = සංසග්ගය යනු **ඇලීම** යි. එසේ ඇලීමේ කැමැත්ත **සංසග්ගකාමතාවය** යි. මෙය "**දර්ශන සංසග්ගය, ශ්‍රවණ සංසග්ගය, කාය සංසග්ගය, සමුල්ලපන සංසග්ගය, සම්භොග සංසග්ගය**" යනුවෙන් පස් වැදෑරුම් වේ. ප්‍රිය කරන ස්ත්‍රී පුරුෂ රූප භාණ්ඩ උපකරණ දැකීමේ කැමැත්ත "**දර්ශන සංසග්ගය**" නම් වේ. අන්‍යයන් විසින් කරන ලද හෝ තමා විසින් ම කියන ලද පවසන ලද සිනාසෙන හඬ ඇසීමේ කැමැත්ත "**ශ්‍රවණ සංසග්ගය**" නම් වේ. ඔවුනොවුන් ගේ ශරීර ස්පර්ශ කිරීමෙහි කැමැත්ත "**කාය සංසග්ගය**" නම් වේ. ඔවුනොවුන් හා කථා කිරීමේ කැමැත්ත "**සමුල්ලපන සංසග්ගය**" නම් වේ. ඔවුනොවුන් ගේ වස්තු උපකරණ පරිභෝග කිරීමේ කැමැත්ත "**සම්භොග සංසග්ගය**" නම් වේ. මෙලෙස මේ පස් වැදෑරුම් සංසග්ගයන්ට කැමති බව එහි යෙදෙන බව **සංසග්ගකාමතාව** නම් වේ.

27. **අගරු** = **ගරු නොකිරීම** යි. අගෞරව සයකි. ඒවා මෙසේ ය.

i. **සත්ථරි අගාරවො** = ශාස්තෲන් වහන්සේ ජීවමාන කල්හි දවසට තෙවරක් උපස්ථානයට නො යාම, ශාස්තෲන් වහන්සේ පාවහන් නැතිව සක්මන් කරන විට පාවහන් සහිතව සක්මන් කිරීම, ශාස්තෲන් වහන්සේ පහත් තැනක සක්මන් කරන විට උස් තැනක සක්මන් කිරීම, ශාස්තෲන් වහන්සේ පහත් තැනක වැඩ හිඳින විට උස් තැනක විසීම, ශාස්තෲන් වහන්සේ පෙනෙන තැන දෙවුර වසා පොරවා සිටීම, කුඩ ඉසිලීම, වහන් පයලා සිටීම, නෑම, මල මූත්‍ර පහ කිරීම ශාස්තෲන් වහන්සේට කරන අගෞරවයෝ ය. ශාස්තෲන් වහන්සේ පිරිනිවීමෙන් පසුව ද දවසට තුන් වරක් විහාරයට නො යාම, චෛත්‍ය -බෝධිය පෙනෙන තැන්හි කුඩ ඉහලා වහන් පයලා යාම, දෙවුර වසා පොරවා හැසිරීම, මල මූත්‍ර කිරීම, සෑ මලු, බෝ මලුවල කෙළ ගැසීම යන මේවා ශාස්තෲන් වහන්සේට කරන අගෞරවයන්ම ය.

ii. **ධම්මෙ අගාරවො** = ධර්ම ශ්‍රවණයට ආරාධනා කළ කල්හි යා හැකි ව තිබිය දී නො යාම, ගිය ද ගෞරවයෙන් ධර්මය නො ඇසීම, ධර්ම දේශනය කරන විට සිහි මුලාව සිටීම, කථා කරමින් සිටීම, ධර්මයට කරන අගෞරවයෝ ය.

iii. **සඞ්ඝෙ අගාරවො** = සංඝ ස්ථවිරයන් වහන්සේ ගේ ආරාධනාවක් අවසරයක් නැතිව සඟ මැද දහම් දෙසීම, එසේම ප්‍රශ්න විසඳීම, වැඩිහිටි භික්ෂූන් ගේ කයෙහි ගැටෙමින් යාම, සිටීම, හිඳීම, සඟ මැද දෙවුර වසා පොරවා සිටීම, කුඩ පාවහන් දරා සිටීම, සංඝයාට කරන අගෞරවයෝ ය. සංඝයාට අයත් එක් භික්ෂුවකට වුව ද අගෞරව කරන්නේ ද එය සංඝයාට කරන අගෞරවයක් ම වේ.

iv. **සික්ඛාය අගාරවො** = සීල සමාධි ප්‍රඥ යන ත්‍රී ශික්ෂාවන් නො පිරීම **ශික්ෂා අගෞරවය** නම් වේ.

v. **අප්පමාදෙ අගාරවො** = අප්‍රමාදය ගැන නො සිතීම කුසල ධර්මයන්හි නො යෙදීම **අප්‍රමාදයෙහි අගෞරවය** යි.

vi. **පටිසන්ථාරෙ අගාරවො** = මෙහි පටිසන්ථාර යනු **පිළිසඳර** හෙවත් **සංග්‍රහය** යි. එය "**ආමිස පිළිසඳර, ධර්ම පිළිසඳර**" යැයි දෙ වැදැරුම් වේ. එහි තමා වෙත පැමිණෙන දුගී මගී යාචකාදීන්ට ද, සිල්වත් ගුණවත් උතුමන්ට ද ආහාර පාන වස්ත්‍රාදියෙන් ද, සතුටු සාමීචි ව කථා කිරීමෙන් ද කරන සංග්‍රහය "**ආමිස පිළිසඳර**" නම් වේ. තමන් දන උගත් ධර්මය, ශාස්ත්‍රය මනාකොට අන්‍යයන්ට ලබා දීම ඉගැන්වීම අවවාද අනුශාසනා කිරීම "**ධර්ම පිළිසඳර**" නම් වේ. මෙසේ නොකිරීම **පිළිසඳරෙහි අගෞරවය** යි.

28. **ඉත්ථි දස්සනකාමතා** = ස්ත්‍රීන්ගේ ගමන් බිමන් ශරීරාලංකාරය ශරීරාවයව නිතර දකිනු බලනු කැමැත්ත යි.

29. **ඉස්සා** = අන්‍යයන්ගේ රූප සම්පත්, ධනය, සැපය, කීර්තිය, ලාභ සත්කාරාදී සම්පත් නො ඉවසන ඒවාට විරුද්ධ බව වූ **ඊර්ෂ්‍යාව** යි.

30. **උපනාහ** = බද්ධ වෛරය **උපනාහය** නම් වේ. මෙයින් අප්‍රියයන්ට සතුරුකම් හිරිහැර කිරීමාදියෙන් සීලයට හානි වේ.

31. **මක්ඛ** = ගුණමකු බව **මක්ඛ** නම් වේ. මෙයින් සිල්වතුන්ගේ ගුණවතුන්ගේ සීල ගුණ ද, උපකාර කළවුන්ගේ කළ ගුණ අමතක කිරීම අවලංගු කිරීම මකා දැමීම ද සිදු වේ.

32. **අජාගරතා** = **නිදි තොර නොකිරීම** යි. මෙයින් නිද නො ගත යුතු

කාලය වූ දහවල ද, රාත්‍රියෙහි ප්‍රථම යාමය වූ ප.ව. 6.00 සිට රාත්‍රී 10.00 දක්වා ද, පශ්චිම යාමය වූ රාත්‍රී 2.00 සිට අලුයම දක්වා ද වූ කාලයන්හි නිදා ගැනීම කියවේ. නිදා ගත යුතු කාලය රාත්‍රියෙහි මධ්‍යම යාමය වූ රාත්‍රී 10.00 සිට රාත්‍රී 2.00 දක්වා කාලයයි. මේ කාලය හැර අන් කාලයන්හි නිදා ගැනීම පරිහානි කර ධර්මයක් වේ. මෙය උත්කෘෂ්ට පරිච්ඡේදයෙනි.

33. **භොජනෙ අමත්තඤ්ඤුතා** = **පමණ නො දැන ආහාර ගැනීම** යි. ආසාවන් බහුල නොකොට යැපිය හැකි පමණ සළකා ආහාර ගත යුතු ය.

34. **අභාවනච්ඡන්දතා** = සමථ විදර්ශනා භාවනා කිරීමට ඇති අකමැති බව හා එය නොකිරීම යි.